# ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක හතරක් තුළ අන්තර් ආගමික ගැටුම්



# ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක හතරක් තුළ අන්තර් ආගමික ගැටුම්

ජනවාර්ගික අධ්‍යයනය සඳහා වූ ජාත්‍යන්තර කේන්ද්‍රය
(International Centre for Ethnic Studies)
සහ
මානව හිමිකම් අධ්‍යාපනය සඳහා වූ ජාත්‍යන්තර කේන්ද්‍රය (Equitas)

ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක හතරක් තුළ අන්තර් ආගමික ගැටුම් කොළඹ 2018

© 2018 International Centre for Ethnic Studies and Equitas –
International Centre for Human Rights Education

2, කිංසි ටෙරස්, කොළඹ 8, ශ්‍රී ලංකාව.
විද්‍යුත් තැපෑල: admin@ices.lk
URL: www.ices.lk, www.equitas.org

ISBN 978-955-580-232-1

මෙම ප්‍රකාශනයේ ප්‍රකාශන හිමිකම ජනවාර්ගික අධ්‍යයනය සඳහා වූ ජාත්‍යන්තර කේන්ද්‍රය (ICES) සහ ඉක්විටාස් - මානව හිමිකම් අධ්‍යාපනය සඳහා වූ අන්තර්ජාතික කේන්ද්‍රය (Equitas) සතු වේ. කතුවරුන් සහ ප්‍රකාශකයන්ගේ නිසි අවසරය මත මෙම පොතෙහි ඕනෑම කොටසක් ප්‍රතිනිෂ්පාදනය කළ හැකිය. අධ්‍යයනයේදී පළ කර ඇති අර්ථ දැක්වීම් සහ නිගමන කතුවරුන්ගේ වන අතර, එමගින් ICES, Equitas හෝ අරමුදල් සම්පාදකගේ දැක්ම සහ ප්‍රතිපත්තීන් අවශ්‍යයෙන් පිළිබිඹු නොවේ. මෙම ප්‍රකාශනය පළ කෙරෙනුයේ Global Affairs Canada හරහා කැනඩා රජය මගින් සපයනු ලබන මූල්‍ය සහයෝගය සමග ය.

මුද්‍රණය
හොරයිසන් ප්‍රින්ටින් (පෞද්.) සමාගම
1616/6, හතරමං හන්දිය,
මාලඹේ පාර, කොට්ටාව,
පන්නිපිටිය.

කවර නිර්මාණය : නතාෂා කරුණාරත්න

# ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක හතරක් තුළ අන්තර් ආගමික ගැටුම්

නදීන් වන්නියසිංහම්

කසුන් පතිරාජ

මොහොමඩ් ෆස්ලාන්

සහ

දිනුෂ්කා ජයවික්‍රම[1]

ජනවාර්ගික අධ්‍යයනය සඳහා වූ ජාත්‍යන්තර කේන්ද්‍රය

(International Centre for Ethnic Studies)

සහ

මානව හිමිකම් අධ්‍යාපනය සඳහා වූ ජාත්‍යන්තර කේන්ද්‍රය (Equitas)

2018

1 නදීන් වන්නියසිංහම් ජනවාර්ගික අධ්‍යයනයන් සඳහා වූ ජාත්‍යන්තර කේන්ද්‍රයේ (ICES) පර්යේෂිකාවකි. කසුන් පතිරාජ ICESහි ජ්‍යෙෂ්ඨ වැඩසටහන් සම්බන්ධීකාරක වේ. මොහොමඩ් ෆස්ලාන් කොළඹ සරසවියේ දේශපාලන විද්‍යාව පිළිබඳ කථිකාචාර්යවරයෙකි. දිනුෂ්කා ජයවික්‍රම ICES හි පර්යේෂිකාවක් ලෙස කටයුතු කළ අතර, මේ වන විට නිදහස් පදනම මත කටයුතු කරයි.

# පටුන


හැඳින්වීම

1. 'ස්ථානය' - දිස්ත්‍රික්ක හතර පිළිබඳ දළ විශ්ලේෂණයක් 7
2. විවාදගත කරන ස්වාමිත්වයන්, කාරක සහ අන්තර් ආගමික ගැටුම් ඇති කරන තත්ත්වයන් 14
   2.1 ආගමික අවකාශයන් හි විසංවාද තත්වයන් සහ සංකේත 15
   2.1.1 දමිළ/හින්දු අවකාශයන් බෞද්ධාගමිකරණය: පශ්චාත් යුධමය නව හැඟවුම්කාරක 15
   2.1.2 අනන්‍යතාවය සහ දෘෂ්‍යතාවය ඉහළදැමීම හරහා ආධිපත්‍යය: ආගමික පිළිම තරඟකාරී ලෙස ස්ථාපනය කිරීම 18
   2.2. අන්තවාදයේ වර්ධනය, වෛරී කථනය, අවිශ්වසනය සහ සමාජ මාධ්‍ය භූමිකාව 20
   2.3. ධර්ම ප්‍රචාරය, අන්තර් විවාහ සහ ආචාර සම්පන්න නොවන සංවාද 23
   2.4. කුල භේදය මත වෙනස්කොට සැලකීම් සහ අසමානතාවය 27
   2.5. භෞමික විස්තාරණය: ඉඩම ජනවාර්ගික-ආගමික ආධිපත්‍යයේ සංකේතයක් ලෙස 28
   2.6. ඉඩම සහ හිමිකම: පශ්චාත් යුධමය සලකාබැලීම් 31
   2.7. රැකියා නියුක්තිය සඳහා ප්‍රවේශය සහ රාජ්‍ය ප්‍රතිලාභ : සමානාත්මතාවය ඉල්ලා සිටීම් 35
   2.8. ආයතනගත වර්ගවාදය සහ සුළුතර ප්‍රජාවන්ට අයත් ආයතන ග්‍රහණය කර ගැනීම 37
   2.9. ආර්ථික සහ ව්‍යාපාරික පසමිතුරුකම 38

3. අන්තර් ආගමික ගැටුම: දිස්ත්‍රික්ක පදනම් කරගත් විශ්ලේෂණයක් 40
   3.1. මන්නාරම 40
   3.2. යාපනය 41
   3.3 අම්පාර 41
   3.4. මාතර 42

4. අන්තර් ආගමික ගැටුම් ආමන්ත්‍රණය කිරීමේදී ගැටුම් ලිහිල්කරණ
ක්‍රමෝපායන් සහ අන්තර් ආගමික කමිටුවල භූමිකාව 45
4.1. මන්නාරම 45
4.2. යාපනය 47
4.3 අම්පාර 47
4.4. මාතර 48

5. කාන්තාව සහ අන්තර් ආගමික ගැටුම: සහභාගීත්වය සහ භූමිකාවන් 49
5.1. මන්නාරම 49
5.2. යාපනය 50
5.3 අම්පාර 51
5.4. මාතර 52

6. නිගමනය 54
උපග්‍රන්ථය - පර්යේෂණ නියැදිය 62

# ස්තූතිය

මෙම වාර්තාව ජනවාර්ගික අධ්‍යයනය සඳහා වූ ජාත්‍යන්තර කේන්ද්‍රය සහ ඉක්විටාස්-මානව හිමිකම් අධ්‍යාපනය සඳහා වූ අන්තර්ජාතික මධ්‍යස්ථානය විසින්, මානව හිමිකම් ප්‍රවේශයක් හරහා ගැටුම් ලිහිල්කරණය පිළිබඳ පුහුණු මොඩියුලයක් සකස් කිරීම සඳහා ගනු ලැබූ ගැටුම් අනුරූපණ (conflict mapping) පරිශ්‍රමයකි. මෙම වාර්තාව නදීන් වන්නියසිංහම් විසින් රචනා කරන ලද අතර, අධ්‍යයනය සඳහා වූ ගුණාත්මක දත්ත එක්රැස් කිරීම නදීන් වන්නියසිංහම්, මොහොමඩ් ෆස්ලාන්, කසුන් පතිරාජ සහ දිනුෂ්කා ජයවික්‍රම යන අයගෙන් සමන්විත පර්යේෂණ කණ්ඩායමක් විසින් සිදු කරන ලදී. සිය මතයන් සහ අත්දැකීම් බෙදාහදා ගැනීම සඳහා සිය කැමැත්ත පළකළ සියලු ප්‍රතිචාරකරුවන්, දිස්ත්‍රික්ක හතර තුළ රැස්වීම් සංවිධානය කිරීමට සහාය වූ සගයන්, කවර නිර්මාණය කළ නතාෂා කරුණාරත්න, අධ්‍යයන වාර්තාවේ සංස්කරණය සහ සෝදුපත් බැලීම සිදුකළ ශානි ජයවර්ධන, කෙටුම්පත් සමාලෝචනය කිරීමට හා සංස්ලේෂණාත්මක ප්‍රතිපෝෂණයන් ලබාදීම සඳහා නොමසුරුව කාලය වැය කළ ආචාර්ය මරියෝ ගෝමස්, මිලාග්‍රොස් ආගුවෙල්ස්, ආචාර්ය නිරේකා වීරතුංග, ආචාර්ය බෙන්ජමින් ෂොන්තාල්, ආචාර්ය නීල් ඩි වොටා, කසුන් පතිරාජ සහ මොහොමඩ් ෆස්ලාන් වෙත කෘතඥතාවය පළ කෙරේ.

# හැඳින්වීම

ආගම සහ වාර්ගිකත්වය, ශ්‍රී ලාංකේය 'ස්වීයත්වය' ('Self') පිළිබඳ ජනප්‍රිය හා දේශපාලනික පරිකල්පනයෙන් වෙන් කළ නොහැකි අතර, ජාතිකත්වය, ස්වයං නිර්ණය, ස්වාධිපත්‍යය සහ බලපුළුවන්කම පිළිබඳ රටෙහි කතිකාවන් තුළ හාත්පස පැතිර පවතියි. ලාංකේය ජාතික රාජ්‍යය, පශ්චාත් නිදහස ගොඩනැංවීම තුළ ආගම සහ වාර්ගිකත්වයේ සංකේන්ද්‍රණය වීම, රටෙහි අනන්‍යතාවය සිංහල බෞද්ධ ලෙස ගොඩනැවීම සහ ඉක්බිති රටෙහි සිංහල බෞද්ධ බහුතරකරණයේ මූලාංග ශක්තිමත් කළ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව යටතේ බුද්ධ ශාසනයේ ආරක්ෂාව සාක්ෂාත් කිරීම හරහා ප්‍රකට වේ. මේ අනුව, දමිළ, මුස්ලිම් මෙන්ම හින්දු, ක්‍රිස්තියානි සහ ඉස්ලාමය අනුගමනය කරන උඩරට දමිළයන් යන සෙසු ජන වාර්ගික-ආගමික සුළුතරයන් තුනකින් සමන්විත රටක් තුළ එම ආගම සහ වාර්ගිකත්වය යනු රට තුළ ආගම්වාදී සචලකරණය සහ ගැටුම සඳහා පදනම බවට පත්වීම පුදුමයක් නොවේ.

ජාතික මට්ටමකදී සිංහල බහුතරය සහ ශ්‍රී ලංකාවේ දමිළ සහ මුස්ලිම් සුළුතර ජනවාර්ගික-ආගමික ප්‍රජාවන් අතර ධ්‍රැවීකරණය වීම, භාෂාමය ජාතිකවාදය සහ සිංහල පමණයි භාෂා ප්‍රතිපත්තිය හේතුවෙන් 1950 දශකය තුළ තවදුරටත් පුළුල් වූ අතර, එය දමිළ ඊලාම් විමුක්ති කොටි සංවිධානය (LTTE) සහ ශ්‍රී ලංකා රජය අතර පැවති, හමුදාමය වශයෙන් 2009 වසරේදී අවසන් වූ ජන වාර්ගික යුද්ධයේ මූලය ලෙස සැලකේ. 2009 වසරෙන් පසු රාජ්‍ය අනුමැතිය මත සිදුවූ ආගමික ජාතිකවාදය සහ අන්තවාදී බෞද්ධ කණ්ඩායම්වල නැගී සිටීම විසින් වෛරී කථනය, මුස්ලිම් සුළුතරයට එරෙහි කෝලාහල සහ ක්‍රිස්තියානි හා හින්දු පූජා ස්ථානවලට එරෙහිව ප්‍රහාර එල්ල කිරීම හේතුවෙන් එකී ජනවාර්ගික-ආගමිකමය දැදුරුවීම් තවදුරටත් ගැඹුරු විය. ආගමික ආතතීන් සහ ප්‍රචණ්ඩත්වයන් ශ්‍රී ලංකාවේ පූර්ව යුධ කාල පරිච්ඡේදයේදී හට නොගත් බව මෙයින් අදහස් නොවේ. රටෙහි යටත් විජිතමය සහ නිදහසින් පසු ඉතිහාසය පුරාම ගැටුම සහ ප්‍රචණ්ඩත්වය සඳහා ආගම මූල බීජස්ථානය බවට පත්ව තිබිණි. 16 වන සියවසේදී මන්නාරමේ දමිළ කතෝලිකයන් සයවන සංගිලි හින්දු රජු විසින් සමූලඝාතනය කිරීම, 1883 කතෝලික විරෝධී කෝලාහල සහ 1915 මුස්ලිම් විරෝධී කෝලාහලවල පටන් නිදහසෙන් පසු යුගය සහ ආගමික සුළුතරයන්ට එරෙහි පශ්චාත් යුධ ප්‍රචණ්ඩත්වයන්, විශේෂයෙන්ම 1983 දමිළ නාශනය සහ මුස්ලිම් ප්‍රජාවට එරෙහිව වඩාත් මෑත කාලීනව ඇතිවූ ප්‍රහාර මාලාව[2] දක්වා, ගැටුම් ඇතිකිරීමට පෙළඹවීම සහ (දේශපාලන) ආධිපත්‍යය පවත්වාගෙන යාම සඳහා ආගම සහ ආගමික අනන්‍යතාව සත්කටුවක් සේ අනවරතව ක්‍රියාවේ යොදවා ඇත.

දේශපාලන විද්‍යාඥයන් සහ ඉතිහාසඥයන් විසින් ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය දක්වනුයේ එකිනෙකා පරයා වැඩි මිලක් නියම කරමින් ජනවාර්ගිකත්වය සහ/හෝ භාෂාව සහ/හෝ ආගම, පුද්ගලික/පක්ෂ දේශපාලන ඉපැයීම් වෙනුවෙන් කූටෝපායන්ගේ යොදවන විශාල දේශපාලන කාරකයන් ලෙස ය (ඩිවෝටා 2004 සහ 2018; දේවසිරි 2017). ශ්‍රී ලංකාවේ ජනවාර්ගිකත්වය, ආගම, අනන්‍යතාවය සහ ආගමික ප්‍රචණ්ඩතාවයට සම්බන්ධිත දේශපාලනය අතර සම්බන්ධය බොහෝ අධ්‍යයනවලින් පිළිගෙන සහ/හෝ විමසා බලා ඇත (තිලකරත්න 2015; ගුණතිලක 2015 සහ 2018; හේරත් සහ රඹුක්වැල්ල 2015; දේවසිරි 2017; ඩිවෝටා

2 බලන්න 'Hate Campaigns and Attacks against the Muslims in Recent Sri Lanka' by Razick et al. (2018).

2018). එපමණක් නොව, මෙම අධ්‍යයන අතරින් වඩාත් මෑත කාලීන අධ්‍යයනයන්ගෙන් වැඩි කොටස[3] විසින් 2009 වසරෙන් පසුව මුස්ලිම් ප්‍රජාවට එරෙහිව ඉහළගිය ප්‍රචාරණ ව්‍යාපාර, වෛරී කථනය, ප්‍රචණ්ඩත්වය විසින් රාජ්‍යයේ නිහඬ අනුමැතිය සමගින් බෞද්ධ-මුස්ලිම් සබඳතාවන්ට බලපුළුවන්කාරකම පිරිනමා ඇති බව (නිවැරදි ලෙස) හඳුනා ගනියි. නියත වශයෙන්ම, වඩාත් මෑත කාලීනව 2018 පෙබරවාරි සහ මාර්තු මාසවල පුද්ගලික ආරාවුල් දේශපාලනික වාසි සඳහා මෙහෙයවූ අම්පාර මෙන්ම මහනුවර ඇති වූ බෞද්ධ-මුස්ලිම් කෝලාහල සම්බන්ධ බෞද්ධ මුස්ලිම් අධ්‍යයනයන් තවදුරටත් මේ සම්බන්ධයෙන් අනුකූල වේ. ශ්‍රී ලංකාව තුළ ප්‍රචණ්ඩත්වය සහ ගැටුම උසිගැන්වීම සඳහා ජනවාර්ගික සහ ආගමික වෙනස්කම දිගින් දිගටම පරමාදර්ශී පදනම බවට පත්වන බව මෙකී සිදුවීම් විසින් හෙළිදරව් කරයි.

කෙසේ වෙතත් ශ්‍රී ලංකාවේ ජනවාර්ගික-ආගමික සබඳතා සහ ගැටුම විශ්ලේෂණය කරන එබඳු සාර්ව සහ ප්‍රකට එළැඹුම්, දේශපාලන ප්‍රභූන්ගේ (සචලකරුවන්ගේ) පර්යාදර්ශයන් සහ පරාවක්‍රයන් නියෝජනය කිරීම වෙතත් ඒවා විමසා බැලීම වෙතත් නැඹුරු වනුයේ, අන්තර් ආගමික සබඳතා හැඩ ගැන්වීමෙහිලා සංහතිකයේ (සචලකරණය වූ) භූමිකාවන් සහ වැදගත්කම දෙවැනිකොට සලකමිනි. එසේම ඔවුහු, සිංහල-දමිළ සහ/හෝ බෞද්ධ-මුස්ලිම් ද්විභේදනය සම්බන්ධ ජනවර්ගික-ආගමික සබඳතා නිරන්තරයෙන් විමසා බලමින්, ශ්‍රී ලංකාවේ සෙසු ජනවාර්ගික-ආගමික කණ්ඩායම් එකිනෙක අතර ඇති සෙසු අනුබද්ධ වින්‍යාසයන් නොතකා හරිමින් ද්විමය උගුලකට වැටීමට ද නැඹුරුතාවක් දක්වති. එපමණක් ආගම සහ ආගමික පරමාදර්ශය මගින් ගොඩනංවා ඇති සහ යොදාගෙන ඇති නොව, ජනවාර්ගික-ආගමික ගැටුමේ පාර්ව ආඛ්‍යානය (මෙටානැරේටිව්) (හෝල්ට් 2015) දේශපාලනික කුළුගැන්වීමකින් යුතු අතර, එය විශාල බහුජන ජාතික විඥානයකට සම්බන්ධ කරති. එමගින් ශ්‍රී ලාංකේය රාජ්‍ය සංස්ථාව වැදගත් සහ අනුකූල ලෙස විශාල දේශපාලන ක්‍රීඩාවක් සේ උකස් කෙරෙන අතරම, ශ්‍රී ලංකාව සමාන සුළුතර-බහුතර දේශපාලනයන් ක්‍රියාවට නැංවෙන සජාතීය භූදර්ශනයක් බවට වන සීමාසහිත අවබෝධය ද ප්‍රවර්ධනය කෙරේ.

ශ්‍රී ලංකාව තුළ ජනවාර්ගික-ආගමික සබඳතා අවකාශමය වශයෙන් නිශ්චය වූ (හස්බුල්ලා සහ කෝර්ෆ් 2012; මේයර් 2013; ෂෙපාර්ඩ්සන් 2014; ස්පෙන්සර් ආදීහු 2015) මෙන්ම ඓතිහාසික වශයෙන්, ජනවිකාශනමය වශයෙන්, දේශපාලනික වශයෙන්, සමාජයීය වශයෙන්, සංස්කෘතික වශයෙන් සහ භූගෝලීය වශයෙන් විචලනය වන විවිධ කලාපයන් වෙන් වෙන්ව විදහා දක්වන බව මිස, හුදු උතුරු-දකුණු බෙදීමක් මත නොව උතුරේ සහ දකුණේ වෙනස් දිස්ත්‍රික්ක තුළ පවා සිදුවන්නනක් බවට වන ස්ථාවරය මෙම ලියවිල්ලෙන් යෝජනා කෙරේ. එකී තර්කයට සහාය දක්වමින් අප්පාදුරෙයි (1998) සඳහන් කරනුයේ, ''ජනවාර්ගික ප්‍රචණ්ඩත්වය පෙන්නුම් කරන සිදුවීම් සාර්ව ක්‍රියාකාරිත්වයේ සිට ක්ෂුද්‍ර ක්‍රියාකාරිත්වය දක්වා සම්බන්ධ කිරීම දුෂ්කර කාර්යයක් ව පවතියි'' (පිටුව 3) යනුවෙනි. මෙම කරුණ ඉස්මතු කරමින්, ජාතික මට්ටමේදී ජනවාර්ගිකත්වය සහ අනන්‍යතාවයේ අභ්‍යන්තර ක්‍රියාකාරිත්වයන් සමග පූර්ව නියුක්තියෙන්

3 ජනවාර්ගික යුද්ධයට මග පෑදූ කාලපරිච්ඡේදය තුළ සහ 1983-2009 අතර යුද්ධය පැවති කාලපරිච්ඡේදය තුළ ගණනාත් ඔබේසේකර, ආර්.ඒ.එල්.එච්. තම්බයියා, ජොනතන් ස්පෙන්සර් සහ පැට්‍රික් පීබ්ල්ස් යනාදීන් විසින් සිදුකළ බොහෝ ජනවාර්ගික -ආගමික අධ්‍යයනයන් සිංහල බෞද්ධ සහ දමිළ හින්දු/ කතෝලික සම්බන්ධතා කේන්ද්‍ර කරගත් ඒවා විය.

ඔබ්බට ගමන් කරන ජනවාර්ගික-ආගමික සබඳතා හැඩගන්වන වඩාත් සියුම් විශ්ලේෂණයක් සහ ක්ෂුද්‍ර 'දේශපාලනික සහ ආර්ථික භූගෝලයන්' (පිටුව 41) විමසා බැලීමක් නගරාජ් සහ හනීෆා (2017) විසින් ගෙන හැර දක්වති. ගුණතිලක (2018) ද මෙකී අන්තර් ආගමික ගැටුම සහ සබඳතා විශ්ලේෂණයේදී ව්‍යංගිත ලෙස මෙකී ස්ථානීය එළැඹුමට සහාය පළ කරනුයේ ''විශේෂිත දේශීය සන්දර්භයන් සහ ගතිකයන් (අන්තර්ආගමික) ප්‍රචණ්ඩත්වය ඇතිවීමට සහ එය උත්සන්න වීමට දැඩි සේ දායක වේ''(පිටුව 39) යනුවෙන් නිරීක්ෂණය කරමිනි. මේ අනුව, ඓතිහාසික, සමාජයීය, සංස්කෘතික, ආර්ථික, ආගමික සහ දේශපාලනික වශයෙන් හැඩගන්වනු ලබන අවකාශය සහ සන්දර්භයේ අතුරු ඡේදනයන්, අන්තර්-ආගමික සබඳතා සහ ගැටුම් වඩාත් සියුම් ලෙස අවබෝධ කර ගැනීමක් සඳහා සංඝටනීය වේ.

මේ වන විටත් ඉහතින් සඳහන් කර ඇති පරිදි වාර්ගිකත්වය, අනන්‍යතාවය සහ දේශපාලන අධිපතිවාදය යන පර්යාලෝකයන්ගෙන් අන්තර්-ආගමික සබඳතා සහ ගැටුම විශ්ලේෂණය කෙරෙහි එළැඹුම් ලබාගෙන තිබේ. ස්ටාක් සහ ෆින්ක් (2000) වැනි සෙසු අය විසින් ඉල්ලුම සහ සැපයුමේ රීතීන් ක්‍රියාවට නැංවෙන, ශුද්ධමය වශයෙන් ආර්ථික කියැවීමක් ඉදිරිපත් කර තිබේ. බයිබල් අධ්‍යයනයන් පිළිබඳ කැනේඩියානු සමාජය විසින් සිදුකරනු ලැබූ ආගමික එදිරිවාදීකම් පිළිබඳ සම්මන්ත්‍රණයේදී විකසනය කර ගත් පරිදි සෙස්සෝ, සමාන පරිසරයක් හෝ වෙළඳපොළක් තුළ ආගම් අතර වන අන්තර් සබඳතා, සහජීවනය, සහයෝගිතාවය, තරඟය සහ ගැටුම අනුව වඩා විවෘත ආකෘතිවලින් (මේයර් 2013) ඉදිරිපත් කරති. කෙසේ වෙතත්, අපැහැදිලි වෙනස්කම් සහ සහයෝගිතාවය හා තරඟය අතරත්, තරඟය සහ ගැටුම අතරත් නිර්වචනයන් අතිච්ඡාදනය වීම හේතුවෙන් ඒවා නොකළවම් සහ සුපැහැදිලි ආකෘති නොවේ (ෆස්ලාන් සහ වන්නසින්කම්, 2015 විසින් ද විදහා දක්වා ඇති පරිදි). මේයර් (2013) විසින් අන්තර් ආගමික ගැටුම විශ්ලේෂණය කිරීම සඳහා සාර්ව අන්තර්ග්‍රහණයක් සහිත විවෘත වැඩරාමුවක් යෝජනා කරන අතර, මේ අධ්‍යයනයේ අරමුණ සඳහා, අන්තර් ආගමික සබඳතා කෙරෙහි බලපානු ලබන අන්තර් ඡේදීය සාධක විධිමත් ලෙස විමසා බැලීම පිණිස එය ප්‍රයෝජනවත් වේ. ඇය සඳහන් කරනුයේ, ''ආගමික ගැටුම් පහත සඳහන් තත්වයන් තෘප්ත වූ විට හටගත හැකිය යන්නයි: (1) සාමූහික කාරකයන් දෙකක් හෝ කිහිපයක් සම්බන්ධ වූ විට සහ එකී කාරකයන් නිරුක්තිය ලබන විට, උදාහරණ වශයෙන්, වෙන් වූ ආගම්, එකම ආගමක වෙන් වූ පිල්, එකම ආගමක් තුළ වන එකම පිලක් සහ/හෝ නිරාගමික අධිකාරියක්; (2) ස්වාමිත්වයක් - උදා., පරමාදර්ශය/සදාචාරය, බලය, පෞරුෂය, අවකාශය/ස්ථානය, කණ්ඩායම් අනන්‍යතාවය තනි තනි වශයෙන් හෝ සංකලනයක් වශයෙන් විසංවාදයට ලක් වූ විට (3) හැකිකරවන තත්වයන් - උදා.., දේශපාලනික, සමාජයීය, ආර්ථික, සංස්කෘතිකමය සහ මනෝවිද්‍යාත්මක; සහ (4) ආගම සම්බන්ධ වේ (එය සම්බන්ධ වන්නේ කොතරම් ප්‍රබල ලෙස ද යන්න අනනුකූල බව පෙනේ)'' (පිටුව 5)

අන්තර්-ආගමික සම්බන්ධතා, සාර්ව ආඛ්‍යානයන්ගේ විකල්ප සහ අද්‍යතනභාවයේ දේශීය අවබෝධයක් අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකාව තුළ සහ ශ්‍රී ලංකාවේ වෙනස් ස්ථානවල පවතින දිස්ත්‍රික්ක හතරක හැඟවුම්කාරක, අධිපතිත්වය සහ හැකිකරවන තත්වයන් විමසා බැලීම සහ සසඳා බැලීම මෙකී අධ්‍යයනය විසින් සිදුකරයි. එම දිස්ත්‍රික්ක හතර වන්නේ උතුරු පළාතේ මන්නාරම සහ යාපනය, නැගෙනහිර පළාතේ අම්පාර සහ දකුණු පළාතේ

මාතර වේ. වෙනස් ආගමික බහුතරයන්ගෙන් සමන්විත මෙකී දිස්ත්‍රික්ක ඒවායේ සන්දර්භයන් තුළ සුවිශේෂී වේ (මන්නාරමේ ක්‍රිස්තියානීන්, යාපනයේ හින්දු භක්තිකයන්, අම්පාර මුස්ලිම් භක්තියන් සහ මාතර බෞද්ධ බැතිමතුන්). එසේ හෙයින්, බෞද්ධ-මුස්ලිම් සබඳතා පිළිබඳ එකලාම කේන්ද්‍රගත වීමේ මෑත කාලීන ද්විභින්නතාවයෙන් ඔබ්බට මෙම අධ්‍යයනය ගමන් කරන අතර, ඒ වෙනුවට, සියුම්, ස්ත්‍රීපුරුෂ සමාජභාවී සහ, ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආගමික ප්‍රජාවන් හතර වන බෞද්ධයන්, හින්දූන්, ක්‍රිස්තියානීන් සහ මුසල්මානුවන් අතර පවතින අන්තර්-ආගමික සබඳතාවල ස්වභාවයන්ගේ අවකාශමය වටහාගැනීමක් සඳහා එය විසින් වෑයම් කරනුයේ, ජනවාර්ගික-ආගමික සබඳතා සහ ගැටුම් ප්‍රකට වන ආකාරයන් සහ ශ්‍රී ලංකාවේ වෙනස් සමාජ-දේශපාලනික, ආර්ථික හා සංස්කෘතික වටාපිටාවන් තුළ ගැටුම් ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ ගැඹුරු වටහාගැනීමක් වෙත ළඟාවනු පිණිස ය.

අන්තර්-ආගමික අධ්‍යයනයන්ගෙන් මෙම අධ්‍යයනය අපගමනය වන තවත් එක් කරුණක් වන්නේ පර්යේෂණ නියැදිය සඳහා හිතාමතාම සහ විධිමත් ලෙස ස්ත්‍රීත්ව අන්තර්ග්‍රහණය කර ගැනීමයි. යුද්ධය සහ අරගලයේ කතිකාව තුළ ස්ත්‍රීන් අක්‍රිය වින්දිතයන් හෝ පුරුෂරූපී කර්තෘත්වයේ සක්‍රිය වස්තූන් වශයෙන් අති ප්‍රබල ලෙස නියෝජනය වේ. එසේ හෙයින්, ගැටුම, ආගමික ප්‍රචණ්ඩත්වය, ගැටුම් ලිහිල්කරණය සහ ගැටුම් පරිවර්තනය සම්බන්ධ පර්යේෂණයන් තුළ ඔවුන් ප්‍රකටව පෙනෙන පරිදි නියෝජනය වී නොමැත.

මෙම අධ්‍යයනයේදී ස්ත්‍රීන් සහජීවනය ප්‍රවර්ධනය සහ ගැටුම කෙරෙහි ප්‍රත්‍යක්ෂ ලෙස සහ පරමාදර්ශී ලෙස දායක වන කාරකයන් වශයෙන් සැලකේ. එසේ හෙයින්, මෙම පර්යේෂණ නියැදියේ ප්‍රතිචාර දක්වන්නන්ගෙන් හරි අඩකට වඩා ස්ත්‍රීහු වෙත්.

පහත දැක්වෙන අංගසම්පූර්ණ ප්‍රශ්නාවලිය මගින් මෙම අධ්‍යයනය මෙහෙයවනු ලැබීය.

1. එක් එක් දිස්ත්‍රික්කවල හටගත් අන්තර්-ආගමික ගැටළු මොනවාද සහ එකී ගැටළු සමාජය තුළ හටගත්තේ කුමන ආකාරයෙන්ද? (හැකිකරවන තත්වයන් සහ ස්වාමිත්වයන්)

2. ප්‍රත්‍යක්ෂ ලෙසම මෙකී ගැටළු ඇති කළේ කුමක්/කවුරුන් විසින්ද? (කාරක, ස්වාමිත්වයන්, හැකිකරවන තත්වයන්)

3. යොදාගත් ගැටුම් නිරාකරණ යාන්ත්‍රණයන් මොනවාද, ඒවා යොදාගත්තේ කවුරුන් විසින්ද, සහ, එම යාන්ත්‍රණයන් ගැටුම් ආමන්ත්‍රණය කිරීමේදී කොතරම් ඵලදායී වීද? (කාරක සහ ස්වාමිත්වය)

4. අන්තර්-ආගමික සබඳතා සම්බන්ධයෙන් ස්ත්‍රීන්ගේ සැලකිල්ල කුමක්ද? ඔවුන්ගේ සැලකිලිමත්භාවය පුරුෂයන්ට වඩා වෙනස් ද සහ, අන්තර්-ආගමික ගැටුම් ව්‍යාප්ත කිරීමට සහ/හෝ ලිහිල් කිරීමට ස්ත්‍රීන් දායක වූයේ කොතරම් දුරකටද? (කාරක සහ ස්වාමිත්වය)

ප්‍රධාන තනි පුද්ගල සම්මුඛ සාකච්ඡාවන් ස්ත්‍රී සහ පුරුෂ ආගමික, ප්‍රජා නායක නායිකාවන්, රජයේ නිලධාරීන්, ආගමික සංවිධානවල නියෝජිතයන් සහ සිවිල් සමාජ නියෝජිතයන් සමග පවත්වනු ලැබීය.

කේන්ද්‍රීය කණ්ඩායම් සාකච්ඡා, කාන්තාවන්ගේ ග්‍රාමීය සංවර්ධන සමාජ[4], මුස්ලිම් කාන්තා සමාජ, ග්‍රාමීය සංවර්ධන සමාජ, දිස්ත්‍රික් අන්තර්-ආගමික කමිටු[5], අන්තර්-ආගමික සංසදයන්, දේවස්ථාන සමාජ, හින්දු සමාජ සහ මහජනතාව සමග පවත්වනු ලැබීය. මෙහි තාර්කිකය (මූලකාරණය) වූයේ මෙකී දිස්ත්‍රික්ක හතර තුළ සිවිල් සමාජයේ සක්‍රිය සාමාජිකයන් විසින් මෙන්ම සාමාන්‍ය මහජනතාවගේ සාමාජිකයන් විසින් ද අන්තර් -ආගමික සබඳතා ප්‍රත්‍යක්ෂ කර ගන්නේ කෙසේද යන්න පිළිබඳ සියුම් අවබෝධයක් ලබාගැනීමයි. මේ අනුව නියැදිකරණය, ප්‍රතිචාර දක්වන්නන්ගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ අත්දැකීම් වශයෙන් පමණක් නොව ඔවුන්ගේ භූගෝලීමය ස්ථානගත වීම සම්බන්ධයෙන් ද අරමුණු සහගත විය. එනම්, ප්‍රතිචාර දැක්වූවෝ බහු ආගමික ප්‍රදේශයන් හි වෙසෙන්නන් හෝ වෙනස් ආගමික ප්‍රජාවන් දෙකක් එකිනෙකා සමග මායිම් ප්‍රදේශවල ජීවත්වන්නන් හෝ අන්තර්-ආගමික ගැටුම්වල සිදුවීම් හටගත් ප්‍රදේශවල ජීවත් වන්නෝ වූහ. ප්‍රධාන දැනුම් දෙන්නන් (ආවේදකයන්) සහ ප්‍රතිචාර දක්වන්නන් සම්බන්ධ කරගනු ලැබුවේ දිස්ත්‍රික්ක හතර තුළ ප්‍රාදේශීය අන්තර්-ආගමික කණ්ඩායම්, තනි පුද්ගල ක්‍රියාකාරිකයන් සහ ප්‍රාදේශීය සිවිල් සමාජ සංවිධාන සමග ගොඩනගා ගත් සබඳතා ජාලය හරහා ය. එකී ප්‍රධාන ආවේදකයන් විසින් පර්යේෂණ කණ්ඩායම වෙත නව ප්‍රතිචාර දක්වන්නන් සහ කේන්ද්‍රීය කණ්ඩායම් සාකච්ඡා සඳහා නව සහභාගිවන්නන් හඳුන්වා දුන් බැවින් හිමබෝල නියැදි ක්‍රමවේදය ද යොදාගනු ලැබිණි.

දිස්ත්‍රික්ක හතර තුළ තනි පුද්ගල/ප්‍රධාන ආවේදක සාකච්ඡා 22 ක් සහ කේන්ද්‍රීය කණ්ඩායම් සාකච්ඡා 17 ක් 2017 මාර්තු සිට 2017 ජූනි දක්වා කාලයේත්, 2018 අප්‍රේල් සිට 2018 මැයි අතර කාලයේදීත් මෙහෙයවනු ලැබිණි. ස්ත්‍රීන් හා පුරුෂයන් අතර අන්තර්-ආගම් සම්බන්ධතා සහ ගැටුම් ලිහිල්කරණ ක්‍රමෝපායන් සම්බන්ධයෙන් පවතින අවබෝධයේ වෙනස්කම් තිබේදැයි වටහා ගැනීම සඳහා ස්ත්‍රීන් හා පුරුෂයන් වෙන් කරමින් කේන්ද්‍රීය කණ්ඩායම් සාකච්ඡා ද පැවැත්විණි (පර්යේෂණ නියැදිය විදහා දක්වන A උපලේඛනය බලන්න).

---

4 ස්ත්‍රීන්ගේ ග්‍රාමීය සංවර්ධන සමාජ (WRDSs) යනු රජය විසින් නායකත්වය ලබාදෙන, ස්ත්‍රීන් සඳහා වූ ප්‍රජා මූල සංවිධානයන් ය. මෙම සමාජයන් එක් එක් දිස්ත්‍රික්කයක ග්‍රාම නිලධාරී කොට්ඨාසයක් තුළ පිහිටුවා ඇත. සංවර්ධන නිලධාරියාගේ අධීක්ෂණය යටතේ මේවායේ මාසික ඉතුරුම් ක්‍රම ක්‍රියාත්මක වන අතර, ජීවිකාව සඳහා ආධාර කිරීම සඳහා වටමාරු ක්‍රමයට ක්‍රියාත්මක වන ණය වැඩසටහන් ද ඒවායේ ක්‍රියාත්මක වේ. මෙම කාන්තා සමාජයන් විසින් සමාජ වැඩ සමග සම්බන්ධ වීමේ සහ ආදායම් උත්පාදනය කර ගැනීමේ පුහුණු වැඩසටහන් ද සපයනු ලබයි. මේවාට ස්වකීය ව්‍යවස්ථා සහ සංවිධාන ව්‍යුහයන් පවතියි. රජයේ මෙන්ම රාජ්‍ය නොවන සංවිධානවලද පුහුණු වැඩසටහන්වල ඔවුන් නිරන්තර ප්‍රදානලාභීන් ය.

5 දිස්ත්‍රික් අන්තර්-ආගමික කමිටු (DIRCs) 2013 වසරේ ජාතික සාම කවුන්සිලය (NPC) මගින් සංස්ථාපනය කරනු ලැබුවේ ශ්‍රී ලංකාවේ මුස්ලිම් විරෝධීභාවයන් සහ ප්‍රචණ්ඩත්වයන් උත්සන්න වීමට ප්‍රතිචාර දක්වන ව්‍යාපෘතියක් ලෙස ය. ජාතික සාම කවුන්සිලය විසින් යාපනය, මන්නාරම, පුත්තලම, ගාල්ල, මඩකලපුව, අම්පාර, මහනුවර සහ නුවරඑළිය යන දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් අන්තර්-ආගමික කමිටු ඇති කර තිබේ. ඒවායේ සාමාජිකයන් හට ගැටුම් නිරාකරණය, ගැටුම් සංවේදීකරණය සහ මානුෂීය අවශ්‍යතා ධ්‍රැවීකරණය පිළිබඳ පුහුණුවක් ලබාදෙනු ලැබිණි. මෙම කමිටුවල තවත් කාර්යයක් වන්නේ බහුත්වවාදය, සුහද අවබෝධය හා සහජීවනය පෝෂණය කිරීමයි. වැඩිදුර විස්තර සඳහා http://www.peace-srilanka.org/projects බලන්න.

## අධ්‍යයනයේ සීමා

මෙම අධ්‍යයනයේ දත්ත එක්රැස් කිරීම සිදුවූයේ 2017 මැයි මාසයේ මැද භාගයේ ය. දත්ත එක්රැස් කිරීම සඳහා ප්‍රතිචාර සපයන්නන්ගේ කාලය හා ඔවුන්ගේ උපයෝජ්‍යතාවය පිළිබඳ සීමාවන් හේතුවෙන් මාතර දිස්ත්‍රිකක්යේ ක්‍රිස්තියානි සහ හින්දු ආගමික ප්‍රතිචාර සපයන්නන්ගේ මතයන් ද ඇතුළත්ව, මන්නාරම කතෝලික පියතුමන්ගේ අදහස් ලබාගැනීමට නොහැකි විය. එසේ හෙයින් මාතර සහ මන්නාරම වෙත 2018 මුල භාගයේ නැවත යාමට සිදුවිය. මේ අනුව, මාතර දිස්ත්‍රික්කය තුළ සිදුකළ සොයාගැනීම්, කාල සීමාව අනුව සෙසු දිස්ත්‍රික්කවල දත්තවලින් යම් විශේෂිත ආකාරයකට (සුවිශේෂී අන්දමින් නොව) විචලනය වේ. මෙම අධ්‍යයනය මගින් එක් එක් දිස්ත්‍රික්කයක සෑම කොට්ඨාසයක්ම ආවරණය නොකළ අතර, ඒ වෙනුවට, කේන්ද්‍රීය කණ්ඩායම් සාකච්ඡා සිදුකිරීම සඳහා තෝරාගත් ස්ථානවල ප්‍රධාන තොරතුරු දැනුම් දෙන්නන් සමඟ පැවති සම්මුඛ සාකච්ඡා එක් එක් දිස්ත්‍රික්කය තුළ බහුල ලෙස පවත්නා ගැටළු හඳුනා ගැනීම පිණිස යොදා ගැනුණි. යාපනය දිස්ත්‍රික්කය තුළ සිදුකෙරුණු සම්මුඛ සාකච්ඡා විශාල වශයෙන් යාපනය නගරය කේන්ද්‍රීය ව සිදුකෙරිණි. එසේ හෙයින්, එක් එක් දිස්ත්‍රික්කයක් මුහුණ දුන් ගැටළු සමස්තයක් ලෙස මෙන්ම, ඉහතින් සඳහන් කළ පරිදි කොට්ඨාස/ගම්මානවලට අනන්‍ය ලෙස ද මෙම අධ්‍යයනයේ සොයාගැනීම් විසින් ග්‍රහණය කර ගනියි.

පර්යේෂණයේ එළැඹුම සම්බන්ධයෙන්, දත්ත එක්රැස් කිරීම සිදුකරනු ලැබුවේ තෝරාගත් දිස්ත්‍රික්ක හතර ඒ වන විටත් අන්තර්-ආගමික ආතතීන් හෝ ගැටුම්වල ක්ෂේත්‍ර බවට පත්ව තිබේ ය යන අවබෝධය සමඟ බව ඒත්තු ගැන්වේ. එසේ හෙයින්, අධ්‍යයනයේ එක් ලුහුඬුතාවක් වන්නේ එමගින් අන්තර්-ආගමික සහජීවනයේ අංගයන් ප්‍රවර්ධනය නොකිරීමයි. අන්තර්-ආගමික ආතතීන් සහ ගැටුම් වෙත නාභිගත වීම හේතුවෙන් මෙම අධ්‍යයනය, සහජීවනය අබිබවා ගැටුම විශාලනය කරන්නක් ලෙස පෙනී යා හැකිය. මෙම පර්යේෂණ පත්‍රිකාවේ අරමුණ වන්නේ අන්තර්-ආගමික ආතතීන් හා ගැටුම්වල ස්වභාවය සහ, ඒවා ප්‍රාදේශීය මට්ටමේදී ආමන්ත්‍රණය කරනු ලබන්නේ කෙසේද යන්න වටහා ගැනීමයි. කෙසේ වෙතත්, සහජීවනය අති ප්‍රමුඛ ප්‍රතිමානය වන අතර, දිස්ත්‍රික්ක හතරෙහිම ක්ෂුද්‍ර ගම් මට්ටමේදී එය ව්‍යාතිරේඛී නොවේ.

## අවකාශය සහ ස්ථානය පිළිබඳ සුවිශේෂීත්වය

මෙම පර්යේෂණ පත්‍රිකාවේ කේන්ද්‍රීය මූලධර්මය වන්නේ 'පිහිටීම' (සාර්ව අර්ථයෙන් අවකාශය, එනම්, භූගෝලීය පිහිටීම මගින් නිර්වචනය වන දිස්ත්‍රික්කය, ජනවාර්ගික-ආගමික සංයුතිය, භූ ලක්ෂණ, ඉතිහාසය සහ සංස්කෘතිය) සහ 'ස්ථානය', එනම්, ක්ෂුද්‍ර අර්ථයෙන් අවකාශය, (''අවකාශයේ සුවිශේෂී ස්වභාවයක්.. නාමකරණ ක්‍රියාවන් මගින් මෙන්ම ක්‍රියාකාරකම් සහ පරිකල්පනයන් හරහා නිර්මාණය වූ'' (ෂෞර්ඩ්සන් 2014, පිටුව 9) යන සාධක දිස්ත්‍රික්ක හතර තුළ අනන්‍ය සම්බන්ධන වින්‍යාසයන් ප්‍රතිඵල කරන අන්තර්-ආගමික සම්බන්ධතා හැඩගස්වනු ලබන සුවිශේෂී විචල්‍යයන් වන බව ය. මේ අනුව අවකාශය නිෂ්ක්‍රිය නොවන අතර ඒ වෙනුවට එය අවකාශයේ සුවිශේෂී නියෝජනයන්ගෙන් ප්‍රතිලාභ

ලැබීමට නිරන්තරයෙන් මං සොයන කාරකයන් විසින් කාලයත් සමග හැඩගස්වන හා නැවත හැඩගන්වනු ලැබූ ගොඩනැංවීමක් සේ අදහස් කෙරේ (ෂෙපාඩ්සන් 2014). මේ අනුව එසැණින් දේශපාලනීකරණය වන සහ ප්‍රත්‍යක්ෂ කළ, පිළිසිඳින ලද සහ ජීවත් වූ අවකාශය නිෂ්පාදනය කිරීමෙහිලා, බලය වැදගත් වේ (නොට් 2010). විෂමජාතීය ප්‍රජාවන් තුළ අවකාශයන් මේ අනුව ස්ථරීකරණයව පැවතිය හැකි අතර බහුවිධ මුහුණුවරින් යුතුව සහ සැලකිය යුතු පරිදි වෙනස් කාරකවලින් වෙනස් විය හැකිය. ස්ථරීකරණය වූ අර්ථයන්ගේ මෙකී අංගය තවදුරටත් දේශපාලනීකරණය වන්නේ ස්ථානයේ හිමිකාරිත්වය/හිමිකම ප්‍රශ්නගත කෙරෙන විට ය. ජොන්සන් (2012) සඳහන් කරනුයේ, ''විසංවාදකරණය/ප්‍රශ්නගතකරණය වූ අවකාශය මූලික වශයෙන් ප්‍රචණ්ඩකාරී ගැටුමේ මාර්ගයන් වෙත යොමු වන අතර, එය විසින් පොළඹවන අනියතභාවය භූගෝලීය සහ සමාජයීය වශයෙන් ප්‍රගාමක වේ'' (පිටුව 8) යනුවෙනි. පශ්චාත් යුධ ශ්‍රී ලංකාවේ අන්තර්-ආගමික සබඳතාවල මෙකී සුවිශේෂී විශේෂත්වය දිස්ත්‍රික්ක හතර සසඳමින් මෙම පර්යේෂණ පත්‍රිකාවේ නිගමනය කොටසේදී සාකච්ඡා කෙරේ.

මෙම පත්‍රිකාවේ ප්‍රධාන ප්‍රචාලන ගාමක බලය, එනම්, අන්තර්-ආගමික සම්බන්ධතා අවකාශමය වශයෙන්, කාරකයන් විසින් රැගෙන යමින්, ප්‍රශ්නගත වූ ස්වාමිත්වය සහ හැකි කරවන තත්වයන් නිශ්චය කරන බව වන අතර, පර්යේෂණ පත්‍රිකාව මගින් දිස්ත්‍රික්ක හතරෙහි අන්තර්-ආගමික සම්බන්ධතාවලට බලපානු ලබන කාරක, ස්වාමිත්වයන් සහ හැකිකරවන තත්වයන් විමසනුයේ, උචිත හා සන්දර්භයට අනුකූල විසඳුම් යෝජනා කිරීම සඳහා වැදගත් අනන්‍ය සහ සන්දර්භ-සුවිශේෂී අන්තර් සබඳතා පිළිබඳ අවධාරණයක් ද සමගිනි. අන්තර්-ආගමික සබඳතා හැඩගැන්වීමෙහිලා ස්ත්‍රියගේ භූමිකාව සාකච්ඡා කිරීම කෙරෙහි පර්යේෂණ පත්‍රිකාව එතැනින් යොමු වන අතර, යෝජනා කළ වැඩරාමුව හරහා දිස්ත්‍රික්ක හතරම තුළ පවතින ගතිකයන් පිළිබඳ විශ්ලේෂණයකින් පර්යේෂණය පත්‍රිකාව අවසන් කෙරේ.

# 1. 'ස්ථානය' - දිස්ත්‍රික්ක හතර පිළිබඳ දළ විශ්ලේෂණයක්

ජන සංගණන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2012 වසරේදී සිදුකරන ලද ජාතික ජන සංගනනයට අනුව මන්නාරම[6] යනු, මුස්ලිම් සහ හින්දු යන සුළු ජන ප්‍රජාවන් දෙකකින් සමන්විත, ප්‍රධාන වශයෙන් කතෝලික දිස්ත්‍රික්කයක් වේ. සමස්ත ජනගහනය වන 99570 න් 52415 ක් (52.6%) ක් කතෝලික වන අතර, 24027 ක් (24.1%) ක් මුස්ලිම් ආගමිකයන් ද, 4790 ක් (4.8%) ක්‍රිස්තියානි ද, 1809 ක් (1.8%) බෞද්ධ ආගමිකයන් වන අතර, සෙසු ආගම්වලට අයත් අය සේ 17 දෙනෙක් හඳුනා ගැනේ. ග්‍රාම නිලධාරී පරිපාලන සංඛ්‍යා ලේඛනවලට අනුව මන්නාරම නගරයේ කතෝලික පවුල් 8063 ක්ද, මුස්ලිම් පවුල් 7306 ක්ද, හින්දු පවුල් 3178 ක්ද, රෝමානු කතෝලික නොවන (ක්‍රිස්තියානි) පවුල් 494 ක්ද, සංක්‍රමණික ධීවර සිංහල පවුල් 4 ක් ද සිටිති (රජයේ නිලධාරී, කතෝලික පුරුෂ, පුද්ගලික සන්නිවේදනය, 2017 මාර්තු 8)

6 ආගමික නායකයන්, රජයේ නිලධාරීන් සහ ප්‍රධාන දැනුම් දෙන්නන් සමග පුද්ගලික සම්මුඛ සාකච්ඡා 9 ක් ද, කාන්තාවන්ගේ ග්‍රාමීය සංවර්ධන සමාජ සමග කේන්ද්‍රීය සාකච්ඡා 3 ක්ද, මුස්ලිම් ප්‍රජාවේ ප්‍රධාන පුද්ගලයන් සමග එක් කේන්ද්‍රීය සාකච්ඡාවක් ද 2017 මාර්තු 6 සිට 8 දක්වා ද, එක් සම්මුඛ සාකච්ඡාවක් 2018 අප්‍රේල් මාසයේදී ද මන්නාරමේදී පවත්වන ලදී.

යටත් විජිතකරණයේ පටන් මන්නාරම දිස්ත්‍රික්කයේ කතෝලික අනන්‍යතාවය විදහා දැක්වෙනුයේ, එය මඩු පල්ලිය පිහිටා ඇති භූමිය මෙන්ම 16 වන සියවසේ කතෝලිකයන් ප්‍රාණත්‍යාගීත්වය සිදුකළ ස්ථානය ද එය වන බැවිනි[7]. එසේම මන්නාරම සමග බද්ධව ශක්තිමත් හින්දු අනන්‍යතාවයක් ද ඇති අතර, එය ශිව දෙවියන්ට කැප වූ පූජනීය තිරුකේතීස්වරම් හින්දු කෝවිල[8] පිහිටි ස්ථානය ද වේ. එහි ආගමික අනන්‍යතාවයට අමතරව මන්නාරමේ ඉතිහාසය, එවකට මන්නාරම නිල නොවන ආණ්ඩුකාර භූමිකාව දැරූ මන්නාරම අගරදගුරු වූ රායප්පු ජෝසප් පියතම විසින් තිස් අවුරුදු වාර්ගික අරගලය තුළ හැඩගන්වනු ලැබීය. උතුරු පළාතෙන් 1990 වසරේදී එල්ටීටීඊ සංවිධානය මුස්ලිම්වරුන් බලහත්කාරයෙන් නෙරපා දැමූ හෙයින් (හස්බුල්ලා 2001; නේසයියා 2012) මන්නාරමේ මුස්ලිම් හා දමිළ ප්‍රජාවන් අතර සම්බන්ධතාවන්ට වාර්ගික අරගලය ද බලපෑවේය. අරගලයෙන් පසුව මුස්ලිම් පවුල් නැවත මන්නාරම වෙත පැමිණීම සහ සිය දේපළ නැවත ලබාගැනීම හේතුවෙන් මෙන්ම ප්‍රබල දේශපාලඥයෙකු විසින් මුස්ලිම් ප්‍රජාව වෙනුවෙන් පෙනී සිටීම හේතුවෙන් වර්තමානය වන විට මේ තත්වය දමිළ-මුස්ලිම් සබඳතා කෙරෙහි ප්‍රතීයමානයන් ඇති කර තිබේ. තවද මන්නාරම යුද්ධය හේතුවෙන් බරපතළ ලෙස විනාශ වූ දිස්ත්‍රික්කයක් සහ හමුදාව හා එල්ටීටීඊ ය අතර දරුණු සටන් ඇති වූ ක්ෂේත්‍රයක් ද වේ. එහිදී මන්නාරම පදිංචිකරුවන්ගෙන් බහුතරයක් අහිමිවීම්වලට සහ අවතැන් වීම්වලට ලක් වූ අතර, නැවත පදිංචි කිරීම් ද සිදු වී තිබේ.

7 කතෝලික ආගම ශ්‍රී ලංකාව තුළ ආයතනගත කරනු ලැබුවේ 16 වන සියවසේ දී පෘතුගීසීන් විසිනි. එසේ හෙයින්, පෘතුගීසීන් සමග යුධ වැදුණු සිංහල සහ දමිළ රජවරුන්ගෙන් කතෝලිකයන්ට හිංසා සිදුවිය. පින්ටෝ (2015) දී සඳහන් කරනුයේ, ''උතුරේ කතෝලික හිංසනය දකුණේ ප්‍රහාරයට වඩා බෙහෙවින් දරුණු ය. යාපනයේ සංගිලි රජු 1642 සහ 1544 අතර සමයේදී පටිම් ගම්මානය තුළ මන්නාරමේ කතෝලික ආගමට හැරුණු පුද්ගලයන් 600 දෙනෙක් සංහාරයට ලක් කර තිබේ. අද, මන්නාරමේ තලයිමන්නාරම පාරේ කතෝලික පල්ලියක් විසින් එකී ප්‍රාණත්‍යාගීන් මිහිදන් කර ඇති ස්ථානය සලකුණු කරයි.'' යනුවෙනි.

8 ''තිරුකේතීස්වරම් යනු මන්නාරම දිස්ත්‍රික්කයේ මන්නාරම නගරයට සැතපුම් 7 ක් පමණ උතුරු දෙසින් පිහිටා ඇති මාන්තොට්ටමාම් හි පිහිටි ඉපැරණි පූජා භූමියකි. පුරාවෘත්තවලට අනුව, එය කේතු භගවාන් විසින් ඊස්වරම් (ශිව) දෙවියන් නැමදූ කෝවිල වේ. එසේ හෙයින් එම පුදබිමට තිරුකේතීස්වරම් යන නම ලැබී තිබේ... මෙම ශ්‍රේෂ්ඨ පුද බිම 16 වන සියවසේදී පෘතුගීසීන් විසින් සම්පූර්ණයෙන්ම විනාශ කරන ලද අතර, මෙහි සිට ගෙන ගිය පාෂාණ මන්නාරම් කොටුව, පල්ලි සහ කයිට්ස් හි හැමර්ශීල්ඩ් කොටුව ඉදිකිරීම සඳහා ද යොදාගනු ලැබිණි.... 19 වන සියවසේ ශ්‍රී ලංකාවේ ශිවවාදයේ පුනරුදය සඳහා වගකියූ ආරුමුග නවලාර් විසින් මෙම ඓතිහාසික කෝවිල නැවත ඉදිකිරීම සඳහා හින්දු බැතිමතුන් යුතුකමෙන් බැඳී සිටින බව හින්දූන්ට පැහැදිලි කර දුන්නේය. 1872 වසරේ සිදුකළ ඔහුගේ එම ආයාචනයෙන් පසු විනාශ කළ කෝවිල පිහිටා තිබූ නිවැරදි ස්ථානය 1894 වසරේදී නැවත හඳුනා ගැනුණු අතර, 20 වන සියවසේ මුල් භාගයේදී එහි ප්‍රතිසංස්කරණ කටයුතුවලින් සමහරක් සිදු කෙරිණි'' (ද හින්දු, 2002 දෙසැම්බර්, අන්තර්ජාල සංස්කරණය).

## මන්නාරම දිස්ත්‍රික්කය




මන්නාරම දිස්ත්‍රික්කයේ අන්තර්-ආගමික සම්බන්ධතා කාරක, ස්වාමිත්වයන් සහ හැකිකරවන තත්වයන් ගණනාවක් සක්‍රියව පැවතීම හේතුවෙන් සංකීර්ණ බව හඳුනා ගැනේ. සමස්තයක් වශයෙන් ප්‍රජාවන් සාමකාමීව ජීවත් වන බව සටහන් කළ යුතු අතරම, එහි ආගමික විවිධත්වය සහ සුළුතර ආගමික කණ්ඩායම් සහමුලින්ම පාහේ සමානුපාතිකව පවතින හෙයින්, දත්ත එක්රැස් කරන සමයේදී එය කතෝලික සහ හින්දු ගැටුම්වල, කතෝලික හා මුස්ලිම් ගැටුම්වල, අන්තර් කතෝලික ගැටුම්වල (කතෝලික සහ රෝමානු කතෝලික නොවන ක්‍රිස්තියානින් අතර), කතෝලික/හින්දු දමිළ හා සිංහල බෞද්ධ ගැටුම්වල (තීව්‍රතාවය අනුව) ක්ෂේත්‍ර භූමියක් විය. මෙකී ගැටුම් මනස්මය වශයෙන් බලපා තිබූ අතර, ඇතැම්විට වගකිව යුතු ආගමික ප්‍රජාවන්ගේ ක්‍රියාවන් ද මෙයට බලපා තිබිණි. ආගමික නායකයන්, දේශපාලනඥයන්, ශ්‍රී ලංකා හමුදාව, අන්තර්ජාතික ක්‍රියාකාරීන්, ස්වාධීන කතෝලික පියතුමන්ලා සහ තනි පුද්ගලයන් විසින් මේ තත්වයට ඉන්ධන සැපයුණු අතර, ආර්ථික, දේශපාලනික, අධ්‍යාත්මික සහ සංස්කෘතික කොන්දේසි විසින් හැකිකරවන තත්වයන් ඇතිකර තිබිණි.

**යාපනය දිස්ත්‍රික්කය**[9] (ඓතිහාසිකවද) ශ්‍රී ලංකාවේ දමිළයන්ගේ සංස්කෘතික හා දේශපාලන අගනුවර ලෙස සැලකුණු අතර, උතුරු පළාත් සභාව පිහිටා තිබෙන්නේ එහි ය. 2012 ජන සංගණන වාර්තාවට අනුව 583,882 ක් වන සමස්ත ජනගහනයෙන් 483,255 ක් හින්දු බැතිමතුන් (82.7%), වන අතර, බෞද්ධයන් 2168 ක් (0.3%), රෝමානු කතෝලිකයන් 75474 ක් (12.9%), මුස්ලිම්වරුන් 2363 (0.4%), ක්‍රිස්තියානීන් 20511 (3.5%) ජීවත් වෙති. තවද 111 දෙනෙක්

9 කාන්තාවන්ගේ ග්‍රාමීය සංවර්ධන සමාජ සමග කේන්ද්‍රීය සාකච්ඡා දෙකක් ද, ආගමික නායකයන්, ආණ්ඩුවේ පරිපාලකයන්, දේශපාලනඥයෙකු, මාධ්‍යවේදියෙකු සහ කාන්තා නායිකාවක සමග ප්‍රධාන දැනුම්දෙන්නන්ගේ සාකච්ඡා 6 ක් යාපනය නගරය මුල් කරගෙන මූලික වශයෙන් සහ, යාබද කයිතඩි, මඩුවිල් සහ අනයිකොඩ්ඩායි යන ප්‍රදේශවල 2017 මාර්තු 8 වැනිදා පටන් 10 වැනිදා දක්වා පවත්වනු ලැබීය.

යාපනය දිස්ත්‍රික්කය තුළ සෙසු ආගම්වලට අයත් අය සේ හඳුනාගෙන තිබේ. යාපනයේ සමාජ, දේශපාලනික වාතාවරණයට සාධක ගණනාවක් දායක වේ. එක් අතකින්, යුද්ධයෙන් පසුව පශ්චාත් යුද යටිතල පහසුකම් සංවර්ධනය ආරම්භ වූයේ හමුදාවේ දැඩි සම්බන්ධයක් සහිතව ය. හමුදාව විසින් යාපනයේ කඩසාප්පු සහ හෝටල් ආරම්භ කර ඇති අතර, ඔවුන්ගේ රූපමය පැවැත්ම විසින් තමන්ව සංවර්ධන ක්‍රියාදාමයෙන් නෙරපා හැරි බවට මතයක් දමිළ ජනයා තුළ නිර්මාණය කර ඇත. අනෙක් අතට, උතුරු පළාත් සභාවට ශ්‍රී ලංකාවේ සෙසු පළාත් සභාවන්ට සාපේක්ෂව සේවා සැපයීම සම්බන්ධයෙන් පවතින්නේ සීමාසහිත හැකියා පරාසයකි. එහිදී සංවර්ධන මුලපිරීම්වලින් බහුතරය උතුරු පළාත් සභාවේ මතය නොවිමසා මධ්‍යම ආණ්ඩුව විසින් සිදුකරනු ලබයි. එපමණක් නොව, අධි ආරක්ෂිත කලාප, අතුරුදන් වූ තැනැත්තන්, නැවත පදිංචි කරවීම සහ ඉඩම් සම්බන්ධ ගැටළුවලට විසඳුම් මධ්‍යම ආණ්ඩුව මත රඳා පවතියි. උතුරුදිග මුස්ලිම්වරුන්ගේ ගැටළු සම්බන්ධයෙන් උතුරු පළාත් සභාවේ ප්‍රවේශයන් වෙනස්කොට සැලකීම් සහිත බවට ද මතයක් වේ. මෙකී සියලු කරුණු විසින්, මෙම වාර්තාවේ පසු කොටස්වලදී විදහා දක්වන පරිදි ජනවාර්ගික-ආගමික සම්බන්ධතාවලට බලපෑම් කර තිබේ.

## යාපනය දිස්ත්‍රික්කය




යාපනය තුළ ආගමට වඩා වාර්ගිකත්වය විසින් පදනම සාදනු ලබන අතර, ඇතැම්විට අන්තර්-ආගමික ආතතීන්/ගැටුම් තුළ ඒ බව ප්‍රත්‍යක්ෂ වේ. 90 දශකයේදී එල්ටීටීඊ සංවිධානය විසින් උතුරුකරයේ මුස්ලිම්වරුන්ව දේශපාලනික වශයෙන් පළවා හැරීම මගින් මුස්ලිම්-දමිළ/හින්දු සබඳතා කැළැල් විය. වාර්ගික යුද්ධය සහ පශ්චාත් යුධ සමයේ හමුදාකරණය මගින් සිංහල බෞද්ධ-දමිළ හින්දු/ ක්‍රිස්තියානි සබඳතාවලට සෘණාත්මක බලපෑමක් සිදුවිය. ශුද්ධ වශයෙන් සංජානනය කර ගත හැකි මට්ටමේ අන්තර්-ආගමික ආතතීන් පැවතියේ සදාචාර සම්පන්න

නොවන[10] පරිදි හින්දූන් ක්‍රිස්තියානි ආගමට හැරවීමේ ගැටළුව හේතුවෙන් දමිළ හින්දූන් සහ දමිළ ක්‍රිස්තියානීන් අතර සහ, කුලය මත පදනම් වූ අන්තර්-හින්දු සබඳතාවලින් පැන නගින අසමානතාවන් සහ ගැටුම් පමණි. මෙකී ගැටුම්වලට (මන්නාරමේ මෙන්ම) ශ්‍රී ලංකා හමුදාව, දේශපාලනඥයන්, ආගමික නායකයන් සහ තනි පුද්ගලයන් විසින් බලපෑම් සිදුකර ඇති අතර, දේශපාලනික, සංස්කෘතික, ආර්ථික සහ අධ්‍යාත්මික සාධක විසින් ඒ තත්වයන් ඇතිකර තිබේ.

**අම්පාර දිස්ත්‍රික්කය**[11] ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළේ පිහිටා තිබෙන අතර, එහි ජනවාර්ගික-ආගමික සංයුතිය හේතුවෙන් සුවිශේෂී වේ. අම්පාර බහුතරය මුස්ලිම් ජනතාව වන අතර, 649402 ක් වන සමස්ත ජනගහනයෙන් (2012 ජන සංගණන වාර්තාවට අනුව) මුස්ලිම්වරු 281987 (43.4%) ක් වෙති. මෙහි බෞද්ධයන් 252427 ක් (38.8%) ක් ජීවත් වන අතර, 102829 ක් (15.8%) හින්දූන් ද, 7588 ක් (1.1%) රෝමානු කතෝලිකයන් ද, 5542 ක් (0.8%) ක්‍රිස්තියානීන් ද වෙති.

## අම්පාර දිස්ත්‍රික්කය




10 මෙම පර්යේෂණ පත්‍රිකාවේ 'සදාචාර සම්පන්න නොවන' යන යෙදුම මගින් කතුවරුන්ගේ මතය නියෝජනය නොවන අතර, එමගින් 'ආචාරධාර්මික නොවන ආගම්වලට හරවා ගැනීම' නමැති, විශේෂයෙන්ම බහුතර ජනවාර්ගික-ආගමික ප්‍රජාවන් අතර පවතින ජනප්‍රිය කතිකාව නියෝජනය කෙරේ.

11 මුස්ලිම්, හින්දු සහ බෞද්ධ පුරුෂයන් සහ ස්ත්‍රීන් සමග කේන්ද්‍රීය කණ්ඩායම් සාකච්ඡා 5 ක්ද, ප්‍රධාන පෙළේ දැනුම් දෙන්නන් සමග පුද්ගලික සාකච්ඡා 4 ක් ද 2017 මැයි 24 සහ 27 අතර කාලයේදී සිදුකරනු ලැබීය.

අම්පාර, දමිළ ජාතිකයන් සමග භූගෝලීය වශයෙන් එක්ව ජීවත් වන, විශාලතම මුස්ලිම් සංකේන්ද්‍රණයක් සහිත ප්‍රදේශයකි. තවද අම්පාර නගරයට කේන්ද්‍රගත වී සිටින සිංහල ප්‍රජාව සමග ඔවුන් පවත්වාගෙන යනු ලබන්නේ කුඩා අන්තර්ක්‍රියාවන් ය. රාජ්‍යය විසින් ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධ ආරාවුල් සඳහා මෙම දිස්ත්‍රික්කය සුවිශේෂී වන අතර, ආගමික ආයතන කියා සිටින්නේ එම ඉඩම් ආගමික/පූජනීය/පුරා විද්‍යාත්මක ක්ෂේත්‍රයන් මෙන්ම ඒවා සංකීර්ණ සහ මානව වංශික වශයෙන් ප්‍රාදේශීය පරිපාලන පද්ධතිවලට අයත් ක්ෂේත්‍රයන් බව ය. අම්පාර දිස්ත්‍රික්කය වාර්ගික ගැටුම්වලින් බලපෑමට පත්වූ අතර, එල්ටීටීඊ ය විසින් උතුරේ මුස්ලිම්වරුන් බලහත්කාරයෙන් නෙරපා හැරීම හේතුවෙන් මෙන්ම 1990[12] කාත්තන්කුඩි පල්ලියේ සිදුවූ සංහාරය ද හේතුවෙන් දමිළයන් සහ මුස්ලිම්වරුන් අතර සබඳතාවලට කැළැල් සිදුවිය.

සිංහල බෞද්ධයන් සහ මුස්ලිම්වරුන් අතර අන්තර්-ආගමික ගැටුම අම්පාර දිස්ත්‍රික්කය තුළ සිදුවූ මූලික ආරවුල වූ අතර, එය දේශපාලඥයන්, රජයේ නිලධාරීන් සහ තනි පුද්ගලයන් වශයෙන් ආගමික පූජකවරුන් විසින් අවුළුවනු ලැබිණි. මෙම ගැටුම මතවාදයන් තුළ මුල්බැසගෙන තිබුණ ද, එය (ආගමික/පුද්ගලික) අවකාශයන්ගේ අනුයෝජනය සහ පූජනීය වස්තු කෙළසීම මගින් ප්‍රත්‍යක්ෂ වෙයි. අම්පාර දිස්ත්‍රික්කය තුළ දමිළ වැසියන් සහ මුස්ලිම් වැසියන් ජීවත් වන්නේ එකිනෙකට මායිම් ව පිහිටන ගම්මානවල ය. මුස්ලිම් ප්‍රජාවේ සම්ප්‍රදායික ගොවිබිම් දමිළ ගම්මාන අසල පිහිටා තිබීම හේතුවෙන් ඔවුන් එකිනෙකා සමග ඓතිහාසික වශයෙන් අන්තර්ක්‍රියා පවත්වමින් සිටි අතර, ප්‍රජාවන් ද්විත්වය අතර කිසිදු ගැටුමක් හටගෙන තිබුණේ නැත. නමුත් මේ වන විට දමිළ, මුස්ලිම් සබඳතා ආර්ථිකය, ඉඩම් හා සංස්කෘතික යන පදනම් මත ක්ෂීණ වෙමින් පවතින අතර, මූලික වශයෙන් එසේ සිදු වී තිබෙන්නේ තනි පුද්ගල ක්‍රියාවන් හේතුකොට ගෙන ය. හින්දූන් සහ ක්‍රිස්තියානින් අතරත්, ක්‍රිස්තියානින් එකිනෙකා අතරත් යම් ආතතිමය තත්වයන් පවැතියද, ඒවා දිස්ත්‍රික්කය තුළ පවතින සෙසු අන්තර්-ආගමික ගැටුම්වලට සාපේක්ෂව ප්‍රතිචාර දක්වන්නන් විසින් සුවිශේෂී අන්දමින් සලකනු නොලැබීය.

12 කාත්තන්කුඩි හි පල්ලි දෙකකට 1990 අගෝස්තු 3 වැනිදා එල්ටීටීඊ සංවිධානය විසින් පහර දුන්නේ, එහි යාඥා කරමින් සිටි 100 දෙනෙකුට වඩා ඝාතනය කරමිනි (හස්බුල්ලා සහ කෝර්ෆ් 2012). මෙම සිදුවීම හටගත්තෙත් උතුරු නැගෙනහිර මුස්ලිම්වරුන් සහ දමිළ වැසියන් අතර ආතතිමය තත්වයන් පැන නගිමින් තිබෙන අතරවාරයේ ය. නැගෙනහිර මුස්ලිම්-දමිළ ගැටුම් හටගැනීම සම්බන්ධයෙන් මැක්ගිල්ව්රේ (2003) නිරීක්ෂණය කරනුයේ, ''එල්ටීටීඊ සංවිධානයේ නැගෙනහිර අණ දෙන නිලධාරියා ප්‍රාදේශීය එදිරිවාදිරිකම් සහ පළිගැනීම් සිදුකරමින්, විශාල ප්‍රසිද්ධියක් ලබාගත් කාත්තන්කුඩි පල්ලියේ සංහාරය ද ඇතුළුව මුස්ලිම්වරුන්ට එරෙහිව විවිධ වධ බන්ධන සිදුකිරීමත් සමග මඩකලපුවේ පැවති ඓතිහාසික මරක්කල-මුක්කුවාර් සන්ධානය 1990 වසරේදී සිඳී බිඳී ගිය බව'' (101) ය. මැක්ගිල්ව්රේ තවදුරටත් නිරීක්ෂණය කරනුයේ එයට ප්‍රතිචාර වශයෙන් ආණ්ඩුව විසින් මුස්ලිම්වරුන් සන්නද්ධ කර, ප්‍රාදේශීය දමිළයන්ට එරෙහිව 'බද්ධ වෛරයෙන් යුතු ප්‍රහාර එල්ල කළ බවට චෝදනා ලත්' මුස්ලිම් 'ගෘහ හමුදා' සංස්ථාපනය කළ බව ය. (101)

මාතර[13] ශ්‍රී ලංකාවේ දකුණුකරයේ පිහිටා තිබෙන, 2012 වසරේදී 814048 ක ජනගහනයක් ජීවත් වූ, ප්‍රධාන වශයෙන් සිංහල බෞද්ධ දිස්ත්‍රික්කයකි. එය 766,323 (94.1%)ක් සිංහල බෞද්ධ බහුතර ප්‍රජාවෙන් සමන්විත වන අතර, මීළඟට මුස්ලිම්වරුන් 25,614 ක් (3.1%), හින්දූන් 16,421ක් (2%), රෝමානු කතෝලිකයන් 2,432 ක් (0.29%) සහ රෝමානු කතෝලික නොවන ක්‍රිස්තියානීන් 3,208 ක් (0.39%) දෙනෙකුගෙන් මාතර දිස්ත්‍රික්කය සමන්විත වේ. සැලකිය යුතු බෞද්ධ බහුතරයක් සහිත දිස්ත්‍රික්කයේ බහු ජනවාර්ගික-ආගමික සංයුතිය බෞද්ධ ජාතිවාදයට සහ අන්තවාදී මතවාදයට නිරාවරණය වීම සහ නැඹුරු වීම සිදු වී තිබෙන්නේ අනාගත ගැටුම් සඳහා විභවය සහිත ක්ෂේත්‍රයක් බවට මෙම දිස්ත්‍රික්කය පත් කරමිනි.

## මාතර දිස්ත්‍රික්කය




මාතර දිස්ත්‍රික්කයේ මූලික ගැටුම සිංහල බෞද්ධයන් සහ මුස්ලිම්වරුන් අතර වන අතර, විවිධාකාරයේ වෙනස්කොට සැලකීම්, ප්‍රචණ්ඩක්‍රියා සහ වෛරී කථනයන් එයින් ප්‍රත්‍යක්ෂ කරයි. ගැටුම ප්‍රධාන වශයෙන් ආර්ථික සහ සංස්කෘතික සාධක හේතුවෙන් ප්‍රගමනය වන

13 2017 ජූනි 17 සහ 18 යන දිනවල මාතර හා වැලිගම නගරවලදී මුස්ලිම්වරුන් සහ බෞද්ධයන් සමග කේන්ද්‍රීය කණ්ඩායම් සාකච්ඡා 4 ක් පවත්වනු ලැබීය. නැවත වරක් 2018 මැයි මස, හින්දු, ක්‍රිස්තියානි, මුස්ලිම් සහ බෞද්ධ වතුකම්කරුවන්ගෙන් සමන්විත මාතර දිස්ත්‍රික්කයේ දෙණියායේදී සාකච්ඡා පවත්වනු ලැබුවේ ආගමික ප්‍රජාවන් හතර අතර පවතින සබඳතා පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබාගැනීම පිණිස ය. ප්‍රධාන දැනුම්දෙන්නන්ගේ සම්මුඛ සාකච්ඡා තුනක් බෞද්ධ හිමිනමක්, මව්ලවිවරයෙක් සහ රෝමානු කතෝලික නොවන පාදිලිවරයෙකු සමග (ඇරයුම් කරනු ලැබුවද හින්දු පූජකවරයෙකු සාකච්ඡාව සඳහා නොපැමිණියේය) පවත්වනු ලැබීය. තවද දෙණියායේ අන්තර්-ආගමික සංසදයේ බෞද්ධ සහ හින්දු/ක්‍රිස්තියානි සාමාජිකයන් සමග කේන්ද්‍රීය කණ්ඩායම් සාකච්ඡා දෙකක් පවත්වනු ලැබීය. ප්‍රතිචාර දක්වනු ලැබුවෝ ගම්මානයේ වෙනත් ප්‍රාදේශීය තරුණ සහ ග්‍රාමීය සංවර්ධන කමිටුවල සාමාජිකයෝ ද වූහ.

අතර, ආගමික ආධිපත්‍යය සහ ජනවාර්ගික-ආගමික අනෙකාට බියවීම/නොතකා හැරීම පිළිබඳ මතවාදීමය සංකල්පනයන් මගින් බිම්ගන්වා තිබේ. දමිළ හින්දු/ක්‍රිස්තියානි සහ සිංහල බෞද්ධ සම්බන්ධතා ද කැළැල් වී තිබෙනුයේ සිංහල ජාතිවාදය, ආයතනගත වූ ජාතිවාදය සහ අතීතයේ හටගත් ප්‍රචණ්ඩකාරී වාර්ගික කෝලාහලවල මතකයන් යන පදනම මත ය. මෙකී ගැටුම් හැකිකරවා තිබෙන්නේ ආගමික නායකයන්, රජයේ නිලධාරීන් සහ තනි පුද්ගලයන් විසිනි.

## 2. විවාදගත කරන ස්වාමිත්වයන්, කාරක සහ අන්තර් ආගමික ගැටුම් ඇති කළ තත්ත්වයන්

බලය, මතවාදය/සදාචාරය, පෞරුෂය, අවකාශය/ස්ථානය සහ තනි පුද්ගලයන් ලෙස හෝ කණ්ඩායමක හෝ ප්‍රජාවක කොටසක් ලෙස ක්‍රියාකරන කාරකයන්ගේ කණ්ඩායම් අනන්‍යතාවය වැනි ස්වාමිත්වයන්ට එරෙහිව විවාදගත පැන නැගීමක් ලෙසින් හටගන්නා අන්තර්-ආගමික ගැටුම පිළිබඳ මේයර් (2013) ගේ වටහාගැනීම මෙම කොටස තුළින් අවධානයට ලක් කෙරේ. ගැටුම් පෝෂණය කිරීමට ඉවහල් වන යම් නිශ්චිත ගම්මානයක් හෝ දිස්ත්‍රික්කයක් තුළ විවිධ පුද්ගලයන් සහ නිරන්තරයෙන්ම අන්තර්ඡේද්‍ය කොන්දේසි පවතින විට සන්දර්භමය වශයෙන් ද ගැටුම් හටගැනේ. ස්ථානයට සුවිශේෂී වූ ආර්ථික, දේශපාලනික, සමාජයීය, සංස්කෘතික සහ මනෝවිද්‍යාත්මක තත්වයන්/කොන්දේසි, එකිනෙකට වෙනස් ස්වාමිත්වයන් අරෝවට ලක් කරන හැකිකරවන/පොළඹවන කාරක ලෙස මේයර් (2013) හඳුනා ගනියි. මෙම එළඹුම, ශුද්ධමය වශයෙන් ආගමික සලකාබැලීම්වලින් ගාමක බලය ලබන දේ වශයෙන් ගැටුම් දෙස බැලීමෙන් සීමා කර වඩා පුළුල් නාභිගත වීමක් කෙරෙහි ඉඩ සලසා දෙයි. එනම්, ආගම එකම ගාමක බලය වන විට ස්වාමිත්වයන්ගේ සංකලනයක් තුළ අරෝවන්ගෙන් පැන නගින ගැටුම් වෙත වඩා පුළුල් ප්‍රවේශයක් ලබා දෙයි. එසේ හෙයින් එමගින් අන්තර්-ආගමික ගැටුම්වල නිරන්තර යටිබිම් රේඛාව වශයෙන් පවතින දේශපාලනික, ආර්ථික, සංස්කෘතික සහ වාර්ගික සලකාබැලීම් අන්තර්ග්‍රහණය කිරීමට එමගින් ඉඩ සලසා දෙයි.

දිස්ත්‍රික්ක හතර තුළම, අන්තර් සහ අභ්‍යන්තර ආගමික ගැටුම් හැකිකරවන විස්තීරණ හා අංගසම්පූර්ණ කොන්දේසිය/තත්වය වන්නේ ජනවාර්ගික-ආගමික ජාතිවාදය සහ සකල ස්ථරීය සමාජයීය, දේශපාලනික හා ආර්ථික ආයතන හා අන්තර්ක්‍රියාවන් තුළට ආබද්ධ වී ඇති බහුතරවාදයයි. මන්නාරම, යාපනය සහ අම්පාර යන දිස්ත්‍රික්කවල පැවති අතිරේක සහ අන්තර්ඡේද්‍ය හැකිකරවන කොන්දේසියක් වන්නේ එදිරිවාදිරිකම්, භීතිය සහ ඉඩම් ආරාවුල් ප්‍රතිඵල කරමින් එල්ටීටීඊ ය විසින් උතුරෙන් මුස්ලිම් ජනතාව පළවා හැරීම හේතුවෙන් අන්තර්-ජනවාර්ගික සබඳතා ඉරිතළායාමයි. දත්ත මගින් ගැටුම්වල මූලික ස්වාමිත්වයන් හතරක් ඉදිරිපත් කරයි. ඒ අතරින් දෙකක් ස්ථානය සහ අවකාශය - එක් ආගමික ප්‍රජාවක් විසින් අනෙකාට අයත් පූජනීය ස්ථාන අත්පත් කර ගැනීම සහ ආගමික සංකේත පැනවීම නිසා ඇතිවූ ගැටුම් සහ, ආගම විසින් උත්තේජනය නොකළ එනමුත් ආගමික ගැටුමක් ලෙස විද්‍යමාන වූ, භූමිය ප්‍රසාරණය කරගැනීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීමයි. තෙවැනි ස්වාමිත්වය බලය සඳහා පොර බැදීම සහ ආර්ථික ආධිපත්‍යය සඳහා පොරබැදීමයි. සිව්වැනි ස්වාමිත්වය වනුයේ මතවාදය සහ අන්තවාදයයි.

දිස්ත්‍රික්ක හතර තුළ ගතිකයන් හේතුවෙන් දත්තවල පැවති සංකීර්ණතාවය සහ ප්‍රසාරිතභාවය අනුව, ප්‍රතිචාර දක්වන්නන් විසින් සඳහන් කෙරුණු වැදගත්කමේ අනුපිළිවෙළ සහ වාර ගණන අනුව තේමාව හා සබැඳි ගැටළු අනුපිළිවෙළට සකසා ඇත. ආගමික වශයෙන් වඩාත් උත්තේජිත ගැටුම්වලින් මෙම විශ්ලේෂණය ආරම්භ වන අතර, පසුව එය, ආගම සිද්ධිමය හෝ අතිරේක සන්කටුවක් සේ යෙදවීම මගින් ගැටුම් හටගත් අවස්ථා වෙත යොමුවනු ඇත.

## 2.1 පූජනීය අවකාශයන් හි විසංවාද තත්වයන් සහ සංකේත

### 2.1.1 දමිළ/හින්දු අවකාශයන් බෞද්ධාගම්කරණය: පශ්චාත් යුධමය නව හැඟවුම්කාරක

ශ්‍රී ලංකාවේ ආගමික අනන්‍යතාවය ගෘහ නිර්මාණ ශිල්පය, වර්ණය, ඇඳුම්, මෝස්තර සහ ශබ්දය වශයෙන් පවා සංකේතීය ලෙස විවිධ ආකාරවලින් නිරූපණය වේ. මෙකී සංකේතයන් ශ්‍රී ලංකාවේ යටත් විජිත සහ පශ්චාත් යටත් විජිත දේශපාලන ඉතිහාසය මුළුල්ලෙහිම ප්‍රත්‍යක්ෂ වී තිබෙනුයේ ජනවර්ගික-ජාතිවාදී මූලයන් තවදුරටත් විදහා දක්වමින් සහ, ඒ අනුව අර්ථයේ සමුච්චිත ස්ථරයක් එක් කරමිනි. තවද ඒවා නව හැඟවුම්කාරක වෙත ආරෝපණය වී තිබේ. පශ්චාත් යුධ සන්දර්භය තුළ බෞද්ධ කොඩිය සහ බුද්ධ ප්‍රතිමාව හැරුණු විට, විශේෂයෙන්ම බෞද්ධයන් සහ හින්දු බැතිමතුන් යන දෙපිරිසම විසින් ගරු කරනු ලබන, එසේ වුවත් වඩාත් ජනප්‍රියවාදී ලෙස බෞද්ධත්වය සංකේතවත් කරන බෝ ගස, හමුදාව විසින් නව අර්ථයකට නංවා තිබෙනුයේ උතුරේ සහ උතුරු නැගෙනහිර විජයග්‍රහණය, ආධිපත්‍යය සහ ජයග්‍රහණයේ උත්කර්ෂයක් ලෙස ය.

යාපනය සහ මන්නාරම වෙසෙන ක්‍රිස්තියානි සහ හින්දු බැතිමතුන් යන දෙපිරිසම විසින් මතු කරන ලද එක් මූලික කාරණයක් වූයේ, හමුදාව විසින් අල්ලාගත් ප්‍රදේශවල හෝ බෝ ගස් පවතින ප්‍රදේශවල බෞද්ධ විහාරස්ථාන ඉදිකිරීම සහ බුද්ධ ප්‍රතිමා සවි කිරීමයි. බුද්ධාගම මෙසේ බලයෙන් පැවරීම, උතුරු පළාතේ සෙසු කොටස්වල ද දැකගත හැකි වූයේ ජාතිවාදී විජයග්‍රහණයේ හිතාමතාම සිදුකරන ක්‍රියාවක් ලෙ ය. යාපනයේ හමුදාව විසින් පලාලි සහ කන්කසන්තුරේ හි අධි ආරක්ෂිත කලාප තුළ පිහිටි පල්ලි සහ කෝවිල් විනාශ කළ බවට ද චෝදනා ලද අතර, එය පෙනී ගියේ ඉතිහාසය මකා දැමීමට ගනු ලැබූ උත්සාහයක් ලෙස (කාන්තා සංවර්ධන කමිටු සාමාජිකාවක්, හින්දු ස්ත්‍රී, 2017 මාර්තු 8) ලෙස ය. බෞද්ධයන් ජීවත් නොවන ප්‍රදේශවල බෞද්ධ කොඩිය එසවීම ද ප්‍රදේශවාසීන්ට එදිරිවාදිකම් පෑමට ගනු ලැබූ උත්සාහයක් ලෙස දැක්විණි.

මෙකී සංකේතමය පැනවීම වෙත දායක වූ තවත් වැදගත් කාරකයක් වන්නේ සිය පුද්ගලික ලැබීම් සඳහා හමුදාවේ ද සහාය ඇතිව හමුදාමය බෞද්ධාගම්කරණය වාසියට හරවාගත් භික්ෂූන් විසින් පන්සල් ස්ථාපිත කිරීමයි (දේශපාලනඥයෙක්, හින්දු පුරුෂ, 2017 මාර්තු 9). යාපනය දිස්ත්‍රික්කයෙන් පැමිණ සිටි දේශපාලනඥයෙක් නෙඩුන්තිව් හි උදාහරණයක් ගෙන හැර දැක්වූ අතර, එහිදී භික්ෂුවක විසින් ඉඩමක් අල්ලාගෙන හමුදාවේ ද සහාය ඇතිව පන්සලක් ඉදිකර තිබෙන්නේ එම ප්‍රදේශයේ කිසිවෙකු පදිංචිව නොමැති බව ද නොසලකමිනි. මේ හා සමානව, කිලිනොච්චි කෝවිලක පරිශ්‍රය තුළ ද බෞද්ධ විහාරස්ථානයක් පිහිටුවා

තිබිණි. මන්නාරම දිස්ත්‍රික්කයේ ද මෙවැනිම ගතිකයන් දැකගත හැකි වූ අතර, යම් නිශ්චිත ස්ථානයන්හි, විශේෂයෙන්ම හමුදා කඳවුරක් හෝ පොලිස් ස්ථානයක් ඇති ස්ථානවල බුද්ධ ප්‍රතිමා සවිකිරීම සහ පන්සල් ඉදිකිරීම කෙරෙහි දමිළ ජාතික ප්‍රතිචාර දක්වන්නෝ සිය නොසතුට පළ කළහ. තනි පුද්ගලයන් වශයෙන් ද බෞද්ධ භික්ෂූන්, කැලෑවට වැවුණු බෝ ගස් හෝ කිසිවෙකුගේ අවධානයට නතු නොවී රෝපණය කරන බෝ පැළ රෝපණය යොදාගෙන ඒවා බෞද්ධ ජනාවාස වශයෙන් පැවති බව හෝ අතීතයේ පන්සල් ලෙස පැවති ස්ථාන බව කියාපෑමට සහ, ඒ අනුව නව බෞද්ධ පන්සල් ඉදිකිරීමට සුදුසු බවට සාධාරණීකරණය කරන බවට විශ්වාස කෙරේ. ඒ අනුසාරයෙන් පර්යේෂණ කණ්ඩායම විසින් එක්තරා විශේෂිත පන්සලක ඉතිහාසය පිළිබඳ විමසූ විට එහි නායක තෙරුන් සිය කථාව ආරම්භ කළේ බෝ ගසක් පිළිබඳ සඳහන් කරමිනි. මන්නාරම-මැදවච්චිය පාර දිගට (මෑතකදී රෝපණය කළ) බෝ ගස් සහිත කුඩා පන්සල් ගණනාවක් ද පර්යේෂණ කණ්ඩායම විසින් නිරීක්ෂණය කරන ලදී. මෙම උපාය මගින් බෝ ගස් සඳහා පැවති සුවිශේෂී භාවය ඉවත් වී යාම ප්‍රතිඵල වී තිබෙන බව සඳහන් කරමින් එක් කතෝලික ප්‍රතිචාර දක්වන්නෙකු සඳහන් කළේ අතීතයේදී දමිළයන් බෝ ගස්වලට වන්දනා කළ නමුත් හමුදාව සහ භික්ෂූන් විසින් බෝ ගස්වල සුවිශේෂීභාවය විකෘති කිරීමත් සමඟ බෝ ගසට ගරු කිරීම අඩු වී ඇති බවයි. එහිදී බෞද්ධයන් විසින් භූමියට අයිතිවාසිකම් කීම වළක්වාගැනීම සඳහා කුඩා බෝ පැළ උදුරා ගළවා දැමීමට ඇතැම් පුද්ගලයන් ඇති බව ද සඳහන් විය (CSO නිලධාරිනී, කතෝලික, 2017 මාර්තු 6).

වාර්ගිකත්වයෙන් ඔබ්බට යන බෞද්ධාගම්කරණයේ තවත් තර්කාංගයක් වන්නේ සහ ආගමික ජාතිවාදය මඟින් තවදුරටත් සිදුකරනුයේ බෞද්ධ විහාරස්ථාන හෝ පන්සල් ඉදිකිරීම සම්ප්‍රදායික හින්දු වන්දනා ස්ථානවලට යාබදව සිදුකිරීමයි. පන්සලක් ඉදිකර එසේ බුද්ධ ප්‍රතිමාවක් ස්ථාපිත කළ එක් ස්ථානයක් වන්නේ කලෙක එල්ටීටීඊ මර්මස්ථානයක්ව පැවති සහ පසුව යුද්ධය හේතුවෙන් හින්දු පදිංචිකරුවන් විසින් අත්හැර දැමූ හා හමුදාව විසින් අත්පත් කර ගත් තිරුකේතීස්වරම් ය. 2015 වසරේදී ප්‍රදේශවාසීන් එහි නැවත පදිංචියට ආ විට ඔවුන් දුටුවේ හින්දු භක්තිකයෙකුට අයත් පුද්ගලික ඉඩමක බුද්ධ ප්‍රතිමාවක් ඉදිකර තිබෙන ආකාරයයි. එම ප්‍රදේශයේ භාවනා මධ්‍යස්ථානයක් සහ පන්සලක් ඉදිකර තිබූ අතර භික්ෂුවක් ද විය. පන්සලෙහි 'ඉතිහාසය' (දක්වන සිංහල පුවත්පත් ලිපි මාලාවක්) දැන්වීම් පුවරුවක ප්‍රදර්ශනය කර තිබිණි. එමගින් සාධාරණීකරණය කර තිබුණේ සංඝමිත්තා තෙරණිය[14] තිරුකේතීස්වරම් හරහා ගමන් කළ බවයි.

කේන්ද්‍රීය කණ්ඩායම් සාකච්ඡාවකදී යාපනයෙන් පැමිණි ප්‍රතිචාර දක්වන්නියන් සඳහන් කළේ පූජනීය හින්දු කෝවිලක් සහිත නයිනතිව් ද එසේ අත්පත් කරගෙන බෞද්ධ පන්සලක් ඉදිකර ඇති බවයි. සිංහල වන්දනාකරුවන් හට යාම් ඊම් සඳහා වෙනම බෝට්ටු සේවයක් ද සකස් කර තිබිණි. ඔවුන් සඳහන් කළේ අතීතයේදී සිංහල දෙමළ වන්දනාකරුවන් දෙපිරිසම සඳහා වූයේ තනි බෝට්ටු සේවයක් බවයි. තවද එම ප්‍රජාවන් ද්විත්වයම කෝවිලේ වන්දනාමාන කිරීම සහ එක්ව ආහාර ගැනීම සිදුකර තිබිණි (හින්දු ජාතික කාන්තා සංවර්ධන කමිටු සාමාජිකාවක්, 2017 මාර්තු 9). පූජනීය අවකාශවල සහ පූජාවිධි සම්බන්ධයෙන් දැකගත හැකි වූ මේ විසංග

14 සංඝමිත්තා තෙරණිය අශෝක අධිරාජයාගේ දියණිය වූ අතර, ඉන්දියාවේ සිට ශ්‍රී ලංකාව වෙත බෝධි අංකුරය රැගෙන ආවේ ඇය විසිනි.

මනය, ප්‍රතිචාර දක්වන්නන් විසින් දුටුවේ අතීතයේ ආගමික වත් පිළිවෙත් බෙදා හදාගත් හින්දු සහ බෞද්ධ බැතිමතුන් හිතාමතාම වෙන් කිරීමේ උත්සාහයක් ලෙස ය. එපමණක් නොව, යාපනයට සංඝමිත්තා තෙරණිය ප්‍රවේශ වූ බව සැලකෙන මතාහල් පන්සල මීට පෙර සැමරුම් ස්මාරකයක් සහිත ස්ථානයක් පමණක් වූ අතර, එය ද නැවත වරක් දැක්වුණේ ඓතිහාසික වශයෙන් බෙදාහදාගත් භාවිතාවන් බෞද්ධාගමිකරණයට ලක් කිරීම සහ උතුරේ දමිළ/හින්දු අනන්‍යතාවයට පීඩා කිරීම සඳහා සිතාමතා ගන්නා උත්සාහයක් ලෙස ය. කෙසේ නමුත් ඇතැම් ප්‍රතිචාර දක්වන්නන් සඳහන් කළේ බුද්ධාගම මෙන්ම හින්දු ආගම අතර ද පොදු භාවිතාවන් පැවතෙන හෙයින්, බුද්ධාගම හින්දූන්ට බාධකයක් නොවන බව ය.

මේ අතර මෙබඳු ගැටළු සම්බන්ධයෙන් ආණ්ඩුව විසින් පියවර ගන්නේද යන්න පිළිබඳ ප්‍රාදේශීය දේශපාලකයෙක් සැක පළ කළේ හමුදාවේ ස්වාධීන ක්‍රියාවන් පිළිබඳ ආණ්ඩුවේ සියුම් පිළිවෙත හේතුවෙනි.

මන්නාරම ප්‍රදේශයේ බෞද්ධ පන්සල් සහමුලින්ම හමුදාවේ සහ පොලිස් නිලධාරීන්ගේ අනුග්‍රහය සහිතව පවත්වාගෙන යන බවට පර්යේෂණ කණ්ඩායම නිරීක්ෂණය කළේ මේ කරුණ තවදුරටත් බලගන්වමිනි. මන්නාරමෙහි පර්යේෂණ කණ්ඩායම ගමන් ගත් පන්සල් දෙකෙහිම භික්ෂූහු, අසලක සිංහල ජනපද නොමැති බව පිළිගත් අතර, පන්සල් ඉදිකිරීම, ආගමික උත්සව සහ ප්‍රදේශයේ බෞද්ධ පන්සල් සැරසීම යන කටයුතුවලදී සැලකිය යුතු භූමිකාවක් ඉටු කරන්නේ හමුදාව සහ පොලිසිය බව ද පිළිගත්හ. එපමණක් නොව, පන්සලට සැපයෙන සියලුම ආහාර පාන සඳහා අනුග්‍රහය දක්වන්නේ පොලිසිය, හමුදාව හෝ සිවිල් ආරක්ෂක අංශයේ නිලධාරීන් ය. යාපනය නගරයේ ද හමුදාව සහ පොලිසිය බෞද්ධ පන්සල තුළ වැදගත් කාර්යභාරයක් ඉටුකරමින් සිටින බව නිරීක්ෂණය විය. ඒ අනුව පන්සලේ භික්ෂුවක් පළ කළ මතය වූයේ මේ හේතුව නිසා පන්සලට ප්‍රදේශවාසීන්ගෙන් කිසිදු අභියෝගයක් එල්ල නොවන බව සහ, එය සංස්කෘතික ක්‍රියාකාරකම් හා සහජීවනය පවත්නා ක්ෂේත්‍රයක් බවයි. ''යාපනයේ හින්දු සහ බෞද්ධයන් අතර ගැටුමක් නැහැ. එහෙම සිද්ධ වෙන්නේ ප්‍රධාන වශයෙන්ම ආගම් දෙක අතර පවතින සංස්කෘතික සමානකම් ගණනාවක් නිසයි. සමහරු දෙවිවරුන් ආගම් දෙකේම වන්දනා කෙරෙනවා. පන්සල් භූමිය තුළ දේවාල පිහිටා තිබෙනවා. හින්දු බැතිමතුන් පන්සල තුළට පැමිණ දේවාලවල දෙවියන් වැඳීම සුලබ දෙයක්. හින්දූන් වෙසක් සහ පොසොන් කාලවල බෞද්ධ සංස්කෘතික සහ ආගමික කටයුතුවල යෙදෙනවා. ඔවුන් වෙසක් කාලය තුළ පන්සල අවට සරසන්නට උදව් කරනවා. පන්සලේ ඔවුන්ගේ ප්‍රජා රැස්වීම් පවත්වන්නට ඉඩ ලබාදෙනවා. හින්දු ආගම් නායකයන් සහ ප්‍රජාව සමග සාමාන්‍ය වශයෙන් මිත්‍රශීලී සම්බන්ධතා පවත්වාගෙන යනවා" (බෞද්ධ භික්ෂුවක්, 2017 මාර්තු 8) එහිදී පැවසීය.

මේ අනුව මන්නාරම සහ යාපනයේ දමිළ-බෞද්ධ සම්බන්ධතා, හමුදාව විසින් සහ භික්ෂූන් විසින් ක්‍රමානුකූලව සිදුකරන අනුග්‍රහය හරහා සහ දමිළ හින්දූන් හා ක්‍රිස්තියානීන්ගෙන් එල්ල වන පීඩාවලින් තොරව පවත්වාගෙන යන බව පෙනේ. එක් ප්‍රතිචාර දක්වන්නෙක් සඳහන් කළ පරිදි, ''ආණ්ඩුම මේක කළේ ජනතාවට විරුද්ධ වෙන්න බැරි කාලයකයි" (හින්දු ආගමික කේන්ද්‍රීය කණ්ඩායම් සාකච්ඡා සාමාජිකාවක්, 2017 මාර්තු 9). මේ අනුව ආතතිය ඇතිව තිබුණේ පහළ මට්ටම්වල තැනැත්තන් අතර නොව, පහළ මට්ටම්වල හින්දු/ක්‍රිස්තියානි දමිළයන් සහ බෞද්ධාගමිකරණයේ රාජ්‍ය න්‍යායපත්‍රයද එහි නියෝජිතයන් ද අතර ය.

### 2.1.2 අනන්‍යතාවය සහ දෘෂ්‍යතාවය ඉහළ දැමීම හරහා ආධිපත්‍යය: ආගමික පිළිම තරඟකාරී ලෙස ස්ථාපනය කිරීම

උතුරු පළාත බෞද්ධාගමිකරණය සඳහා හමුදාව විසින් ගනු ලබන උත්සාහය විසින් ජනවාර්ගික -ජාතිවාදය පිළිබඳ විශාල ජාතික කතිකාවක් වෙත අමතන අතර, ජනවාර්ගික-ආගමික සම්බන්ධතාවලට බලපාන පරිදි කලාපීය/ප්‍රාදේශීය ජාතිවාදය විසින් ද විශාල කාර්යභාරයක් සිදුකරනු ලැබේ. හමුදාව විසින් සිදුකරන්නේ පුද්ගලික (දමිළ/හින්දු) අවකාශයන් අයුතු ලෙස ග්‍රහණය කර ගැනීමක් ලෙස ජාතික මට්ටමේදී පෙනී යා හැක. කෙසේ නමුත් චූල - දිස්ත්‍රික් මට්ටමේදී වෙනස් ලෙස තරඟකාරී ආගමික ආයතන විසින් පොදු නිරාගමික ස්ථාන ආගමික අවකාශ බවට පරිණාමය කිරීම හෝ ඒවා අයුතු අන්දමින් අල්ලා ගැනීම සිදුකරයි. මන්නාරම සහ අම්පාර යන දිස්ත්‍රික්කවලදී විශේෂයෙන්ම මෙකී කලාපීය ආගම්-ජාතිවාදය විවිධ ස්වරූපවලින් විද්‍යමාන විය. එයින් එක් අවස්ථාවකදී මන්නාරමේ කතෝලික සහ හින්දු යන දෙපිරිසම විසින් ද, අම්පාරේදී බෞද්ධයන් විසින් ද ආගමික ප්‍රතිමා/පිළිම/පිළිරූ තරඟකාරී ලෙස සවිකිරීමට යාම විසින් ප්‍රසිද්ධ ආරෝවන්, දේපළ කොල්ලකෑම් සහ ඇතැම්විට ප්‍රචණ්ඩ ක්‍රියාවන් ද වාර්තා වීම සිදුවිය.

මන්නාරම දිස්ත්‍රික්කය හඳුනා ගන්නේ සහ හඳුනා ගැනෙන්නේ කතෝලික දිස්ත්‍රික්කයක් ලෙස ය. 16 වන සියවසේදී ක්‍රිස්තියානි ආගම හඳුන්වා දීමෙහි පටන් මන්නාරමේ හින්දූන් සහ ක්‍රිස්තියානින් සහජීවනයෙන් ජීවත් වූ අතර, 1544 වසරේදී උතුරේ හින්දු පාලක සංගිලියන් (පළමු සංගිලි රජු) විසින් මන්නාරමේ කතෝලිකයන් හින්දු ආගමට හැරීම ප්‍රතික්ෂේප කළ විට ඔවුන්ව මරා දැමීමේ සිදුවීම හැර මේ දෙපිරිස අතර වෙනත් ලේ වැකුණු ඉතිහාසයක් නොමැත. එහිදී කතෝලිකයන් 600 දෙනෙක් ඝාතනය කෙරුණු අතර, ඔවුන්ගේ අවශේෂයන්, වත්මනෙහි ප්‍රාණත්‍යාගී පල්ලිය ලෙස හඳුන්වන දේවස්ථානය ඉදිකිරීමේදී හමුවිය. ඇතැම් කතෝලික ප්‍රතිචාර දක්වන්නන් විසින් මෙය, අන්තර්-ආගමික ගැටුම්වල සංකේතයක් පමණක් නොව, දිස්ත්‍රික්කයේ ස්ථිරසාර කතෝලික අනන්‍යතාවයේ සංකේතයක් ලෙස ද සලකනු ලැබීය.

මන්නාරම දිස්ත්‍රික්කයේ තරඟකාරී ලෙස ආගමික ප්‍රතිමා ස්ථාපනය කිරීමේ ප්‍රත්‍යක්ෂ ගැටුම සැලකීමේදී යමෙකුට සාපේක්ෂව මෑතකාලීන (පශ්චාත් යුධ) ලෙස සිදුකෙරුණු, ගනේෂ (ගණ) දෙවියන්ගේ කුඩා ප්‍රමාණයේ රන් ප්‍රතිමා පාර දෙපස පිහිටුවීම හෝ පොදු මාවත්වල කතෝලික ප්‍රතිමා පිහිටුවීම නොසලකා හැරිය නොහැක. කතෝලික ආගම් ප්‍රතිචාර දක්වන්නන් තර්ක කර සිටියේ, එම පිළිම නිතරම පාහේ මාර්ග, මංසන්ධි වැනි ප්‍රකට ස්ථානවල සවි කර ඇති බවත්, හින්දු භක්තිකයන් මේ වන විට ඔවුන්ගේ දේව ප්‍රතිමා ස්ථාපනය කිරීමේ පුරුද්දේ යෙදී සිටින බවත් ය. හින්දු ආගමික ප්‍රතිචාර දක්වන්නන් විසින් කතෝලිකයන්ට චෝදනා කර සිටියේ, ප්‍රජාවන් දෙක අතර මහජන ගැටුම් (ඇතැම්විට ප්‍රචණ්ඩකාරී සිදුවීම් ඇතිකළ) ගණ දෙවි ප්‍රතිමා කඩා බිඳ දැමීම පිළිබඳව ය. පොදු ස්ථානයක හින්දු ප්‍රතිමාවක් සවිකිරීම හරහා එම ස්ථානය ක්‍රමානුකූලව නිරාගමික වන්දනා ස්ථානයක සිට විධිමත් කෝවිලක් බවට පත්කරනු ඇතැයි යන බිය විසින් කතෝලිකයන් ඒවා විනාශ කර දැමීමට පෙළඹෙන බව (කතෝලික පියනමක්, 2018 අප්‍රේල් 14) කියා සිටියේය. හින්දු භක්තිකයන් ද කතෝලික ප්‍රතිමා කඩා බිඳ දැමීම සම්බන්ධයෙන් චෝදනාවට ලක්වූ අතර, ඒ සම්බන්ධයෙන් ඔවුන් දැක්වූ සාධාරණීකරණය කිරීම වූයේ කතෝලිකයන් විසින් කිසිවෙකුගේ අවධානයට ලක් නොවන

ආකාරයෙන් පුද්ගලික අයිතියක් සහිත, හින්දු ප්‍රදේශවල පිහිටා ඇති ඉඩම්වල එක් රැයෙන් ප්‍රතිමා ස්ථාපනය කරන බව ය. එසේ ප්‍රතිමාවක් ස්ථාපිත කිරීම සඳහා රජයේ අනුමැතිය ලබාගැනීම අවශ්‍ය හෙයින් එය මගහරවා ගැනීමට එසේ කරන බවට ඔවුහු කියා සිටියහ. මෙමගින් රජයේ නිලධාරීන්ට සහ පොදු ජනතාවට ඔවුන්ගේ ආගමික සුවිශේෂීභාවය නොසලකා හරිමින් එකී ප්‍රතිමා ඉවත් කිරීම හෝ ඒවා ප්‍රශ්න කිරීම අසීරු කර තිබේ. එක් හින්දු ප්‍රතිචාර දක්වන්නෙක් සඳහන් කළ අන්දමට හින්දූන් සියලුම දෙවිවරුන්ට ගරු කරන අතර, ඒ අනුව ප්‍රතිමා විනාශ කරන්නේ නැත (හින්දු වෛද්‍ය නිලධාරියෙක්, 2017 මාර්තු 6). ප්‍රතිමා තරගකාරී ලෙස ස්ථාපනය කිරීම නිසා ප්‍රශ්නකාරී තත්වයන් හටගත් ප්‍රදේශවලට උදාහරණ වනුයේ අදම්බාන් හන්දිය, මන්තායි බටහිර, මුසලි, නානත්තන් සහ නායට්රු පාරේ මුරපොළ වේ. ආගමික අනෙකුන් වෙත 'අයත්'ව පවතින අවකාශයන් හි ආගමික ප්‍රතිමා ස්ථානගත කිරීම හෝ නිරාගමික අවකාශ ආගමික කිරීම යනු, උදාහරණයක් වශයෙන් සම්ප්‍රදායික හින්දු අවකාශ කතෝලික ඒවා වශයෙන් සලකුණු කිරීම හෝ කතෝලික අවකාශ හින්දූන් විසින් ප්‍රශ්නගත කිරීමක් ලෙස තර්ක කළ හැකිය. බහුතර-සුළුතර සබඳතා ද අනාරක්ෂිත හැඟීම්වලින් යුත් සුළුතරය මෙම පැහැදිලිකිරීම වෙත යොමු කරවන අතර, බහුතරය සිය තත්වය නැවත වරක් සනාථ කර ගැනීම මෙමගින් සිදු වේ.

කතෝලික සහ හින්දු ප්‍රතිචාර දක්වන්නන් යන දෙපිරිසම අතර පැවති අවබෝධය වූයේ ආගමික පිළිම මේ අන්දමින් තරගකාරී ලෙස ස්ථාපිත කිරීම සාමාන්‍ය තනි පුද්ගලයන්ගේ ක්‍රියාවන් නොව, සිය වාසිය සඳහා දේශපාලකයන් විසින් සිදුකරනු ලබන සහ අනුග්‍රහය දක්වනු ලබන ක්‍රියාවන් බව ය. තවත් මතයක් වූයේ ෂිව සේනා සහ ආර් එස් එස් වැනි ඉන්දියාව මුල්කරගෙන ක්‍රියාත්මක වන හින්දු අන්තවාදී කණ්ඩායම්වල උතුරේ සිටින දේශීය කල්ලි විසින් මෙම ගැටුම් සඳහා උල්පන්දම් ලබාදීම සිදුකරන බව ය. එසේ වුවත්, එමගින් සාමාන්‍ය කතෝලික සහ හින්දු බැතිමතුන්ගේ අවබෝධයේ මට්ටම වෙත බලපෑම් සිදුකරන අතර, එම ප්‍රජාවන් දෙක අතර ආතතිය නිර්මාණය කරයි.

ප්‍රධාන නගරය තුළ මුස්ලිම් ප්‍රජාව බහුතර තත්වය භුක්ති විඳින සහ සිංහල ප්‍රජාව (කැපී නොපෙනෙ පරිදි) සුළුතර තත්වය භුක්ති විඳින අම්පාර දිස්ත්‍රික්කයේ ගතිකයන් ද මන්නාරමෙහි ගතිකයන් හා සමාන වේ. සිංහල බෞද්ධ ප්‍රජාවගේ ප්‍රතිචාරාත්මක භාවිතාව වන්නේ ප්‍රමුඛ මුස්ලිම් ප්‍රදේශවල බුද්ධ ප්‍රතිමා ස්ථාපනය කිරීමයි. මෙමගින් ප්‍රජාවන් දෙක අතර එදිරිවාදී කම් ඇතිවන අතර ඒවා නිතරම ප්‍රචණ්ඩකාරී සිදුවීම් බවට ද පත් වේ. මුස්ලිම් බහුතරයක් වෙසෙන පොතුවිල් ඒ සඳහා එක් උදාහරණයකි. ප්‍රතිචාර දක්වන්නන් සඳහන් කළේ ඇතැම් බෞද්ධයන් විසින් ප්‍රධාන පාරේ ද බුද්ධ ප්‍රතිමා ස්ථාපනය කර ඇති බව ය. එයට ප්‍රතිචාර ලෙස මුස්ලිම් ජාතිකයන් වර්ජනයක නිරත වූ අතර, එය අවසන් වූයේ වෙඩි තැබීමකිනි. තවත් උදාහරණයක් වන්නේ අෂ්රෆ් නගර් ය. එහිදී බුද්ධ ප්‍රතිමාවක් ඉදිකිරීම සඳහා මුල්ගලක් තබා තිබූ අතර, බෞද්ධ විහාරස්ථානය ඉදිකිරීම පිණිස සීමාව පුළුල් කිරීම සඳහා ඉඩමේ මායිම් සලකුණු කර තිබිණි. මෙහිදී ද මෙකී ක්‍රියාවන් දේශපාලනික වශයෙන් උත්තේජිත ඒවා වූ නමුත්, ඒවා පොදු මහජනයාගේ මතය ද විදහා දැක්වීය.

## 2.2. අන්තවාදයේ වර්ධනය, වෛරී කථනය, අවිශ්වසනය සහ සමාජ මාධ්‍ය භූමිකාව

උතුරු පළාතේ සහ නැගෙනහිර පළාතේ දිස්ත්‍රික්ක තුන මේ අන්දමින් ආගමික අවකාශ සහ සංකේත ස්පර්ශනීය ආකාරයකින් අනුයෝජනය වීම තුළ සිංහල බෞද්ධ ජාතිවාදයේ සහ ප්‍රාදේශීය කතෝලික හා හින්දු ජාතිවාදයන්ගේ භෞතික විදහාපෑම අත්දකින අතරවාරයේ දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ ආගමික සුළුතර ප්‍රජාව ගැටුම් අත්දකින්නේ යටිබිම්ගත මට්ටමේ අධිපතිමය මතවාදයට ආගමික අන්තවාදය ප්‍රවේශවීමේ ප්‍රතිඵලයක් ලෙස ය. මාතර අන්තර්-ආගමික ගැටුම පදනම් වූයේ මූලික වශයෙන් ආර්ථික එදිරිවාදීකම් සහ ව්‍යාපාරික ගැටළු (පසුව සාකච්ඡා කරන පරිදි) සමාජ මාධ්‍යවල වෛරී කථනය හරහා පැතිරයාම හේතුවෙනි. ප්‍රතිචාර දක්වන්නන් සඳහන් කළේ මෙකී වෛරී කථනයට සම්බන්ධ වූවන්, සිය ප්‍රොපගැන්ඩාව (ප්‍රචාරණ යාන්ත්‍රණය) සඳහා සමාජ මාධ්‍ය භාවිතා කරන බොදු බල සේනාවේ (BBS) ආධාරකරුවන් සහ එයින් සෙවණ ලබන්නන් බව ය. මාතර නගරයෙන් පැමිණ සිටි මුස්ලිම් ස්ත්‍රීහු සමාජ මාධ්‍ය තුළ බොදු බල සේනාව තහනම් කිරීමේ වැදගත්කම අවධාරණය කළහ. ඔවුන් සඳහන් කළේ මුස්ලිම් ව්‍යාපාරවලට අනුග්‍රහය දැක්වීමට එරෙහිව අනතුරු අඟවමින් කෙටි පණිවුඩ ගණනාවක් යවා තිබූ බවත්, ෆේස්බුක් හි වෛරී කථනයට එරෙහිව කිසිදු පියවරක් නොගත් බවත් ය. එසේම එකී ෆේස්බුක් ගෲප් රාවණා බලකාය, මහසෝන් බලකාය සහ දයාන් ප්‍රසාද් යන අය විසින් මෙහෙයවූ බවත්, ඔවුන් ව වැළැක්වීමට කිසිවක් නොකළ බවත් ඔවුහු සඳහන් කළහ. වැලිගම ප්‍රදේශයෙන් පැමිණ සිටි බෞද්ධාගමික ප්‍රතිචාර දක්වන්නෙක් ද මේ මතයම පළ කළේ, යුද්ධය අවසන් නමුත් සංහිඳියාවක් තවම ඇති වී නැති බව සහ, රට තුළ සංහිඳියාවට බාධා කිරීම සම්බන්ධයෙන් මාධ්‍ය විසින් ප්‍රබල භූමිකාවක් සිදුකරමින් සිටින බවත් ය.

සමාජ මාධ්‍ය තුළ වෛරී කථනය හරහා තරුණ ප්‍රජාව වැඩි වශයෙන්ම පෙළඹීමට ලක්වීමට ඉඩ පැවති බව සඳහන් විය. සමාජ මාධ්‍ය ජාල තුළ සිදුවූ එබඳු කුපිත කරවනසුලු වෛරී කථනයන් සම්බන්ධයෙන් මුස්ලිම් කාන්තාවෝ ද සිය කණස්සල්ල පළ කළහ. ඔවුන් සඳහන් කළේ මෙකී සමාජ මාධ්‍ය පෝස්ට් මඟින් තරුණයන් කෝපයට පත් වූ බව සහ, මුස්ලිම් පල්ලිය විසින් ඔවුන් ව සන්සුන් කිරීමට විශාල වශයෙන් වෙහෙස වී කටයුතු කළ බවත්, තරුණයන් ඉවසිලිමත් විය යුතු බව සහ කලබලයෙන් ක්‍රියානොකළ යුතු බවට පල්ලියෙන් දේශනා කළ බව ය. යටිබිම්ගත මට්ටමේ ගැටුම් නොපැවතිය ද, තරුණයන් ගැටුම් මානසිකත්වයකින් සිටි බව ද වැලිගමදී බෞද්ධ ප්‍රතිචාර දක්වන්නන් විසින් සඳහන් කෙරිණි. තරුණයන් පහසුවෙන් පෙළඹීමට ලක්වීමට නැඹුරුතාවක් දැක්වූ බවත්, ඒ අනුව විශාල වශයෙන් දැනුවත් කිරීම් සහ විශේෂයෙන්ම වැරදි වැටහීම් සහ ගැටුම් ඇතිවිය හැකි භාෂාමය වෙනස්කම් සම්බන්ධයෙන් ඔවුන් සංවේදීකරණ වැඩසටහන් කිරීමට සිදුවූ බවත් දෙණියායෙන් පැමිණ සිටි ප්‍රතිචාර දක්වන්නෝ ද සඳහන් කළහ.

වැලිගම ප්‍රදේශයේ මනෝවිද්‍යාත්මක සැකසුම තුළ අන්තවාදය වෙනස් ආකරයකින් විදහා දැක්වුණේ අන්තවාදී කල්ලි තමන්ට එරෙහිව කුමන්ත්‍රණය කරන බවට සුළුතර ප්‍රජාව අතර සැකය සහ අවිශ්වසනීයත්වය ඇතිකිරීමට මග පාදමිනි. මුස්ලිම් ජාතික ප්‍රතිචාර දක්වන්නන් සඳහන් කළේ සහජීවනය එම ප්‍රදේශයේ පොදු මතය බවට පත්ව තිබෙන බවත්, ප්‍රචණ්ඩත්වය/

ගැටුම් උසි ගැන්වූයේ තමන් සමග ජීවත් වන ප්‍රජාව විසින් නොව, ජාතිවාදී සංවිධාන විසින් බව ය. එසේම බොදු බල සේනා සංවිධානය විශාලතම තර්ජනය බව ඔවුන්ගේ මතය විය. මායිම් මුස්ලිම් ගම්මානවල පිහිටා තිබෙන පන්සල්වල ක්‍රියාත්මක වන සහ රැස්වීම් පවත්වන බොදු බල සේනාව විසින් සිය ප්‍රජාවට එරෙහිව කුමන්ත්‍රණ ක්‍රියාවට නංවනු ඇතැයි ප්‍රතිචාර දක්වන්නෝ බිය පළ කළහ. එසේම මුස්ලිම් ජාතිකයන්ට එරෙහිව කුමන්ත්‍රණය කිරීම පිණිස පිහිටුවාගත් කමිටුවක් සම්බන්ධයෙන් ද ඔවුහු අවධානය යොමු කළහ. ඔවුන් සඳහන් කළේ මෙම කමිටුවේ එක් මුලපිරීමක් වන්නේ ඇතැම් පෙර පාසල් හරහා මුස්ලිම්වරුන් සම්බන්ධයෙන් වෛරය පැතිරවීම බවයි. මෙහිදී මුස්ලිම් ප්‍රජාවේ සෘණාත්මක පුද්ගල චරිත පිළිබඳ දරුවන්ගේ සිත්වලට අදහස් කා වැද්දීම, මුස්ලිම්වරුන් තොප්පි පළඳින බව සහ දිගු රැවුල් සහිත බව, මිනිසුන් සම්බන්ධයෙන් මුස්ලිම් ජාතිකයන් දුෂ්ට සිතිවිලි දරන බව සහ මිනිසුන්ට කරදර කරන බව දරුවන්ට ඉගැන්වීම සිදුකරන බව ඔවුහු සඳහන් කළහ. බහු-ජනවාර්ගික ප්‍රජාව පිළිබඳ විශේෂයෙන්ම දරුවන් තුළ පවතින මතවාදය දැඩුරු කිරීම සහ අන්තවාදී කණ්ඩායම් විසින් අන්තර්-ආගමික ගැටුම් අනාගතයේදී උද්ගත වීම සිදුකරනු ඇති බවට ඔවුහු සඳහන් කළහ. ඒ අනුව සිය තරුණයන්ගේ අනාගතය පිළිබඳ මුස්ලිම් කාන්තාවන් බිය පළ කළේ එබඳු විසකුරු මුස්ලිම් විරෝධී මතවාදයන් ප්‍රජාව හරහා පැතිරීම හා වර්ධනය වීම සිදුවුවහොත් මුස්ලිම්වරුන් රැකියාවලදී සහ රෝහල්වලදී වෙනස්කොට සැලකීම්වලට ලක්වනු ඇති බවට ය.

කෙසේ නමුත් එබඳු ක්‍රියාකාරකම්වල සියලුම භික්ෂූන් වහන්සේලා නොයෙදෙන බව ද මුස්ලිම් ජාතික ප්‍රතිචාර දක්වන්නෝ අවධාරණය කළහ. තවද මුස්ලිම්වරුන් වරදක් කළ ද ඔවුන් ව ආරක්ෂා කරන එක් හිමිනමක් පිළිබඳව ද ඔවුහු සඳහන් කළහ. ඔවුන් නිරීක්ෂණය කළේ, ඥානසාර සහ බොදු බල සේනාව අන්තර්-ආගමික සමගියට පවතින විශාලතම තර්ජනය වන හෙයින් ඔවුන්ට  එරෙහිව සියලුම යහපත් භික්ෂූන් නැගී සිටිය යුතු බවයි.

සිය දිස්ත්‍රික්කය තුළ වූ යථාර්ථය සමග ගැටෙමින්, මාතර සහ වැලිගම බෞද්ධ ප්‍රතිචාර දක්වන්නෝ, ආගමික අන්තවාදය පිළිබඳ සිය විශ්ලේෂණය තුළ අන්තරාවලෝකනයක සහ ස්වයං විවේචනයක යෙදුණහ. ඥානසාර වැනි පුද්ගලයන්ගේ අන්තවාදී බෞද්ධ හැසිරීම් අතිශය හානිකර බවට ඔවුන් එකඟ වූයේ ඒවා විසින් අනවශ්‍ය සහ අදාළ නොවන ප්‍රශ්න නිර්මාණය කරන බැවිනි. වැලිගම බෞද්ධ ආගමික ප්‍රතිචාර දක්වන්නෝ ඥානසාර භික්ෂුවගේ හැසිරීම පිළිබඳ අතිශය විවේචනාත්මක වූහ. ඔවුන් විසින් ඥානසාර භික්ෂුව හඳුන්වා දුන්නේ 'පිස්සු මිනිහා' සහ 'මැරයා' වැනි යෙදුම්වලිනි. ප්‍රජාව ඔහුව දකින්නේ දේශපාලන ශක්තිය සහ දේශපාලන පෙළඹවීම් සහිත මෙන්ම, එකිනෙකට වෙනස් ප්‍රජාවන් අතර වෛරය පැතිරවීම සඳහා මාධ්‍යය භාවිතා කරන්නෙකු ලෙස ය. ඔහු වැනි අය පාලනය කළ යුතු බවට සියල්ලෝම එකඟ වූහ. පන්සල් අතිශය වාණිජකරණයට ලක් වී ඇති බවද, මුදල් එකතු කරන මධ්‍යස්ථාන බවට පත්ව ඇති බවද, පන්සල් විසින් දුප්පතුන්ට උදව් කරන්නේ ඉතා අඩුවෙන් බව ද ඔවුහු තවදුරටත් කියා සිටියහ. ප්‍රතිචාර දක්වන්නන් නිරීක්ෂණය කළේ ඇතැම් භික්ෂූන් අවිනීත, දූෂිතයන් බවට පත්ව ඇති බවත් බුද්ධාගම පිළිබඳ වැරදි පින්තූරයක් සෙස්සන්ට නිර්මාණය කරමින් සිටින බවත් ඔවුහු නිරීක්ෂණය කළහ. බෞද්ධ ප්‍රතිචාර දක්වන්නන් විසින් අවබෝධ කර ගෙන තිබූ පරිදි ආගමික අන්තවාදය, චීවරධාරීන් මුදල්මය ලෙස පොහොසතුන්

බවට පත්වීම සඳහා ක්‍රමයකි (කේන්ද්‍රීය කණ්ඩායම් සාකච්ඡාවලට සහභාගි වූවන්, 2017 ජූනි 17).

ඉහත දැක්වූ කරුණු නැවත කියා සිටිමින් එක්තරා භික්ෂුවක්, චීවරධාරීන් සහ බෞද්ධ හිමිවරුන් අතර ඇති සම්බන්ධතාවය ඍජු ලෙස සාකච්ඡා කළේ 'ආගමික සේ පෙනී සිටින' භික්ෂූන් විසින් ගැටුම නිර්මාණය කරන බව සහ තමන් ද ඇතුළුව මධ්‍යස්ථ හිමිවරුන් ශාසනාරක්ෂක සුළුතරයට අයත් වන බව ය. අන්තර්-ආගමික ක්‍රියාකාරකම්වලට සහභාගි වීමට එම භික්ෂුව සිය බිය පළ කළේ එය සිය ශාසනයේ සෙසු භික්ෂූන් අතර පමණක් නොව පන්සල් එන ප්‍රජාව අතරින් පවා අපවාද ඇසීමට සිද්ධ කළ බැවින් බව ද පවසමිනි. අන්තර්-ආගමික වැඩසටහන්වලට සහභාගි වූ ලිබරල් හිමිනමකගේ සැක කටයුතු අපවත්වීමක් ගැන ද සඳහන් කළේය. එසේ හෙයින් ප්‍රතිචාර දැක්වූ භික්ෂුව වැනි මධ්‍යස්ථ භික්ෂූන් ගම්මානයේ වෙනත් ආගමික ප්‍රජාවන් සමග ධනාත්මක ලෙස සම්බන්ධ වී කටයුතු කිරීමට බියක් දක්වන බව සහ එසේ කිරීම අසීරු වී ඇති බව ද සඳහන් විණි (බෞද්ධ භික්ෂුවක්, 2018 මැයි 26).

විශේෂයෙන්ම බෞද්ධ ප්‍රජාව අතර පවතින අන්තවාදය (බෞද්ධ හෝ මුස්ලිම් ප්‍රතිචාර දක්වන්නන් කිසිවෙක් මුස්ලිම් අන්තවාදය ගැන සඳහන් කළේ නැත). පුද්ගලික සහ දේශපාලනික පෙළඹවීම්වලින් යුත් ප්‍රබල තනි පුද්ගල කාරකයන් විසින් ගාමනය වන බව මේ අනුව පෙනේ. ද්වේෂය  සහ වෛරී ප්‍රකාශනය ඔවුන් විසින් ප්‍රචාරණය කරන ප්‍රබලත්වය විසින් ලිබරල් භික්ෂූන් හට සිය මතය පළ කිරීමට සහ, අන්තර්-ආගමික (සමයාන්තර) ක්‍රියාකාරකම්වලට සම්බන්ධ වීමට ඔවුන්ට නොහැකි කරනවා පමණක් නොව, ප්‍රජාවන් අතර ව්‍යාකූලතාවයේ, සැකයේ සහ අවිශ්වසනීයත්වයේ බීජ වපුරනු ලබයි.

එසේ හෙයින්, මේ අධ්‍යයනයේ එක් සුවිශේෂී සොයාගැනීමක් වන්නේ දුර්මතවලටත් වඩා, අවිශ්වාසය සහ සැකය අන්තර්-ආගමික ගැටුම ප්‍රවර්ධනය කිරීමෙහිලා ප්‍රධාන සාධකයන් වන බව ය. මෙය එක් එක් ජනවාර්ගික-ආගමික ප්‍රජාවන්ගේ අනාරක්ෂිතභාවයන් තුළින් පැන නගින බිය සමඟ එක් වේ. ප්‍රාදේශීය මෙන්ම ජාතික මට්ටමේදී ද ඒවා වෛරී කථනය සහ අන්තවාදී සංරචකයන්ගේ න්‍යායපත්‍රයන්ගෙන් රාමුගත කර අවුළුවාලනු ලබයි. අම්පාර මුස්ලිම් ප්‍රජාව දැරූ මතය වූයේ වාර්ගික ශෝධනය සම්බන්ධයෙන් විශාල (ජාතික) කුමන්ත්‍රණයක් පවතින බව සහ, එම මතය මංකොල්ලකෑම් සහ ප්‍රජාවට එරෙහි ප්‍රචණ්ඩත්වය තුළින් පෝෂණය ලබා තිබිණි. අම්පාර නගරයේ මුස්ලිම් හෝටලයක් 2017 වසරේදී පුච්චා දමා තිබූ අතර, පල්ලියකට අලාභ හානි සිදුකර තිබිණි. මෙය මුස්ලිම්වරුන් විසින් ආරෝපණය කර තිබුණේ,  කිසිදු බියකින් තොරව තමන් අගතියට පත් කිරීම සඳහා රාජ්‍යය විසින් සිංහලයන්ට ලබාදී තිබෙන මුක්තිය වෙත ය.

අවිශ්වසනීයත්වය සහ වෙනස්කොට සැලකීමක් විය හැකි තවත් තත්වයක් අලි-මිනිස් ගැටුමට සම්බන්ධිතව විද්‍යාමාන වේ. අම්පාර දිස්ත්‍රික්කයේ මුස්ලිම් ප්‍රතිචාර දක්වන්නන් කිහිප දෙනෙක් සඳහන් කළේ මෑත කාලයේ වන අලින් හේතුවෙන් තමන් ගැටළුවලට මුහුණ දෙන බවයි. ඔවුන්ට අනුව වසර 30-40කට පෙර කාලයේ එම ප්‍රදේශවල වන අලින්ගේ ගැවසීම එතරම් දැකගත හැකි වූයේ නැති අතර ඔවුන්ගේ තර්කය වූයේ සිංහල ගම්මානවලට වල් අලි ඇතුල්වීම වැළැක්වීම සඳහා අලිවැට ඉදිකර තිබෙන බව සහ, අලින් අලයදිවෙම්බු සහ

පලමුනෙයි වැනි මුස්ලිම් ගම්මානවලට පන්නා දැමෙන බව ය. මෙය සිතාමතා කරන ක්‍රියාවක් බවට වන සාධාරණීකරණය වූයේ මෙම අලින්ගේ පාද වටා යකඩ වළලු ඇති හෙයින් උන් වල් අලින් නොවන බව ය. ඔවුන්ගේ සැකය වැරදි වුවත්, නිවැරදි වුවත්, බෞද්ධ ප්‍රජාව අතර මුස්ලිම් විරෝධී මතයන් ඇතිවීමට දායක වීමේදී අවිශ්වසනීයත්වයට කොතරම් ආතතියක් ඇති කළ හැකි වේද යන්න මෙයින් මනාව පෙනී යයි.

මුස්ලිම් ප්‍රතිචාර දක්වන්නට සමානව අම්පාර බෞද්ධ ප්‍රතිචාර දක්වන්නෝ ද මුස්ලිම් ප්‍රජාවේ ක්‍රියාවන් කෙරෙහි සිය අවිශ්වසනීයත්වය පළ කර සිටියහ. ඔවුන්ට හැඟුණේ උතුරු නැගෙනහිරින් හමුදා ඉවත් කරගන්නා ලෙසට මුසල්මානුවන් විසින් සිදුකරනු ලබන ඉල්ලීම පිටුපස විශාල කුමන්ත්‍රණයක් ඇති බවත්, එය ඔවුන්ගේ (සිංහල) වාසියට හේතු නොවනු ඇති බවත් ය. උතුර සහ නැගෙනහිර බෙදා වෙන් කිරීමේ කුමන්ත්‍රණයක් පිළිබඳ බියක් ද ඔවුන් තුළ පැවති අතර, අන්තවාදී කණ්ඩායම් විසින් අවුළුවාලන සිංහල බෞද්ධ ජාතිය රැක ගැනීමේ ජාතික කථිකාව සමග මෙම බිය පැහේ. අන්තවාදී මතයන් යටිබිම්ගත මට්ටම්වල කොතෙක් ගැඹුරට ගමන් කර තිබේද යන්න, සිංහලයන් සිංහල රටක ජීවත් විය  යුතු බවත්, මුස්ලිමුන් මුස්ලිම් රටක ජීවත් විය යුතු බවටත්, ඒ අනුව සංහල සංස්කෘතිය රැක ගැනීමේ අවශ්‍යතාවයක් සහ මුස්ලිම් රටවලින් ලබෙන ආධාර ප්‍රතික්ෂේප කළ යුතු බවටත් පැවති බෞද්ධ ප්‍රතිචාර දක්වන්නන්ගේ මතයෙන් මනා ලෙස පෙනේ (ග්‍රාමීය සංවර්ධන සංසදයක සාමාජිකයෙකු වූ බෞද්ධ පුරුෂයෙක්, 2018 මැයි 25). ඇතැම් ප්‍රතිචාර දක්වන්නෝ භික්ෂුවක වශයෙන් ඥානසාර වෙත සිය ගෞරවය ද පළ කර සිටියහ.

ඔවුන් තර්ක කළේ බොදු බල සේනාවේ ආගමික හේතු දැක්වීම් සහ රට පිළිබඳ ඇති හැඟීම සාධාරණ අතර, එම හේතු දැක්වීම් මත පදනම් වූ බොදුබල සේනාවේ ක්‍රියාවන් වැරදි සහගත බව ය. වත්මන් සන්දර්භය තුළ බුද්ධාගම උවදුරට හෙළී ඇති බවටත්, සිංහල ජනගහනය විසින් ආගම කෙරෙහි ගෞරවනීය හැඟීමකින් යුතුව එයට ප්‍රතිචාර නොදක්වන බවටත් ප්‍රතිචාර දක්වන්නෝ කිහිප දෙනෙක් මත පළ කළහ. එපමණක් නොව, ඔවුන් විශ්වාස කළේ තමන් මුස්ලිම් සහ දමිළයන්ගේ ආගම්වලට ගරු කරන නමුත් ඔවුන් බුද්ධාගමට ගෞරව නොකරන බවත් ඒ අනුව රට තුළ බුද්ධාගමට හිමි ප්‍රමුඛස්ථානය අස්ථාවර වෙමින් පවතින බවත් ය.

## 2.3. ධර්ම ප්‍රචාරය, අන්තර් විවාහ සහ ආචාර සම්පන්න නොවන සංවාද

අන්තර්-ආගමික සහ අභ්‍යන්තර-ආගමික ගැටුම් යන ද්විත්වයම සඳහා වැදගත් හේතුවක් වන්නේ විශේෂයෙන්ම ක්‍රිස්තියානි ප්‍රජාව අතර සහ ක්‍රිස්තියානි ප්‍රජාව විසින් සිදුකරනු ලබන ආගම් ප්‍රචාරයයි. ආගම් ප්‍රචාරය මූලික වශයෙන් ආගම සහ වාර්ගිකත්වය මත පමණක් නොව සමාජ-ආර්ථික සහ දේශපාලනික බලය මත පදනම් වූ 'කණ්ඩායම් අනන්‍යතාවය'ට තර්ජනයක් වන හෙයින් එය අන්තර්-ආගමික සබඳතාවලට බලපෑම් සිදුකරයි. තවද එය ආගම සහ කුලය විසින් අර්ථ දක්වනු ලබන අභ්‍යන්තර-ආගමික සබඳතාවලටද බලපානු ලබයි.

විශේෂයෙන්ම මන්නාරම, අම්පාර සහ මාතර දිස්ත්‍රික්කවල ධර්ම ප්‍රචාරයේ යෙදෙන පල්ලි, කතෝලික සහ ක්‍රිස්තියානි ප්‍රජාවන් අතර ව්‍යාප්ත වී ඇත. මෙමගින් අන්තර් සහ අභ්‍යන්තර ආගමික ගැටුම් පුද්ගලික, සමාජයීය සහ දේශපාලනික මට්ටම්වලදී ප්‍රතිඵල කළ සමජාතීය

ආගමික ප්‍රජාවන්ගේ පූර්ව අනන්‍යතාවන් පුපුරුවා හැර තිබේ. මන්නාරම දිස්ත්‍රික්කයේ (ප්‍රතිචාර දක්වන්නන් විසින් නිර්වචනය කළ පරිදි) පුළුල් ලෙස පැතිරුණු ක්‍රිස්තියානි කණ්ඩායම් තුනක්, එනම් සම්ප්‍රදායික කතෝලික පල්ලි (රෝමානු කතෝලික), ප්‍රධාන ධාරාවේ පල්ලි සහ නිදහස් පල්ලි (මේ වර්ග දෙකම රෝමානු කතෝලික නොවන යනුවෙන් හැඳින්වේ) පවතියි. රෝමානු කතෝලික ප්‍රතිචාර දක්වන්නෝ නිදහස් පල්ලි සම්බන්ධයෙන් එතරම් සැලකිල්ලක් නොදැක්වූ නමුත් මුස්ලිම් සහ හින්දු භක්තිකයන් සමග සිය සම්බන්ධතා කෙරෙහි විශාල සැලකිලිමත් වීමක් පළ කළහ. ආයතනගත මට්ටමේදී කතෝලික පල්ලිය (මන්නාරමේ ආගමික ධූරාවලියේ ඉහළින්ම පවතින) නිදහස් පල්ලි සමග කිසිදු ආකාරයක නිල අන්තර්ක්‍රියාවක් නොදක්වන නමුත් ඇන්ග්ලිකානු සහ බැප්ටිස්ට් පල්ලි වැනි ප්‍රධාන ධාරාවේ පල්ලි ලෙස හඳුනාගත හැකි පල්ලි සමඟ ඔවුන්ගේ අන්තර්ක්‍රියා පැවතිය හැක. කතෝලික පල්ලියේ නියෝජිතයෙකුට අනුව නිදහස් පල්ලි සමග සම්බන්ධතාවක් ගොඩ නගා ගැනීම, තවත් වසර 15-20 ක් පමණ ගතවන දෙයක් වනු ඇත (කතෝලික පියනමක්, 2018 අප්‍රේල් 14).

රෝමානු කතෝලික නොවන ප්‍රජාව පිළිබඳ කතෝලික ප්‍රතිචාර දක්වන්නන් විසින් කිසිදු අදහස් දැක්වීමක් නොකරන අතරවාරයේ නිදහස් පල්ලි නියෝජනය කරන ප්‍රතිචාර දක්වන්නේ කතෝලිකයන්ට එරෙහිව කරුණු ගණනාවක් සැලකිල්ලට ලක් කළහ. නිදහස් පල්ලියේ පාදිලිවරයෙකුට අනුව, මන්නාරමේ ජනගහනයෙන් 2.6% ක් රෝමානු කතෝලික නොවන අය වන අතර, ඉඩම් සහ අනන්‍යතාවය මුල්කරගෙන කතෝලිකයන් සමග ඔවුන්ගේ ගැටුම් නිර්ගමනය වේ. එය සිදුව තිබෙන්නේ හතු පිපෙනවාක් මෙන් නිදස් පල්ලි බිහිවීම මත වන අතර, නිදහස් පල්ලිවලින් බහුතරය පුද්ගලික ඉඩම්වල ඉදිකර තිබෙනුයේ (නිතරම එය පාදිලිට හෝ ඔහුගේ/ඇයගේ ඥාතියෙකුට අයත් ඉඩමක් වේ) ප්‍රදේශයේ අලුත් පල්ලියක් ඉදිකිරීම සඳහා ප්‍රාදේශීය පාලනයේ අනුමැතිය ලබාගැනීම අසීරු වීම යන කාරණය මත ය. නිදහස් පල්ලි ඉදිකෙරෙන විට එය කතෝලික අසල්වාසීන්ගේ (පාදිලිවරයාගේ ඥාතීන් ද වන) එදිරිවාදී කමට හේතුවක් වන අතර, රෝමානු කතෝලික පල්ලිවලට ගල් ගැසීම සහ තාවකාලික ගොඩනැගිලි විනාශකිරීම පවා ඔවුන් විසින් සිදු කෙරේ. මෙකී ප්‍රචණ්ඩත්වයේ ආකාරයන් නොඉවසීම සහ ගම්මානයක කතෝලික අනන්‍යතාවයට සිදුවන අයුතු ඇතුල්වීමක් සඳහා විරෝධයක් බව නිරීක්ෂණය කිරීම වැදගත් වන අතර, පුද්ගලික ප්‍රශ්න ද මේ සමග ඈඳී පවතින්නේ එවැනි ක්‍රියාවන් සිදුකරන්නන් නිතරන්තරයෙන්ම පාහේ, අලුත් නිකායකට බැඳීම සඳහා කතෝලික පල්ලියෙන් ඉවත් ව ගිය එකී පාදිලිවරයාගේ ළඟම ඥාතීන් සහ අසල්වාසීන් වන හෙයිනි (කතෝලික නොවන පාදිලිවරයෙක්, 2017 මාර්තු 7). මන්නාරම ඓතිහාසික අනන්‍යතාවය පිළිබඳ ඔහු පළ කළ මතය වූයේ නව ක්‍රිස්තියානි නිකායන්ගේ නිර්ගමනය සඳහා ජනතාවගේ විරුද්ධත්වය පළ වන මූල හේතුව කතෝලික දියෝකීසිය බවයි. මෙය ක්‍රිස්තියානින් අතර සිදුවන විවාහවලට විරුද්ධත්වය පෑම තුළ හේතුවෙන් ද සිදුව තිබේ.

මන්නාරම දිස්ත්‍රික්කයේ නව ක්‍රිස්තියානි නිකායන් ව්‍යාප්ත වීමට හේතු සම්බන්ධයෙන් නිදහස් පල්ලියේ පාදිලිවරයා ද ස්වයං විවේචනයක යෙදුණේය. ඔහු සඳහන් කළේ නිදහස් පල්ලි ප්‍රජාව (සබායි) ක් අතර දේවධර්මය පිළිබඳ විසංවාද ඇතති වූ විට, සාමාජිකයන් කිහිප දෙනෙක් කැඩී ගොස් තමන්ගේම පල්ලියක් ආරම්භ කරන බවයි. මෙකී නව පල්ලිය නිතරම පාහේ පිහිටා තිබෙන්නේ මව් පල්ලියට කිලෝමීටරයක් පමණ දුරකිනි. නිදහස් පල්ලිවලට ප්‍රමිතිගත වූ දේවධර්මයක් නොමැති බවට ද පාදිලිවරයා විවේචනය කළේය. ඇතැම් පාදිලිවරුන්

රෝමානු කතෝලික නොවන සරසවිවල දේව ධර්මය ඉගෙන ගන්නා විට සෙස්සෝ එසේ නොකරති. ඔහු සඳහන් කළේ දේවධර්ම පසුබිමක් නොමැත්තන් සිය පල්ලි හුදු වශයෙන් ලාභ ඉපැයීම සඳහා යොදාගන්නා බවයි. ඒ නිසා ඔහුට අනුව පල්ලි ලියාපදිංචි කිරීම වැදගත් දෙයකි. මේ ලියාපදිංචි කිරීමේ අවශ්‍යතාවය, අයෙකුගේ නිවාසය පිහිටි පරිශ්‍රය තුළ පුද්ගලික පල්ලියක් ඉදිකිරීම මගින් උපායශීලී ලෙස මගහරිනු ලැබේ.

නිදහස් පල්ලි හතු පිපෙන්නාක් මෙන් බිහිවීම ආගමට හරවා ගැනීමට අනුබද්ධිතව සිදුවන්නකි. යාපනයේ ඉවැන්ජලික පල්ලි විසින් 'සදාචාර සම්පන්න නොවන'ආගම්වලට හැරවීම මගින් දමිළ කතෝලික සහ හින්දු ප්‍රජාවන් අතර නොසන්සුන්කාරී වාතාවරණයක් ඇති කර තිබේ. කතෝලික සහ රෝමානු කතෝලික නොවන ප්‍රතිචාර දක්වන්නන් සඳහන් කරනුයේ හින්දු බහුතරය සමග ස්වකීය සම්බන්ධතාවය සුහද එකක් වන බව ය. අනෙක් අතට හින්දු ප්‍රතිචාරදක්වන්නෝ, සිය ප්‍රජා සාමාජිකයන් පහසුවෙන්ම, කතෝලික නොවන ඉවැන්ජලික කණ්ඩායම් විසින් ක්‍රිස්තියානි ආගමට හරවා ගැනීම පිළිබඳ නොසතුට පළ කළහ. අතීතයේදී හින්දූන් ක්‍රිස්තියානි ආගමට හැරුණේ කුලය මත පදනම් ව සිදුවන වෙනස්කොට සැලකීම්වලින් පළා යාමට, අධ්‍යාපනයේ ඉහළ මට්ටම් ළඟා කර ගැනීමට, මූල්‍ය ලැබීම් සඳහා සහ යුධ සමයේ හිංසනයන්ට ලක් වීමෙන් වැළකීම පිණිස ක්‍රිස්තියානි නම් ලබාගැනීම සඳහා ය (රජයේ නිලධාරියෙකු වන හින්දු පුරුෂයෙක්, 2017 මාර්තු 10). වර්තමානය වන විට ක්‍රිස්තියානි ආගම වෙත හැරීම සඳහා පෙළඹුම්කාරක බවට පත්ව තිබෙනුයේ ප්‍රාතිහාර්ය මගින් රෝග සුවකරගැනීම, අනාවැකි සත්‍ය කර ගැනීම සහ දේව සභාව හා ලංකා පෙන්තකොස්ත සභාව වැනි ඉවැන්ජලික පල්ලි විසින් සපයන මූල්‍යමය ලැබීම් සඳහා ය (කාන්තා සංවර්ධන කමිටුවක හින්දු සාමාජිකාවක්, 2017 මාර්තු 9). ක්‍රිස්තියානින් බුද්ධාගමට සහ ඉස්ලාම් ආගමට හැරීම සම්බන්ධයෙන් පවා අන්තර් ආගමික විවාහවල බලපෑමක් තිබේ. ප්‍රතිචාර දක්වන්නන් නිරීක්ෂණය කළේ සියලුම හින්දු සහකරුවන් පාහේ ආගමට හැරෙන බව ය. එක් ප්‍රතිචාර දක්වන්නෙක් සඳහන් කළේ මෙසේ සිදුවන්නේ වෙනත් දෙවියන් වැඩි වශයෙන් පිළිගන්නා හින්දුත්වවාදය, බහුදේවවාදයක් වන නිසා බව ය. ආගමට හැරීම තමන් විසින් හිතාමතාම මග හරින බව ඇතැම් ප්‍රතිචාර දක්වන්නන් විසින් සඳහන් කළද, ක්‍රිස්තියානි ඉවැන්ජලීකරණයේ බලපෑම හේතුවෙන්ද ඇතැම් හින්දූන් ක්‍රිස්තියානි පල්ලිවල මෙන්ම හින්දු කෝවිල්වල ද වන්දනා මාන කරන බව ය. සියලුම ප්‍රතිචාර දක්වන්නන් සඳහන් කළේ, අවබෝධ කර ගත හැකි මට්ටමේ අපේක්ෂා සුන් වීමක් පැවතියද, ආගමට හැරීම හේතුවෙන් ප්‍රකට ගැටුම් ඇති වී නොමැති බව ය. කෙසේ නමුත් හින්දූන් සහ ක්‍රිස්තියානින් යන දෙපිරිසම විසින් සිය බලවත් අකමැත්ත පළ කළ එකම කණ්ඩායම වූයේ, ආගමට හරවා ගැනීම සඳහා ආගන්තුක ක්‍රමවේදයන් අනුගමනය කරන යොහෝවාගේ සාක්ෂිකරුවෝ නිකාය පමණි.

අම්පාර හින්දු ජාතික ප්‍රතිචාර දක්වන්නන් සඳහන් කළේ ආගමට හරවා ගැනීම සිදුවෙමින් පැවතියද, හින්දු බැතිමතුන් සහ ක්‍රිස්තියානින් අතර සම්බන්ධතා සුහද ලෙස පවතින බවයි. නමුත් එක් ප්‍රතිචාර දක්වන්නෙක් ක්‍රිස්තියානින් වෙත පවතින පොදු ආකල්පය නැවත නැවතත් අවධාරණය කළේ ''අල්ලපු ගෙදර ඉන්නෙ ක්‍රිස්තියානින් නම් ඔවුන් කොහොම හරි ඔබව ආගමට හරවා ගන්නවා. මම දන්නෙ නෑ ඒක කරන්නෙ බ්ලැක් මැජික් එකක් වගේ දේකින් ද කියලා..'' යනුවෙන් පවසමිනි (සමථ මණ්ඩලයේ හින්දු සාමාජිකාවක්, 2017 මැයි 24). තවත් ප්‍රතිචාර දක්වන්නෙකුට අනුව, ප්‍රජාවන් දෙක අතර මිශ්‍ර විවාහ ගණනාවක් සිදුව

ඇති බැවින් සහ හින්දු ආගම්වලට හැරුණුවුන්ගෙන් බහුතරයක් කෝවිල සහ පල්ලිය යන දෙකෙහිම වන්දනාමාන කරන හෙයින් ඔවුන් එකිනෙකා සමග සුහද සබඳතා පවත්වාගෙන යන බවයි (යාපනයේ මතය කියා පාමින්). කෙසේ නමුත් හින්දු ප්‍රතිචාර දක්වන්නන් හට, ජේසු අමතයි, ජේසු ජීවමානයි, කතෝලික, මෙතෝදිස්ත වැනි නිකාය නාමයන් සඳහන් කිරීමට හැකියාව තිබියදී ද ඔවුන් එම නිකායන් එකිනෙක අතර පවතින වෙනස්කම් පැවසීමට සමත් වූයේ නැත. එක් හින්දු පූජකවරයෙක් තමන්ගේම ප්‍රජාව විවේචනය කළේ, හින්දූන් ක්‍රිස්තියානි ආගමටත් ඉස්ලාමයටත් හැරෙන්නේ හින්දු කෝවිල් පරිපාලනය ඥාතීන් සමග පවත්වාගෙන යාම සහ ප්‍රජාවේ සුබසිද්ධිය වෙනුවෙන් කටයුතු නොකිරීම නිසා බවයි. මේ සඳහා දායක වන සාධකයක් වන්නේ හින්දු ආගමික ස්ථාන ඒකාබද්ධ කරන එක් ආයතනයක් නොමැති වීම සහ, සෑම හින්දු කෝවිලක්ම ස්වාධීන වීමයි. මේ අනුව, කෝවිල් පරිපාලකයන්ගෙන් වැඩි කොටසට ක්‍රිස්තියානි සහ මුස්ලිම් ආගමික ස්ථාන පරිපාලකයන්ට මෙන් නොව, සිය ප්‍රජාවට පුණ්‍ය සේවා සැපයීම පිණිස විභවයක් නොමැත. ක්‍රිස්තියානින්ට එරෙහිව හින්දූන් පළ කළ එකම කණස්සල්ල වූයේ වන්දනාවලදී ඔවුන් මහ හඬින් ගායනා කරන බව සහ, මෙමගින් ඒ අවට පදිංචි වී සිටින හින්දු පවුල්වල දරුවන්ගේ අධ්‍යාපන කටයුතුවලට බාධා සිදුවන බවයි. කෙසේ නමුත් ක්‍රිස්තියානි පාදිලිවරයෙක් පැවසුවේ ගම්මානයක නව පල්ලියක් ස්ථාපනය කළ විට හින්දූන් ගල් ප්‍රහාර එල්ල කරන බව සහ, විරෝධය පාන බව ය. එයට උදාහරණයක් වන්නේ හින්දූන් විසින් ගිනි තැබීම් සහ ඉදිකිරීම් විනාශ කිරීම් හරහා ක්‍රිස්තියානි පල්ලිය ඉදිකිරීම නතර කළ තඹලවිල ප්‍රදේශයයි.

දෙණියායේ හින්දු ප්‍රතිචාර දක්වන්නන් ක්‍රිස්තියානි ඉවැන්ජලික පල්ලිවලට එරෙහිව සිය දැඩි කණස්සල්ල පළ කළහ. සෙසු ආගම් ගැන ව්‍යාජ ආකල්ප සිදුකිරීම මගින් දේව සභාව, කල්වාරි සහ වෙනත් කුඩා නිකායන් සහ, ඉවැන්ජලීකරණය සිදු නොකරන කතෝලික පල්ලිය අතර වෙනස ඔවුහු පැහැදිලි ලෙස දක්වා සිටියහ. හින්දු ප්‍රතිචාර දක්වන්නෝ ආගම්වලට හරවා ගැනීම ගැන විරුද්ධත්වයක් ප්‍රකාශ නොකළහ. ඔවුන් එය සාධාරණීකරණය කළේ එය, හින්දු කෝවිල ව්‍යාපරයක් ලෙස මිස සේවා සපයන ස්ථානයක් ලෙස නොදකින හින්දු පූජකයන්ගේ ධනවාදී සහ, ප්‍රජාවේ සුබ සිද්ධිය වෙනුවෙන් කටයුතු නොකිරීම තුළින් පැන නගින තත්වයක් ලෙස ය. කෙසේ නමුත් ඉවැන්ජලික පල්ලි සම්බන්ධයෙන් ඔවුන්ගේ මූලික විරෝධය වූයේ හින්දුන් ට එල්ල කරන ආක්‍රමණයක් සේ දකින සහ, හින්දු අනන්‍යතාවයට අභියෝග කරමින් දේව රූප පාරට විසිකිරීම වැනි ගෞරවනීය නොවන පුරුදු ඔවුන් විසින් දිරිමත් කිරීමයි.

දෙණියායේ ආගම්වලට හරවා ගැනීම පිළිබඳ ගැටුම්වලින් වැඩි කොටස අභ්‍යන්තර ආගමික හෝ ක්‍රිස්තියානි-හින්දු ගැටළු බවට පත්ව තිබේ. කෙසේ නමුත් අනෙක් අතට, 2013 වසරේදී බොදු බල සේනාවේ අනුගාමිකයන් යැයි සලකන පිරිස් විසින් දේව සභාව (Assembly of God) වෙත සහ 2016 වසරේදී මෙතෝදිස්ත පල්ලියකට ප්‍රහාර එල්ල කර, දේපළ හානි කර, එහි සිටිවුන්ට පහර දී, තර්ජනය කර එහි සිටි පූජකවරුන් හා අනුගාමිකයන් විශාල පිරිසක් එම ගොඩනැගිල්ලෙන් කලහකාරී ලෙෂ එළවා දැමීම සිදු විය. බෞද්ධයන්ගේ මේ සම්බන්ධ සාධාරණීකරණය කිරීම, ක්‍රිස්තියානි පල්ලි විසින් මුළාව සහ අල්ලස් ලබාදීම මගින් අන්‍යාගම්කරණය කිරීම බවට පත්ව තිබෙන අතරවාරයේ, ක්‍රිස්තියානි පල්ලියේ නියෝජිතයෙක් මෙකී චෝදනා ප්‍රතික්ෂේප කරමින් සඳහන් කළේ පල්ලිය විසින් සේවා සැපයීම පමණක්

සිදුකළ බව ය. සදාචාර විරෝධී ලෙස ආගම්වලට හරවා ගත් බව ඔහු ප්‍රතික්ෂේප කළේය (රෝමානු කතෝලික නොවන පූජකවරයෙක්, 2018 මැයි 26).

## 2.4. කුල භේදය මත වෙනස්කොට සැලකීම් සහ අසමානතාවය

යාපනය සහ අම්පාර හින්දු සහ කතෝලික ප්‍රජාව යන දෙපිරිසම අතර, කුලය යනු සැඟවුණු සහ ප්‍රකටව කතා නොකරන, අභ්‍යන්තර-ආගමික සබඳතා සඳහා හේතුවන ගැටළුවකි. කුලය, පුද්ගලයන් සහ ප්‍රජාවන් අතර අවකාශ සහ සමාජ, සංස්කෘතික හා ආර්ථික භූමිකාවන් හි ධුරාවලියක් ඔස්සේ ස්ථානගත වේ. යාපනයේ හින්දු ප්‍රතිචාර දක්වන්නන් අතර කුලය සඳහන් වූයේ ආගමික විධික්‍රම හා චාරිත්‍ර වලට බලපාන සාධකයක් ලෙස වන අතර, කෝවිල් උත්සවවලදී ආහාර පිළියෙළ කිරීම සහ ඒවා බෙදාදීම වැනි නිශ්චිත ක්‍රියාවන් සිදුකිරීමට අඩු කුල තැනැත්තන්නට ඉඩ ලබානොදෙන්නක් ලෙස ය.

හින්දු කෝවිල් උත්සවවලදී අඩු කුල තැනැත්තන් හට අවකාශය සහ භූමිකා ලබා දීම ප්‍රතික්ෂේප කිරීම විසින් ගැටුම් ඇති කර තිබෙන්නේ, එක් අවස්ථාවක ඉහළ කුලයක දේවාල පරිපාලනයට එරෙහිව නඩු පවරා ඇති අතර, තවත් අවස්ථාවක අඩු කුල තැනැත්තන් හට කෝවිලට ඒමට ඉඩ ලබානොදීමට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ගවලට පිවිසෙමිනි. සිය පාරම්පරික පූජාස්ථාන (කුල කෝවිල්)වලට යාමට දැඩි ඇල්මක් දක්වන බව ප්‍රකාශ කළද, මෙවැනි තත්වවලදී අඩු කුල තැනැත්තන් විසින් විකල්පයක් ලෙස අලුත් කෝවිල් ඉදි කර තිබේ.

කුලය දමිළ කතෝලිකයන් අතර ද ගැටළුවක් වන අතර, එය විද්‍යාමාන වන එක් අවස්ථාවක් වන්නේ ඉහළ කුලයකට අයත් එක් පූජකවරයෙකු හට විශේෂ අධිකාරියක් ඇතැයි සලකනු ලැබීමයි. මේ හා සමානව, හින්දු ප්‍රජාව තුළ අඩු කුල පූජකවරුන් හට 'හීනකුල දෙවිවරුන්' සිටින පූජ්‍යස්ථාන වෙන් කර ඇති අතර, ඉහළ කුල පූජකවරුන් හට ශිව වැනි 'උසස්කුල දෙවිවරුන්'ගේ කෝවිල් වෙන් කර ඇත. කෙසේ නමුත් ප්‍රතිචාර දක්වන්නන් සඳහන් කළේ හින්දු පූජකවරුන් කුලය මත පදනම්ව වෙනස්කම්වලට ලක් නොකරන අතර, සියලු කෝවිල්වල පුද පූජා පවත්වන අතරවාරයේම, කුල භේදය පවත්වාගෙන යනු ලබන්නේ ආවතේවකරුවන්ගෙන් සමන්විත දේවාල පරිපාලනය කරන කණ්ඩායම් විසින් බව ය. ඔවුන් තවදුරටත් සඳහන් කළේ කුලය, යාපනයේ ගම්මානවල බොහෝ දුරට අනුදකින නමුත්, යාපන නගරයේ එයට එතරම් සැලකිල්ලක් නොදක්වන බවයි. දමිළ දේශපාලනඥයෙක් මේ මතයට සම්මාදම් වෙමින් පැවසුවේ දේශපාලන ලැබීම් සඳහා කුල ක්‍රමය ප්‍රාග්ධනකරණය කරන්නන් සිටින නමුත්, මහජන සබඳතාවලදී කුලය පදනම් කරගෙන වෙනස්කොට සැලකීම් සිදුනොකරන බවයි. ඔහු තවදුරටත් නිරීක්ෂණය කළේ කුල භේදය අනුදකින කුඩා සහ පවුල්වලට අයත් කෝවිල් පවතින නමුත්, යාපනයේ ප්‍රසිද්ධ කෝවිල් විසින් කිසිවිටෙක කුලය පදනම් කරගෙන සීමාවන් පනවන්නේ නැති බවයි.

පර්යේෂණ කණ්ඩායම විසින් සිදුකරන ලද නිරීක්ෂණයක් වූයේ කුලය පිළිබඳ ගැටළුව නගනුයේ පහළ කුලවල සාමාජිකයන් විසින් බවත්, එය ද, රැකියාවට බලපෑම් සහගත වන ප්‍රශ්නවලදී වනබවත් ය. ඉහළ කුලවලට අයත් ප්‍රතිචාර දක්වන්නන් එම ගැටළුව ඉවත දමනුයේ යාපනය තුළ කුලය ප්‍රශ්නයක් නොවන බව සඳහන් කරමිනි. ඒ හැරුණු විට, කුලය

ආගමික සබඳතාවලට පමණක් නොව, පාසල් වැනි සමාජ ආයතනවලට ද බලපෑම් ඇති කරවයි. ප්‍රතිචාර දක්වන්නන් කිහිප දෙනෙක් සඳහන් කළේ ගම්මානවල ඇතැම් පාසල් විසින් ශිෂ්‍යයන්ට එරෙහිව විවිධ වෙනස්කොට සැලකීම් සිදුකරන බවත්, ඔවුන්ගේ අවස්ථා සඳහා ප්‍රවේශය සීමා කරනු ලබන බවත්, එනමුත් මෙය, වඩාත් නාගරික ප්‍රදේශවල පිහිටා තිබෙන පාසල්වලට අදාළ තත්වය නොවන බවත් ය.

කුලය යනු, වාර්ගික ප්‍රජාවක් උවදුරුවලට පහසුවෙන් ලක් කරන සංසිද්ධියක් වන අතර, එය මුස්ලිම් වැනි සෙසු ප්‍රජාවන් විසින් (සවිඥානිකව හෝ අවිඥානිකව) ස්වකීය භූමි සීමාවන් විස්තීරණය කර ගැනීම සඳහා යොදාගනු ලබයි. අම්පාර මුස්ලිම් ප්‍රජාව, ඉහළ කුලවල දමිළයන්ගෙන් ඉඩම් මිලට ගැනීම අසීරු හෙයින් පහළ කුල දමිළයන්ට අයත් ඉඩම් මිලදී ගන්නා බව පැවසේ. කුලය, කතෝලික පල්ලියේ සිරිත් අතර වටහාගැනීමට අසීරු සියුම් ආකාරවලින් ගම්‍යමාන වන බව ද සඳහන් වූයේ, ඉහළ කුලවලට අයත් වූවන් විසින් පල්ලියේ පරිපාලනයේ ඉහළ තිලයන් දරණ බැවිනි. කෙසේ නමුත් පාදිලිවරයෙක් සඳහන් කළේ සියලුම දෙනා එකට වාඩි ගන්නා දේව මෙහෙයන්වලදී කුලය තීරණාත්මක සාධකයක් නොවන බව ය. මේ තත්වය යාපනය, මන්නාරම සහ අම්පාර යන දිස්ත්‍රික්කවල ද මේ හා සමාන අන්දමින් දැකගත හැකි විය.

## 2.5. භෞමික විස්තාරණයඃ ඉඩම ජනවාර්ගික-ආගමික ආධිපත්‍යයේ සංකේතයක් ලෙස

අධිපති භාවය යෙදවීමේ අර්ථයක් වශයෙන් භූමිය ප්‍රසාරණය කර ගැනීම හරහා එක් ජනවාර්ගික -ආගමික ප්‍රජාවක් විසින් (ඇතැම්විට ජනවාර්ගික-ආගමික අනෙකාට අයත්වන) ඉඩම් අයිති කර ගැනීම ද සුළුජාතික වාර්ගික කණ්ඩායම්වල අනාරක්ෂිත බවෙන් පැන නගින තරගකාරී කලාපීය ජනවාර්ගික-ආගමික ජාතිවාදයන්ගේ විද්‍යමාන වීමක් ද වේ. අම්පාර සහ මන්නාරම වෙසෙන තමන් සුළුතරය සේ තමන් විසින් සලකන මුස්ලිම් සහ බෞද්ධයන් සම්බන්ධයෙන් ද, උතුරු සහ නැගෙනහිර පළාත්වල දමිළයන් සම්බන්ධයෙන් ද, අම්පාර මුස්ලිම්වරුන් සම්බන්ධයෙන් මෙන්ම රජයේ සහ පුද්ගලික ඉඩම්වල හමුදා පවුල් පදිංචි වීම හරහා භූමිය ප්‍රසාරණය කරගන්නා යාපනයේ ද මෙය රාජ්‍යයේ මෙහෙයවීමෙන් සිදුකරනු ලබන කටයුත්තකි.

ඉඩම, අම්පාර දිස්ත්‍රික්කය තුළදී විශේෂයෙන්ම අන්තර්-ආගමික අසමගිය ඇතිවීමේ මූලාශ්‍රයකි. 2017 වසරේ දත්ත එක්රැස් කරන සමය වන විට ප්‍රචණ්ඩකාරී වීමේ විභවයක් පැවති අම්පාර මුස්ලිම්-බෞද්ධ සම්බන්ධතා, 2018 පෙබරවාරි - මාර්තු මාසය වන විට ප්‍රචණ්ඩකාරී තත්වයට පත්විය. මෙකී ආගමික ප්‍රජාවන් දෙක අතර සම්බන්ධතාවයට බලපෑම් ඇතිකරන ස්ථරීය සාධක ගණනාවක් තිබේ. එනම්, ප්‍රාදේශීය පරිපාලනයේදී මුස්ලිම් බලපෑම, දිස්ත්‍රික්කයේ සුළුතරය බෞද්ධයන් වන හෙයින් ඔවුන්ට දැනෙන අනාරක්ෂිතභාවය, සිංහල බෞද්ධ ජාතිවාදය, බෞද්ධ අන්තවාදී කණ්ඩායම්වල භූමිකාව සහ ජනවාර්ගික-ආගමික ප්‍රජාවන් දෙක අතර අන්තර්ක්‍රියාවන් අඩුකම වේ. බෞද්ධ ප්‍රජාව විසින් ආගම, කියාපාන හේතුව ලෙස දක්වමින්, කලාපයේ භූගෝලීය පාලනය විස්තාරණය කිරීමේ ඉලක්කය ඇතිව මුස්ලිම් ඉඩම් බලයෙන් අල්ලා ගැනීම සම්බන්ධයෙන් චෝදනා ලබන විට මෙකී සියලුම සාධකයන් විද්‍යමාන වේ.

බෞද්ධ අවකාශයන් ප්‍රසාරණය කිරීමේ මූලික අර්ථය ළඟා කර ගන්නේ සහ එය සාධාරණීකරණය කරන්නේ (වෙනත් ප්‍රතිපාදන අතර) පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවසහ රාජ්‍යය විසින් පූජාභූමි පනත හරහා, පුද්ගලික හිමිකාරිත්වය ඇති පූජා භූමි ඉඩම් යන තර්කය නගමිනි. අම්පාර මුස්ලිම් ප්‍රතිචාර දක්වන්නන් කියා සිටියේ ප්‍රජාවේ අනාරක්ෂිතභාවයන් යොදාගනිමින් මෙම පනත දේශපාලකයන් විසින් මුස්ලිම්වරුන්ට අයිති ඉඩම්, බෞද්ධ සංඝටකයන් තුළට අන්තර්ගත කර ගැනීම සඳහා පාවිච්චි කරන බවයි. එක් උදාහරණයක් වන්නේ බෞද්ධයන් විසින් මුස්ලිම්වරුන්ට අයත් ඉඩමක් පූජා භූමියක් බව කියා සිටි සාම්බුනගර් ය. තවත් සිද්ධියක් මුස්ලිම් ජාතිකයෙකුට අයත් ඉඩමක (අත්තනෝමතික ලෙස) ඉදිකර තිබූ ඉරයික්කමාම් හි ඉඩමක් පිළිබඳ ව ය. මෙම ගැටළුව 2017 වසරේ දත්ත එක්රැස් කරන කාලය වන විට බෞද්ධයන් සහ මුස්ලිම් ජාතිකයන් අතර ඇවෙන ප්‍රශ්නයක් බවට පත්ව තිබුණේය. මේ හා සමාන වට්ටමඩු හි තවත් ඉඩම් ප්‍රශ්නයක් නීතිමය ක්‍රියාමාර්ගයක් දක්වා ගියේය. කෙසේ නමුත් බෞද්ධ ප්‍රතිචාර දක්වන්නන් තර්ක කර සිටියේ දිස්ත්‍රික්කයේ බෞද්ධයන් සහ මුස්ලිම්වරුන් අතර සැලකිය යුතු තරමේ සහජීවනයක් පැවතියද මානික්කාමඩු (තවත් ගැටළුකාරී ප්‍රදේශයක්) හි ආගමික වන්දනාව සඳහා විහාරස්ථාන ඉදිකිරීමට සිංහලයන්ට ඉඩ ලබා නොදෙන බවයි. එහිදී සිංහලයන්ව මුස්ලිම් ප්‍රජාව විසින් විහාරයක් ඉදිකිරීමෙන් වළක්වා තිබිණි. ඔවුන් කියා සිටියේ මුස්ලිම්වරුන් සිංහල ගම්මානවල පල්ලි ඉදිකරන හෙයින්, මෙය අසාධාරණ බවයි.

පැරණි බෞද්ධ පුදබිමක් වන, දිස්ත්‍රික්කයේ මුස්ලිම් කොටසේ (අඩ්ඩාලචේන) පිහිටා තිබෙන දීඝවාපිය[15] අම්පාර දිස්ත්‍රික්කයේ බෞද්ධයන් සහ මුස්ලිම් ජාතිකයන් අතර ආරාවුල් ඇතිවීමට තවත් හේතුවකි. මුස්ලිම් කොට්ඨාසයක් වුවත් මෙහි බොහෝ සිංහලයන් පදිංචි වී සිටින්නේ, ඔවුන් අද්දලචේනෙයි දිසා ලේකම් කාර්යාලය විසින් පාලනය කරන කොටසක බව නොතකමිනි. දීඝවාපිය වෙත දිවෙන මාර්ග ද ඉදිකර තිබෙන්නේ සිංහල නම සහ අනන්‍යතාවය වන 'දීඝවාපිය' යන්න ප්‍රදේශය තුළ ජනප්‍රිය කිරීමේ උත්සාහය සමග අවට පිහිටා තිබෙන මුස්ලිම් ගම්මාන හරහා ය. ප්‍රදේශයේ ප්‍රධාන ගැටළුව දීඝවාපිය සහ මානික්කමඩු බව ද බෞද්ධ ප්‍රතිචාර දක්වන්නෝ සඳහන් කළහ. ඔවුන් තර්ක කළේ මුස්ලිම්වරුන් විසින් එය තමන්ට අයත් යැයි කියා සිටියත්, බෞද්ධ අනන්‍යතාවය සහතික කරන පුරාණ බෞද්ධ නටඹුන් එම ප්‍රදේශයෙන් හමුවී ඇති බව ය. ඔවුන් කියා සිටියේ එම ප්‍රදේශයේ ඇති බුද්ධ ප්‍රතිමා මුස්ලිම්වරුන් විසින් විනාශ කරමින් සිටින බව සහ, රජයේ නිලධාරීන් විසින් එයට මැදිහත්වන්නට ගන්නා උත්සාහයන්ට බාධා කරන බව ය. මේ ගැටළුව පිළිබඳ සලකා බැලීමට පන්සල විසින්, බෞද්ධ භික්ෂූන්ගේ නායකත්වයෙන් යුත් කමිටුවක් ද පිහිටුවා ඇත (ග්‍රාම සංවර්ධන සංසදයේ බෞද්ධ ස්ත්‍රීන් සහ පුරුෂයන්, 2017 මැයි 25).

මෙම ආගමික ප්‍රජාවන් දෙක අතර වෙනස් ආකාරයේ ගැටළුවක් ඇති වී තිබෙනුයේ, මුස්ලිම්වරුන් සඳහා සෞදි අරාබි රජය විසින් සැපයූ අරමුදල්වලින් ඉදිකළ නුරයිචෝලයේ හි සුනාමි නිවාස ක්‍රමය යටතේ නිවාස බෙදා හැරීම සම්බන්ධයෙනි. මෙම නිවාස, සිංහලයන් විසින් ඔවුන්ට හිමි යැයි කියාසිටීම මගින් මුස්ලිම්වරුන්ට නිවාස බෙදා දීම සිදුනොවුණු අතර එය නඩුවකට මග පෑදුවේය. අධිකරණයේ තීන්දුව වූයේ ප්‍රජාවන් ත්‍රිත්වය අතරම නිවාස බෙදා දිය යුතු බව ය. මෙම තීන්දුව තවමත් ක්‍රියාත්මක කර නැත.

15 දීඝවාපී ගැටළුවේ සවිස්තරාත්මක ඉතිහාසය සඳහා, බලන්න, දේවසිරි (2016)

මෙකී ආතතීන් නොතකා බෞද්ධ ප්‍රතිචාර දක්වන්නෝ අම්පාර දිස්ත්‍රික්කයේ සිටින සිංහල බෞද්ධයන් වශයෙන් ධනාත්මක ආකල්පයක් පළ කර සිටියහ. ඔවුන් පැවසුවේ, දිස්ත්‍රික්කයේ වෙනස් ජනවාර්ගික-ආගමික ප්‍රජාවන් යුද සමයේ මෙන් නොව සාමූහික ක්‍රියාකාරකම් වල නියැළෙන බව සහ, ජනයා අතර සහජීවනය පවතින බව ය. කෙසේ වෙතත්, තමන්ගේ ප්‍රධාන අන්තර්ක්‍රියාවන් පවතින්නේ දමිළයන් සමග බවත්, මුස්ලිම් ජාතිකයන් සමග පවතින අන්තර්ක්‍රියාවන් අවම බවත් ඔවුහු විශේෂිතව කියා සිටියහ. මේ බව, දමිළ ප්‍රජාව සමග වැඩි සම්බන්ධතා පවත්වාගත් දීඝවාපියෙන් පැමිණ සිටි බෞද්ධ කාන්තාවන්ගෙන් ද පැවසුණි. ''හින්දු අය අහිංසක ප්‍රජාවක්. යුද්ධයෙන් පස්සෙත් ඔවුන්ගෙ තත්වය ඉතාම නරකයි. තිරුක්කෝවිල් ප්‍රදේශයට ගියොත් ඔබට ඔවුන්ගේ ඉරණම දැකගන්න පුළුවන්. අපි සහ හින්දූන් අතර සමානකම් ගණනාවක් තිබෙනවා. අපි එකම දෙවියන් වඳිනවා. යුද්ධයට කලිනුත් අපි දෙපිරිස අතර ශක්තිමත් සම්බන්ධතා තිබුණා. කොහොම වුණත්, මුස්ලිම්වරුන් ඒකෙ අනික් පැත්ත. ඔවුන් ආත්මාර්ථකාමියි. ඒ වගේම ඉඩම් අයිතිකර ගන්න අනෙක් ප්‍රජාවන් එක්ක තරග කරනවා'' (ග්‍රාම සංවර්ධන සංසදයේ බෞද්ධ කාන්තාවක්, 2017 මැයි 15). සිංහලයන් විසින් දමිළයන් එක් කලෙක 'අනෙකා' ලෙස දුටු බව පෙන්වා දෙන මෙය, දමිළයන් සහ සිංහලයන් සුළුතරය වන අම්පාර දිස්ත්‍රික්කයේ ජනවාර්ගික-ආගමික සබඳතාවල සංකීර්ණත්වයට සහ සන්දර්භමය සුවිශේෂී බවට උදාහරණයකි.

භූමිය ප්‍රසාරණය කර ගැනීමේ බෞද්ධ-මුස්ලිම් ගැටුම සුළුතර ප්‍රජාවක් වශයෙන් බෞද්ධයන් ගේ අනාරක්ෂිත භාවයන්ගෙන් පැන නගින අතරවාරයේ, දමිළ-මුස්ලිම් සබඳතා, මුස්ලිම් ජනාවාසවල ක්‍රමික ප්‍රසාරණය පිළිබඳ ශ්‍රී ලංකාවේ උතුරු නැගෙනහිර පළාතේ මුස්ලිම් ප්‍රජාවගේ සුළුතර තත්වයට ආරෝපණය කළ හැකිය. කෙසේ නමුත් සිය භූමිය ප්‍රසාරණය කර ගැනීම සඳහා එම ප්‍රජාව විසින් භාවිතා කරන ක්‍රමෝපායයන්, බෞද්ධයන්ගේ ප්‍රවේශය මෙන් නොව, ප්‍රදේශයේ දමිළ ප්‍රජාවගේ සාපේක්ෂ දුප්පත්කමෙන් වාසි ලබාගැනීම වේ. අම්පාර දමිළ ප්‍රතිචාර දක්වන්නන් මුස්ලිම් ජනයාට චෝදනා කර සිටියේ සිය අවකාශයම සීමාවන්, වෙළඳපොළ වටිනාකමට වඩා විශාල වටිනාකමකින් යුක්ත මුදලක් දමිළ පුද්ගලයන්ට ලබාදීම මගින් ඔවුන් ඉඩම් මිලදී ගැනීමේ යෙදී සිටින බවට ය. එසේ හෙයින්, වරෙක දමිළයන්ගෙන් ජනාකීර්ණ වී තිබූ ගම්මාන මේ වන විට මුස්ලිම් ගම්මාන බවට පත්ව තිබේ. එයට එක් උදාහරණයක් වන්නේ දමිළ ප්‍රජාවගේ සුනාමි නැවත පදිංචි කිරීමේ ජනපදයක් වූ සින්නමුහතුවරම් ය. එය මේ වන විට මුස්ලිම් ප්‍රදේශයක් බවට පත්ව තිබෙන්නේ දමිළයන්ට මුදල් අවශ්‍ය වූ නිසා සහ ඔවුන් විසින් ඒවා මුස්ලිම් වැසියන්ට විකුණා ඇති නිසා ය. කුලය ද මෙම ඉඩම් ගැටළුවේදී වැදගත් කාර්යභාරයක් ඉටු කරනුයේ, ඉඩම කුල සබඳතාවල එක් වැදගත් සලකුණු කිරීමක් වන නිසා ය. සුනාමි නැවත පදිංචි කිරීමේ ප්‍රදේශය සැලකෙන්නේ පහළ කුල දමිළයන්ට අයත් ඉඩමක් මත ඉදිකළ එකක් ලෙස ය. ඒ අනුව මෙම ඉඩමේ පදිංචියට ඒමෙන් ඉහළ කුල දමිළයන් වැළකී සිටියහ. අනෙක් අතට, මුස්ලිම්වරුන් එවැනි ඉඩම්වලට ඉහළ මිලක් ලබාදී ඒවා මිලදී ගනිති. කෙසේ නමුත් දමිළ ප්‍රතිචාර දක්වන්නන් අවධාරණය කළේ යාපනයේ මෙන් අම්පාරේ කුලය යනු, වෙනස්කොට සැලකීමේ බරපතළ පදනමක් නොවන බවට ය.

දමිළ ඉඩම්වලට ප්‍රවේශය ලබාගැනීමේ තවත් ක්‍රමයක් වන්නේ අන්තර් විවාහ, සදාචාර නොවන ආගම්වලට හැරවීම සහ දේශපාලන බලපෑම් ය. අම්පාර දමිළ ප්‍රතිචාර දක්වන්නන් මුස්ලිම්

ජාතිකයන් සහ දමිළයන් අතර අන්තර් විවාහ දුටුවේ, දමිළ ඉඩම් ග්‍රහණය කර ගැනීම සඳහා හිතාමතාම කරන උත්සාහයක් ලෙසට ය. ඔවුහු සිය ප්‍රජාවේ සාමාජිකයන් මුස්ලිම් ආගමට හරවා ගැනීම විස්තර කළේ දැනටද පවතින ගැටළුවක් ලෙස ය. ඔවුන් සඳහන් කළේ, ඉස්ලාම් ආගමට හැරුණු හින්දු ජාතිකයන් 5-6 ක් පමණ අලයියදිවෙම්බු කොට්ඨාසයේ සිටින බව සහ, ඔවුන් විසින් මේ වන විට අනෙක් දමිළ පවුල් ද මුස්ලිම් ආගමට හරවමින් සිටින බව ය. මෙය, දමිළ ප්‍රදේශයක පල්ලියක් ඉදිකිරීම සඳහා මුස්ලිම් ප්‍රජාව විසින් ඇටවූ කුමන්ත්‍රණයක් ලෙසට ඔවුහු දුටුවහ.

අන්‍යාගම්වලට හැරීම සඳහා වැදගත් හේතුවක් ලෙස දුප්පත්කම ද අවධාරණය කෙරිණි. ''දමිළයන් සඳහා ආරක්ෂිත ජීවනෝපායන් හෝ වෙළඳපොළක් නැහැ. ඒ නිසා මුස්ලිම්වරුන් විසින් හින්දූන්ට ආර්ථික ලැබීම් හෝ රැකියා අවස්ථා ලබාගැනීම පිණිස ආගමට හැරීම දිරිමත් කරනනවා" (හින්දු ජාතික රජයේ නිලධාරියෙක්, 2017 මැයි 24). එසේම එල්ටීටීඊ සංවිධානයෙන් ගැළවීම පිණිස ඇතැම් දමිළයන් ඉස්ලාමය වැළඳගත් බව ද මෙහිදී සඳහන් කෙරිණි.

අම්පාර දිස්ත්‍රික්කයේ භූගෝලීය ප්‍රසාරණය දේශපාලන බලපෑම් හරහා ද ළඟා කර ගැනේ. මුස්ලිම්වරුන් විසින් ප්‍රබල දේශපාලකයෙකු සිය වාසිය සඳහා යොදාගැනීමට එක් උදාහරණයක් වන්නේ දමිළ කොට්ඨාසයේ පවුල් 34 ක්, මුස්ලිම් කොට්ඨාසයේ සීමාව ප්‍රසාරණය වන පරිදි ගැසට් කරවා ගැනීම මගින් ඔවුන් දැන් මුස්ලිම් කොට්ඨාසයට අයත් වන බව ප්‍රකාශ කිරීමයි. ප්‍රතිචාර දක්වන්නන් සඳහන් කළේ එපමණ දේවල් සිදුවන්නට ඉඩ තිබෙනුයේ දිස්ත්‍රික්කයේ දමිළ ජාතිකයන් දේශපාලනික වශයෙන් දුර්වල හෙයින් බවයි. ක්‍රිස්තියානි සහ හින්දු යන දෙපිරිසම, තමන් මුස්ලිම් ජාතිකයන්ව පිළිගැනීමට සූදානම් නැති බව පැවසුවේ, ප්‍රධාන හේතුව වශයෙන් ඉඩම් ආරාවුල් සහ ඔවුන් විසින් දමිළ ඉඩම් අත්පත් කරගැනීම දක්වමිනි.

අධිපතිභාවය අරමුණු කරගෙන භූමිය ප්‍රසාරණය කිරීම මේ අනුව විදහා දක්වන්නේ බහුතරය සහ සුළුතරය අතර අනාරක්ෂිතභාවයේ පරතරය මත ප්‍රතිඵල වන්නක් ලෙස ය. රටෙහි බහුතරය වන බෞද්ධයන් විසින් අම්පාර දිස්ත්‍රික්කයේදී සිය සුළුතර තත්වයෙන් ප්‍රතිචාර දක්වන අතර, අම්පාරේදි බහුතරය වන මුස්ලිම් ජාතිකයෝ උතුරු නැගෙනහිර දමිළයන්ට එරෙහිව ප්‍රතිචාර දක්වන්නේ සිය සුළුතර තත්වය තුළ ය. ඉඩම මේ ප්‍රජාවන් ද්විත්වයටම අධිපතිභාවය සඳහා අරමුණු වන නමුත්, ඉඩම් වෙළඳපොළ මෙහෙයවීම/පෙරළියට ලක් කිරීම, සමාජමය වශයෙන් (අන්තර්විවාහ), නීතිමය වශයෙන් (පූජා භූමි පනත) සහ එක් එක් ජනවාර්ගික-ආගමික ප්‍රජාවේ දේශපාලන ප්‍රබලත්වය මත එය සමානුපාතික වේ.

## 2.6. ඉඩම සහ හිමිකම: පශ්චාත් යුධමය සලකා බැලීම්

දශක තුනක් පැවති ශ්‍රී ලංකාවේ වාර්ගික යුද්ධය සහ අවතැන් වීමේ ආකාරයන් ගණනාවක් විසින් පශ්චාත් යුධමය කාලය තුළ ද ජනවාර්ගික-ආගමික ප්‍රජාවන් අතර ඉඩම පිළිබඳ ආරාවුල් ප්‍රතිඵල කරයි. උතුරෙන් 1990 වසරේදී එල්ටීටීඊ සංවිධානය විසින් මුස්ලිම්වරුන් පළවා හැරීමට නියෝග කිරීම ප්‍රතිඵල කළ වාර්ගික යුද්ධයේ ඉතිහාසය පිළිබඳ සලකා බැලීමෙන් තොරව මන්නාරමේදී ඉඩම් ප්‍රසාරණය වීමේ ගැටළුව පිළිබද සාකච්ඡා කළ නොහැකිය. මේ සිදුවීම නිසා මුස්ලිම් ප්‍රජාවට සිය ඉඩම් සහ දේපළ අත්හැර දැමීමට සිදුවූ අතර, ඇතැම් අවස්ථාවල

ඔවුන්ට සිය දමිළ අසල්වාසීන්ගේ සරණ යාමට සහ, තමන්ට ආපසු ඒමට හැකි නොවනු ඇතැයි විශ්වාසය හේතුවෙන් සිය ඉඩම් දමිළයන්ට විකිණීමට සිදුවිය. මන්නාරමට නැවත පැමිණි විට සහ යාපනයේදී පවා ඔවුන්ගේ භූමිය ක්‍රමිකව ප්‍රසාරණය වීම, බහුතර දමිළ ප්‍රජාව අතර අනාරක්ෂිත බව පිළිබඳ හැඟීම් අවුළුවාලීය.

මන්නාරම දිස්ත්‍රික්කයේ කතෝලික දමිළයන් සහ මුස්ලිම් ජාතිකයන් අතර සම්බන්ධතාවය වසර ගණනාවක් මුළුල්ලේ පරිණාමනයට ලක්ව ඇත්තේ වාර්ගික අර්බුදයේ දෝංකාරය සමග වන අතර, උතුරු පළාතෙන් මුස්ලිම් ජාතිකයන් නෙරපීම විසින් ප්‍රජාවන් දෙක අතර වත්මනෙහි පවතින සබඳතාවලට බලපෑම් සිදුකරමින් තිබේ. එක් ප්‍රධාන තොරතුරු සපයන්නෙකුට අනුව, අතීතයේදී (එනම්, නෙරපා හැරීමට පෙර) අන්තර් ආගමික සහ ජනවාර්ගික සහජීවනය මන්නාරමේ සාමාන්‍ය තත්වය වූ අතර, නිදහසින් පසු ශ්‍රී ලංකාවේ පක්ෂ දේශපාලනයට පවා එය බිඳ දැමිය නොහැකි විය (හින්දු පූජකවරයෙක්, 2018 අප්‍රේල් 14). එල්ටීටීඊ ය විසින් උතුරෙන් මුස්ලිම්වරුන් නෙරපා හැරීම සැලකෙන්නේ එම ප්‍රජාවන් දෙක අතර සැලකිය යුතු භේදයක් නිර්මාණය කළ හැරවුම් ලක්ෂ්‍යයක් ලෙස ය.

මෙයට පෙරාතුව මුස්ලිම් ජාතිකයන් සහ දමිළයන් අතර සම්බන්ධතාවය ''අයියලා සහ මල්ලිලා'' අතර සබඳතාවයට සමාන වූයේ, මුස්ලිම් ජාතිකයෙක් වරදක් කළ අවස්ථාවකදී මුස්ලිම් ප්‍රජාවේ කිසිදු කැළඹීමක් ඇති නොවන පරිදි ඔහුට ප්‍රසිද්ධියේ දඬුවම් කිරීමට හැකි පරිදි ය (කතෝලික ක්ෂේත්‍ර නිලධාරියෙක්, 2017 මාර්තු 6). මෙකී ප්‍රතිසමතාවයෙන් යෝජනා කරන්නේ 'දාරක/සහෝදර' මිත්‍රත්වයක් එම ප්‍රජාවන් දෙක අතර 1990 දශකයට පෙර යුගයේ මන්නාරමේ පැවති බව පමණක් නොව, කතෝලික දමිළ ප්‍රජාවේ ජනගහනයේ විශාලත්වය මත විවාදාත්මක ලෙස පදනම් වූ ධූරාවලි සම්බන්ධයක් ද පැවති බව ය.

යුද්ධයෙන් පසු මුස්ලිම්වරුන් මන්නාරම වෙත ආපසු පැමිණෙන විට ආර්ථිකය සහ දේශපාලන තත්වය පැවතියේ කතෝලික-මුස්ලිම් සබඳතා සහ දිස්ත්‍රික්යේ හින්දු-මුස්ලිම් සබඳතා මත පවා රඳා පවතිමිනි. හින්දු සහ කතෝලික ප්‍රතිචාර දක්වන්නන්ගේ හැඟීම වූයේ මන්නාරම වෙත ආපසු පැමිණි මුස්ලිම්වරුන්ගේ සංඛ්‍යාව, පෙර පැවති ප්‍රමාණයට සාපේක්ෂව ඉහළ බව ය. එපමණක් නොව, ප්‍රබල දේශපාලකයෙකුගෙන් ඔවුන් ලබන දේශපාලන අනුග්‍රහය ප්‍රජාවන් දෙක අතර භේදය ඇති කරයි. කතෝලික ප්‍රතිචාර දක්වන්නන් දෙදෙනෙක් පළ කළ මතය වූයේ, සිය පුද්ගලික දේශපාලන වාසිය සඳහා ප්‍රජාවන් ද්විත්වය අතර ගැටුම් අවුළුවාලමින් සිටින්නේ මෙකී දේශපාලඥයා විසින් බවයි.

මේ අනුව, දමිළ/කතෝලික-මුස්ලිම් සබඳතාවල ප්‍රධානතම සාධකය වන්නේ ඉඩම් ප්‍රශ්නය සහ මුස්ලිම් ජනගහනයේ වර්ධනයයි. විශ්‍රාමලත් හින්දු වෛද්‍ය නිලධාරියෙක් දමිළ සහ මුස්ලිම් උපත් අනුපාතික අතර වෙනස පිළිබඳ සිය කණස්සල්ල පළ කළ අතර, ඔහු සඳහන් කළේ ඉක්මනින්ම මුස්ලිම් ජාතිකයන් විසින් දමිළයන්ගේ සංඛ්‍යාව ඉක්මවනු ඇති බවයි (හින්දු වෛද්‍ය නිලධාරියෙක්, 2017 මාර්තු 6). මුස්ලිම් ජාතිකයන් අතර ජනගහනයේ වැඩිවීම (විසි වසරක කාල පරිච්ඡේදයක් තුළ ස්වභාවිකව සිදුවූවක් යැයි තර්ක කළ හැකි) ද, වැඩිපුර ඉඩම් අවශ්‍යවීම කෙරෙහි මෙහෙයවිය හැක. එක් අතකින්, එක්තරා මුස්ලිම් දේශපාලඥයෙක් විසින් සිය බලය යොදාගෙන කැලෑ ප්‍රදේශ එළිපෙහෙළි කරමින් මුස්ලිම් පවුල් නැවත පදිංචි කරන බව

පැවසුණු අතර, එය දිස්ත්‍රික්කයේ පල්ලි සංඛ්‍යාව ඉහළ යාමට හේතුවිය. මුස්ලිම්වරුන් විසින් කියා සිටියේ තමන් ප්‍රදේශයෙන් පළා යන විට පැවති ඉඩම්, ආපසු පැමිණෙන විට කතෝලික පල්ලිය විසින් අල්ලාගෙන තිබුණු බවයි. මෙමගින් ආරාවුල් ගණනාවක්, විශේෂයෙන්ම මායිම් ගම්මානවල ඇති විය.

උදාහරණයක් වශයෙන්, මේ වන විට කතෝලික සහ මුස්ලිම් ගම්මාන බවට පිළිවෙළින් පත්ව ඇති යාබද ගම්මාන දෙකක මේ ආරාවුල දැකගත හැකිය. මෙකී එකිනෙකට සම්බන්ධිත ගම්මාන දෙක, මුස්ලිම් ඉඩමක් යැයි කියන ස්ථානයක ඉදිකර ඇති කතෝලික පල්ලියක් සම්බන්ධයෙන් ගැටුම් අත්විඳිමින් සිටියි. මෙම ගැටළුව සංකීර්ණ කරමින් ප්‍රජාවන් ද්විත්වය විසින්ම විසංවාදී තර්කයන් කිහිපයක් ගෙන එන ලදී. කතෝලික ප්‍රජාවේ තර්කය වූයේ මුස්ලිම් ජනයා විසින් එම ඉඩම තමන්ගේ යැයි කියමින් හිමිකම කියාපාන්නේ ප්‍රදේශයේ කතෝලික ජනගහනය අඩු වී මුස්ලිම් ජනගහනය වැඩි වී ඇති හෙයිනි. මුස්ලිම් ප්‍රජාව කියා සිටින්නේ ප්‍රශ්නගත ඉඩම, මුස්ලිම්වරුන් ව නෙරපා හැරීමෙන් පසුව එල්ටීටීඊ යේ බලපෑම අනුව ඉදිකළ කතෝලික පල්ලියක් බව ය. කතෝලික පාර්ශවයෙන් මෙයට ප්‍රතිවිරුද්ධව තර්ක ගණනාවක් නැගුණු අතර, ඒවායේදී සඳහන් වූයේ එම ඉඩම මූලිකවම කතෝලිකයන්ට අයත්ව තිබූ බව සහ, කතෝලිකයන් විසින් මුස්ලිම් ප්‍රජාවට සොහොන් බිමක් සේ භාවිතා කිරීමට ඔවුන් විසින් ඉඩ දී තිබූ බවත්, මුස්ලිම්වරුන් විසින් 2004-2007 අතර කාලයේදී තමන්ට ආපසු පැමිණ පදිංචි වීමේ අවස්ථාවක් නැතැයි හැඟී ගිය හෙයින් තමන්ගේ ඉඩම් විකුණූ බවත් ය. තවද ඇතැම් මුස්ලිම් වැසියන් ඉන්දියාවට පළා ගොස් තිබුණේ, සිය ඉඩම් විකිණීම සඳහා ඥාතීන්ට ඇටෝර්නි බලය පවරමිනි. මෙකී සාධක මන්නාරමේ දමිළ-මුස්ලිම් සම්බන්ධතාවලට සංකීර්ණත්වය එක් කළේය.

මුස්ලිම් ප්‍රතිචාර දක්වන්නන් සඳහන් කළේ, කතෝලික ගම්මානය, කඩ සාප්පු සහ තැපැල් කන්තෝරුව සඳහා මුස්ලිම් ගම්මානය සමග සම්බන්ධ වන බවත්, මේ තනි ප්‍රශ්නය හැරුණු විට ප්‍රජාවන් දෙක අතර වෙනත් ගැටුමක් නොමැති බවත් ය. කිසිදු ගැටුමකින් හෝ ආරවුලකින් තොරව ආගමික ප්‍රජාවන් දෙක අතර දෛනික අන්තර්ක්‍රියා පවත්වමින් දීර්ඝ කාලයක් මුළුල්ලේ පවත්වාගෙන යන කතෝලික පාසලක්ද මුස්ලිම් ගම්මානය තුළ වේ. කෙසේ වෙතත්, ඇතැම් කතෝලික ප්‍රතිචාර දක්වන්නන් සඳහන් කළේ, දේව මෙහෙයන්වලදී මුස්ලිම් ජාතිකයන් විසින් දේවස්ථානයට ගල් ප්‍රහාර එල්ල කර ඇති බවත්, මහ හඬින් සංගීතය වාදනය කරමින් දේව මෙහෙයන්ට බාධා කර ඇති බවත්, එනමුත් අධිකරණය විසින් ඉඩම් හිමිකාරිත්වය සනාථ කිරීමෙන් අනතුරුව එවැනි ප්‍රචණ්ඩ ක්‍රියා හීන වී ඇති බවත් ය.

ඉඩම පිළිබඳ ආරාවුල් හේතුවෙන් සිවිල් යුද්ධය සමයේ දමිළ ගම්මාන සමහරක් අතහැර දැමීමට සිදුවූයේ අවතැන් වීම්වල ද ප්‍රතිඵලයක් ලෙස ය. කතෝලික ප්‍රතිචාර දක්වන්නන් සඳහන් කළේ අවතැන් වීමේ ප්‍රතිඵලයක් වශයෙන් එරුක්කලම්පිඩ්ඩි නමැති ගම්මානයක් මුස්ලිමුන් විසින් අත්පත් කර ගත් බව සහ, මේ වන විට එය මුස්ලිම් ගම්මානයක් බව ය. ප්‍රතිචාර දක්වන්නන් කියා සිටියේ එම ගම්මානයේ කෝවිලක් ඇති බව සහ, වැඳුම් පිදුම් කටයුතු සඳහා එම කෝවිල භාවිතා කිරීමට ඔවුන් තමන්ට ඉඩ ලබානොදෙන බව ය. තවත් ගම්මානයකින් පැමිණ සිටි කතෝලික ප්‍රතිචාර දක්වන්නන් ද, සිය දේවස්ථානයට සම්බන්ධිතව මුස්ලිම් පල්ලියක් ඉදිකිරීම සම්බන්ධයෙන් සිය නොසතුට පළ කර සිටියහ.

අවතැන්වීම, ඉඩම් හිමිකම පිළිබඳ ආතතිය සහ වන්දනා මාන කිරීම සඳහා ආගමික ස්ථානවලට ප්‍රවේශය පිළිබඳ ගැටළුවල ප්‍රතිඵල වශයෙන් දමිළ ගම්මාන මුස්ලිම් ගම්මාන බවට මෙසේ පරිණාමනය වීම් සිදුව තිබෙන්නේ දේශපාලන අතපෙවීම් මෙන්ම යුද්ධයේ ද ප්‍රතිඵලයක් ලෙස ද වන අතර, අවතැන් වීම විසින් මන්නාරම ප්‍රජාවන් අතර ගැටුම් අවුළුවා තිබේ.

මන්නාරමේ ගැටුම තනි මුස්ලිම් පුද්ගලයන් සහ කතෝලික පල්ලිය අතර සිදුවන්නක් වන විට, යාපනයේ ගැටුම මුස්ලිම් ප්‍රජාව සහ උතුරු පළාත් සභාව අතර වේ. මුස්ලිම් සහ දමිළ ප්‍රජාව අතර පවතින ආතතීන්ගෙන් එකක්, නැවත පදිංචි කරවීම හා සම්බන්ධ ය. ප්‍රධාන තොරතුරු දැනුම් දෙන්නෙකුට අනුව, එල්ටීටීඊ ය විසින් මුස්ලිම් ජාතිකයන්ට ඉවත් වන ලෙස නියෝග කරන අවස්ථාවේදී යාපනයේ මුස්ලිම් පවුල් 4300 ක් පමණ වූහ. එම පවුල්වලට අවසර ලැබුණේ එක් පවුලකට රුපියල් 500 ක් රැගෙන යාමට පමණි. මෙවැනි පවුල් ගණනාවක් පුත්තලම, මීගමුව සහ පානදුර සරණාගත කඳවුරුවලට පැමිණියහ. ඔවුන් 2002 වසරේදී යාපනයට නැවත පැමිණීම ආරම්භ කළ අතර, වර්තමානය වන විට යාපනයේ මුස්ලිම් පවුල් 700 ක් සහ මුස්ලිම් පල්ලි 13 ක් වේ (මුස්ලිම් මව්ලවිවරයෙක්, 2017 මාර්තු 8). ප්‍රතිචාර දක්වන්නන් සඳහන් කළේ ඉන්දියාව විසින් අරමුදල් සැපයූ හෝ දේශීය නිවාස ක්‍රමවලට රජයේ නිලධාරීන් විසින් මුස්ලිම්වරුන්ව අන්තර්ග්‍රහණය කර නොගත් බව ය. පවුල් 700 අතරින් පවුල් 60කට පමණක් ඉන්දියානු නිවාස යෝජනා ක්‍රමය යටතේ නිවාස ලබාදුන්නේය (මුස්ලිම් මව්ලවිවරයෙක්, 2017 මාර්තු 9). එපමණක් නොව, මුස්ලිම් ප්‍රතිචාර දක්වන්නන් සඳහන් කළේ, දෙමළ ජාතික සන්ධානය විසින් කරුණු සොයා නොබලා දමිළයන්ගේ පැත්ත ගත් බව ය. තමන් ට අත්හැර දැමීමට බල කළ ඉඩම්වල අයිතිය නැවත කියා පෑමේදී ද මුස්ලිම්වරු ගැටළුවලට මුහුණ දුන්හ. උදාහරණයක් වශයෙන්, ඔවුන් පොම්මවේලි හි නැවත පදිංචි වීම් ආරම්භ කළ විට දිසාපති කාර්යාලය එයට ඉඩ ලබා නොදුන්නේ එම ඉඩම කුඹුරු ඉඩමක් බව පවසමිනි. එක් ප්‍රතිචාර දක්වන්නෙක් සඳහන් කළේ මුල් මුස්ලිම් හිමිකරුවන් වෙත ඉඩම් ආපසු ලබාදීමේ ප්‍රශ්නය, ප්‍රසිද්ධ රැස්වීම්වලදී නොසලකා හැරුණු බව ය (මුස්ලිම් මව්ලවිවරයෙක්, 2017 මාර්තු 9). කෙසේ නමුත් දමිළ දේශපාලඥයෙක් සඳහන් කළේ යාපනයේ දමිළයන් සහ මුස්ලිම්වරුන් අතර ගැටළු නැති බවත්, ප්‍රශ්න ඇති කරන්නේ දිස්ත්‍රික්කයෙන් පිටත සිටින මුස්ලිම් නායකයන් විසින් බවත් ය. ඇතැම් මුස්ලිම් ජාතිකයන් සිය ඉඩම් හා කඩ සාප්පු විශාල මුදලකට විකුණා ඇති බවත්, ඉන්පසුව එම ඉඩම් නැවත ඉල්ලා සිටීම වැරදි බවත් ඔහු තවදුරටත් සඳහන් කළේය. මුස්ලිම්වරුන් නැවත පදිංචි කරවීමට යාපනයේ කිසිවෙක් විරුද්ධත්වය පළ නොකරන බව ද ඔහු වැඩිදුරටත් කියා සිටියේය. ''අපිට අවශ්‍ය වන්නේ නියම යාපනය මුස්ලිම්වරුන්'' යැයි ඔහු පැවසුවේ, යාපනයෙන් පිටස්තර මුස්ලිම් නායකයන් විසින් දේශාපාලන වාසි ලබාගැනීම පිණිස ප්‍රශ්නවලින් අයුතු ප්‍රයෝජන ගන්නා බව සඳහන් කරමිනි (හින්දු දේශපාලකයෙක්, 2017 මාර්තු 9). මුස්ලිම් ප්‍රතිචාර දක්වන්නන් සඳහන් කළේ 1990 වසරට පෙරාතුව යාපනය තුළ තමන් විසින් ද්‍රවිඩයන් සමග යහපත් සම්බන්ධතාවන් තබාගත් බව ය. මුස්ලිම්වරුන් නෙරපා හැරීම මගින් මෙකී ප්‍රජාවන් දෙක අතර භේදයක් නිර්මාණය කර තිබෙන අතරම, ඔවුන් අතර සම්බන්ධතාවය නැවත ගොඩනැංවී නොමැත. නැවත පදිංචි කිරීමේ ගැටළුව සහ ඉඩම් සඳහා වන්දි ගෙවීමේ ගැටළු විසින් ප්‍රජාවන් ද්විත්වයම ආතතියට හසුකර තිබේ.

## 2.7. රැකියා නියුක්තිය සඳහා ප්‍රවේශය සහ රාජ්‍ය ප්‍රතිලාභ : සමානාත්මතාවය ඉල්ලා සිටීම්

කලාපීය ජාතිවාදය සහ ජනවාර්ගික-ආගමික බහුතරවාදය, දේශපාලනික සහ ආගමික නායකන් විසින් ප්‍රවර්ධනය කළා පමණක් නොව, එය සියලු රාජ්‍ය සහ කලාපීය ආයතන ව්‍යූහයන් වෙත ද පැතිර තිබේ. මේ අනුව, ආගම සහ වාර්ගිකත්වය පදනම් කරගෙන වෙනස්කොට සැලකීම්වලට ලක් කිරීම යන ද්විත්වයම අපේක්ෂා කළ යුතු වන අතර, යම් නිශ්චිත අවස්ථාවලදී සුළුතර ප්‍රජාවන් විසින් ඒවා අත්විඳ තිබේ.

මන්නාරමෙන් පැමිණ සිටි සියලු ප්‍රතිචාර දක්වන්නන් හඟවා සිටියේ දිස්ත්‍රික්කයේ අන්තර්-ආගමික ගැටුමේ කේන්ද්‍රස්ථානය/හදවත දේශපාලනය සහ දේශපාලකයන් බවයි. දේශපාලන අනුග්‍රාහකත්වය හේතුවෙන් අසමානතාවයන් ගණනාවක් පැන නැගී ඇත. එනම්, සකාත්[16] වශයෙන් අරාබි රටවලින් ලැබෙන අරමුදල්වලින් මුස්ලිම්වරුන්ට මුසලි, මුරුන්ගන්, විල්පත්තු සහ හලාවත මාර්ගය දෙපස පිහිටි සිය ඉඩම් ප්‍රසාරණය කර ගැනීමට හැකියාව ලබාදී තිබිණි. මෙයට අනුගාමීව මුස්ලිම් ගම්මාන ව්‍යාප්ත වීමේදී නව පල්ලිද ඉදිවිය. එපමණක් නොව, මෙකී ගම්මානවල පාසල් ඉදිකිරීම මගින් මුස්ලිම් දේශපාලකයන් යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට මුදල් යොදවන බව ද මෙහිදී සඳහන් විය. ඒ අනුව, මන්නාරම දිස්ත්‍රික්කයට සම්බන්ධිතව එයට යාබදව මුස්ලිම් නොවන නොදියුණු ගම්මාන පවතින අතරවාරයේ තැනින් තැන සංවර්ධනය වූ කුඩා කොටස් ද පවතියි (කතෝලික සිවිල් සමාජ ක්‍රියාකාරිනියක්, 2017 මාර්තු 6).

මුස්ලිම් ප්‍රජාවේ සාමාජිකයන්ට රජයේ පත්වීම් ලබාගැනීමට හැකි කිරීම සඳහා බලපෑම් සහගත මුස්ලිම් දේශපාලනඥයන් විසින් සිදුකරන ඥාති සංග්‍රහය සහ අනිසි අනුග්‍රහයන් ද මන්නාරමේ දමිළ ප්‍රතිචාර දක්වන්නන් විසින් නගන ලද තවත් ගැටළුවක් විය. එහිදී ඔවුන් සඳහන් කළේ සිය අයිතිවාසිකම් අහිමි වී ඇති බව තමන්ට හැඟෙන බව ය. කෙසේ වෙතත්, මුස්ලිම් ප්‍රතිචාර දක්වන්නන් සඳහන් කළේ මුස්ලිම් දේශපාලඥයන් විසින් දමිළ ගම්මානවලට උදව් කිරීම සඳහා ලැබෙන මුදල් ද පාවිච්චි කරන බව ය. එහිදී ඔවුන් උතුරු පළාත් සභාවට මේ සම්බන්ධයෙන් චෝදනා කළේ රජයේ රැකියා ලබාදීම්වලදී මුස්ලිම්වරුන් වෙනස්කොට සැලකීම්වලට ලක් කරන බවට ය. මෙයට විලෝම වශයෙන්, කතෝලිකයන් පැවසුවේ, මුස්ලිම් ජාතිකයන් අමාත්‍ය ධූර මට්ටමේ සිටීම හේතුවෙන් බලපෑමට නතුව සිටින්නේ තමන් බවයි. දෙපාර්ශවයම විසින් නගන ලද වින්දිතභාවය පිළිබඳ මෙම කාරණය, දමිළ ජාතිකයන් සහ මුස්ලිම් ජාතිකයන් ගේ අන්තර්ක්‍රියාවන්ට සහ ඔවුන්ගේ සබඳතා ප්‍රතික්ෂේප වී යාමට එක් පදනමක් වන බවයි.

මන්නාරමේ හින්දූන් සහ කතෝලිකයන් අතර ඇති ආරවුල සම්බන්ධයෙන් එක් වැදගත් කාරණයක් වන්නේ පාලනය සහ තීරණ ගැනීම සම්බන්ධයෙන් කතෝලික පල්ලිය විසින් දරනු ලබන ප්‍රබල භූමිකාවයි. ඒ අනුව පරිපාලනමය තීන්දුවලදී තමන්ගේ අභිලාෂයන් සැලකිල්ලට නොගන්නා බවට හැඟීමක් හින්දූන් අතර මෙන්ම ඉවැන්ජලික ක්‍රිස්තියානි ජනතාව අතරද වේ. හිටපු අදරදගුරු රායප්පු ජෝසප් පියනම වෙනුවට මන්නාරම පාලනයට සහ දේශපාලනයට

16 ඉස්ලාමයේ එක් මූලික අංගයක් වන යමෙකුගේ ආදායමෙන් පුණ්‍ය කටයුතු සඳහා පරිත්‍යාග කළ යුතු කොටස

එතරම් ලැදි කමක් නොදක්වන ලයනල් එම්මානුවෙල් ප්‍රනාන්දු බිෂොප්තුමා පත් කරනු ලැබුවද, සමාන්‍ය මතය වන්නේ දිස්ත්‍රික්කය පරිපාලනය කිරීමේදී සෑම අංගයක් කෙරෙහිව කතෝලික පල්ලියට විශාල බලපෑමක් කළ හැකි බව ය. එපමණක් නොව, හින්දු පූජකවරයෙක් සඳහන් කළේ, මන්නාරම නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් බහුතරය කතෝලිකයන් යන බව සහ, සෑම අයෙකුටම සමාන ලෙස සලකන බවට ඔවුන් තර්ක කර සිටියද, ඔවුන් පැත්තක් ගන්නා බවයි (හින්දු පූජකවරයෙක්, පුද්ගලික සන්නිවේදනයක් හරහා, 2017 මාර්තු 6). මේ අධිකාරිය සඳහා හින්දු ප්‍රතිචාර දක්වන්නන් විසින් සඳහන් කළ එක් උදාහරණයක් වන්නේ හින්දු උත්සව සමයේ කෝවිල්වලින් බැනර් ප්‍රදර්ශනය කිරීමේදී ඒ සඳහා පොලිසියෙන් අවසර ලබාගත යුතු වීමයි. නිසි ලෙස සම්පූර්ණ කරන ලද ලිපි ලේඛන සමග කෝවිල් බලධාරීන් පොලිසියට ගිය විට ඔවුන් දැනගත්තේ, ප්‍රබල කතෝලිකයෙකු විසින් ඒ වන විටත් කෝවිලේ බැනර් සහ කටවුට් ප්‍රදර්ශනය කිරීමට එරෙහිව නියෝගයක් ලබාගෙන තිබෙන බව ය. ඒ අනුව කෝවිල, මෙම නියෝගයට පිටුපා කටයුතු කිරීමට අසමත් විය.

මේ හා සමානව ක්‍රිස්තියානි (රෝමානු කතෝලික නොවන) ප්‍රජාවද, සිය නව දේවස්ථාන ස්ථාපනය සඳහා අනුමැතිය ලබාගැනීමේදී ඇති බාධක, පාසල්වල රෝමානු කතෝලික නොවන ආගමික උපදේශනයන් වෙත ප්‍රවේශ වීමට ඇති බාධා (ආගමික අධ්‍යාපනය යටතේ වෙනම විෂයක් වශයෙන් වන්ගලායි හි එක් පාසලක් ඇතුළු පාසල් හතරක් හැර සියලු පාසල්වල 'රෝමානු කතෝලික නොවන' විෂයක් හඳුන්වා දී තිබුණද) සහ, ගම්මානයක සංවර්ධනය සඳහා දායක වී තිබූ රෝමානු කතෝලික නොවන ධර්ම ප්‍රචාරකයන්ට කතෝලික පල්ලිය සහ එහි වසම්වාසීන් විසින් සිදුකරන බාධාව වැනි තමන් අත්දුටු ගැටළු පිළිබඳ කතා කළහ. උදාහරණයක් වශයෙන්, ජීවනගර් හි කතෝලික පල්ලිය සහ එහි වසම්වාසීන් විසින් එවැනි පුද්ගලයෙකුට ගෞරව කිරීම පිණිස විශාල පුවරුවක් සවිකිරීම වළක්වා තිබිණි (රෝමානු කතෝලික නොවන පාදිලිවරයෙක්, 2017 මාර්තු 7).

රෝමානු කතෝලික නොවන ප්‍රජාවේ සාමාජිකයන් විසින් මුහුණ දෙන තවත් ගැටළුවක් වූයේ ආයතනයික මට්ටමේදී ඔවුන්ව රෝමානු කතෝලික කාණ්ඩයට උපග්‍රහණය කිරීමයි. එසේ හෙයින්, රෝමානු කතෝලික නොවන පාදිලිවරයෙක් සඳහන් කළේ ආණ්ඩුවේ රැස්වීම් සහ උත්සව අවස්ථාවලදී ප්‍රජාව නියෝජනය කිරීමට තමන්ට ඇරයුම් නොලැබෙන බව ය. මේ අනුව, කතෝලික පූජකවරුන්, හින්දු කුරුක්කල්වරුන් සහ මුස්ලිම් මව්ලවිවරුන් ට ආරාධනා ලැබුණ ද රෝමානු කතෝලික නොවන පූජකවරුන්ට එවැනි අවස්ථාව සඳහා ඇරයුම් නොලැබේ. දිස්ත්‍රික්කය තුළ එකිනෙකට වෙනස් ක්‍රිස්තියානි නිකායන් අන්තර්ග්‍රහණය සම්බන්ධයෙන් දැනුවත්වීමේ අවශ්‍යතාවය මෙයින් යෝජනා කරයි.

අම්පාර මුස්ලිම් ප්‍රජාවගේ දේශපාලනික සහ පරිපාලන බලපෑම් හේතුවෙන් තමන්ව අනිසි අයුරින් පාලනය වන බවට අම්පාර දමිළ ප්‍රජාව ද සිය මතය ගෙන හැර දැක්වූහ. දමිළ ප්‍රතිචාර දක්වන්නන් සඳහන් කළේ, උගත් දමිළයන් හට රජයේ රැකියා ලබාගැනීම අසීරු වී තිබෙන්නේ දේශපාලන සම්බන්ධතා මත ඒවා මුස්ලිම්වරුන්ට ලබාදෙන නිසා බවයි. දිස්ත්‍රික්කයේ නීතීඥවරුන්, විනිසුරුවරුන් සහ පොලිස් නිලධාරීන්ගෙන් බහුතරය මුස්ලිම් ජාතිකයන් බවත්, ඒ අනුව සැලකීම්වල සාධාරණත්වයක් නොමැති බවත්, මුස්ලිම් පොලිස් නිලධාරීන් තමන්ට ගෞරවනීය ලෙස නොසලකන බවත් ඔවුහු සඳහන් කළහ. මෙයට විලෝම

වශයෙන් මුස්ලිම් ජාතිකයන් සඳහන් කළේ, විශේෂයෙන්ම ඉහළ පෙළේ පරිපාලන තනතුරු සඳහා වන රැකියා අවස්ථා සම්බන්ධයෙන් තමන්ව වෙනස්කොට සැලකීම්වලට ලක් වන බව ය. මුස්ලිම් ප්‍රතිචාර දක්වන්නන්ට අනුව, (පළාතේ සුළුතරය වන) ඉහළ පෙළේ පරිපාලන රැකියා ලබන්නේ දමිළ ජාතිකයන් පමණි. විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ශිෂ්‍යයන් තෝරාගන්නා විට වෙනස්කොට සැලකීමක් නොමැති වුවත්, රැකියාවලට තෝරාගැනීමේදී මුස්ලිම්වරුන් වෙනස්කොට සැලකීම්වලට ලක් වන බව ද ඔවුහු සඳහන් කළහ. ඔවුන් අනුමාන කළේ රැකියා අවස්ථා, ප්‍රදේශයේ වාර්ගික අනුපාතිකය අනුව ප්‍රදානය කළ යුතු බවයි. ප්‍රජාව විසින් දැක්වූ මෙකී එකිනෙකට පරස්පර විරෝධී මතයන් විසින් යෝජනා කරන්නේ එක් අතකින්, ප්‍රජාවන් දෙක අතර කතිකාවේ හීනතාවය නිසා වැරදි ආකල්ප ඇතිවන බව සහ, අනෙක් අතින්, අසමානතාවය දැනෙන/ප්‍රත්‍යක්ෂ වන ආකාරය අනුව ප්‍රජාවන් එකිනෙකාගෙන් දුරස් වන බව ය.

බෞද්ධයන් සහ හින්දූන් අතර වන පොදු ආගමික භාවිතාවන් නොතකා, ප්‍රතිචාර දක්වන්නන් සඳහන් කළේ, හින්දු ප්‍රජාව ප්‍රධාන වශයෙන්ම දෙණියාය රජයේ නිලධාරීන්ගේ එදිරිවාදිකම්වලට ලක් වන බව ය. ඒ, හින්දු කෝවිලකට සම්බන්ධිත හිස් ඉඩමක් පොදු ක්‍රීඩාංගනයක් වශයෙන් භාවිතා කිරීම ලෙස සහ බෝ ගසක් සමග බුද්ධ ප්‍රතිමාවක් එම පරිශ්‍රයේ ස්ථාපනය කිරීම සමග ය. නිතර එම ක්‍රීඩාංගනය සිංහල තරුණයන් විසින් භාවිතා කිරීම දැක්වුණේ හින්දු කෝවිලට බාධා කිරීමක් සහ එහි ක්‍රියාකාරකම් සහ බුද්ධ ප්‍රතිමාවක් ස්ථාපනය කිරීම මගින් රජයේ නිලධාරීන්ගේ අනාගත අරමුණු ගැන ද සැකකටයුතු තත්වයක් උපදවා තිබිණි. දෙණියායේ බෞද්ධයන් සහ හින්දූන් හැමවිටම එකිනෙකා සමග ගැටෙනවුන් නොවිණි. හින්දු ප්‍රතිචාර දක්වන්නන් සඳහන් කළේ හින්දු කෝවිල් උත්සවයේ පළමු පූජාව බෞද්ධ පන්සලක පවත්වනු ලැබූ 1983 වසරට පෙර කාලයේදී දෙණියායේ බෞද්ධයන් සහ හින්දූන් අතර සමගියක් පැවති බව ය. වාර්ගික අරගලය, ගම්මානවල බොදු බල සේනා, දේශපාලනය සහ කෝවිලට නොව ක්‍රීඩාංගනයට මුදල් ලබාදුන් ආණ්ඩුවේ ජාතිවාදී මුදල් වෙන්කිරීම වැනි කාරණා හේතුවෙන් මෙම සබඳතා පිරිහී ගිය බවට ප්‍රතිචාර දක්වන්නෝ තර්ක කර සිටියහ (අන්තර්-ආගමික කමිටුවේ සාමාජිකයන්, හින්දු සහ ක්‍රිස්තියානි ස්ත්‍රීන් සහ පුරුෂයන්, 2018 මැයි 26).

## 2.8. ආයතනගත වර්ගවාදය සහ සුළුතර ප්‍රජාවන්ට අයත් ආයතන ග්‍රහණය කර ගැනීම

ගාල්ල මූලික කරගෙන ක්‍රියාත්මක වන දකුණු පළාත් සභාවේ අධ්‍යාපන දෙපාර්තමේන්තුව සිය සම්ප්‍රදායික මුස්ලිම් පාසලක්, සිංහල උප විදුහල්පතිවරුන් සහ සිංහල ගුරුවරුන් පත්කිරීම මඟින් සිංහල පාසලක් බවට හැරවීමට උත්සාහ කරන බව පවසමින් මාතර දිස්ත්‍රික්කයේ මුස්ලිම් ප්‍රතිචාර දක්වන්නියන් කණ්ඩායමක්, භූමිය ප්‍රසාරණය කරගැනීමේ තවත් ආකාරයක් පිළිබඳ මත පළ කළහ. ඔවුන්ට එය ප්‍රත්‍යක්ෂ වී තිබුණේ පාසල තුළ බෞද්ධ වැඳුම් පිදුම් ආරම්භ කිරීමේ කුමන්ත්‍රණයක් ලෙස ය. මුස්ලිම්වරුන්ගේ ගෘහ භාෂාව දමිළ වුවද, අමාත්‍යාංශය විසින් දමිළ ගුරුවරයෙකු එම පාසලට පත් කර නැත. මුස්ලිම් උපාධිධාරී ගුරුවරුන්ට ද පත්වීම් ලබාදී නැති අතර, මේ ගැටළුව සම්බන්ධයෙන් නඩු පැවරී තිබේ. සම්ප්‍රදායික මුස්ලිම් ආයතයක් රාජ්‍ය අමාත්‍යාංශයක් විසින් මේ අන්දමින් අනුයෝජනය කිරීම මගින් ජනවාර්ගික-

ආගමික නියෝජනයේ අසමානතාවය සහ රාජ්‍ය අමාත්‍යාංශවල ආයතනගත ජාතිවාදය විදහා දක්වයි. මෙය, මෙම ආයතන ඉදිකරනු ලැබුවේ හා සංවර්ධනය කරනු ලැබුවේ ජනවාර්ගික-ආගමික සුළුතරයන් බව නොසලකා හැරීමට සහ ඒවා මකා දැමීමට මුල්විය හැකිය.

මෙබඳු ජාතිවාදයක් අධ්‍යාපන ක්‍රමය තුළ සිටින පුද්ගලයන් වෙත ද දීර්ඝ වී පවතින බව මෙන්ම මුස්ලිම් ප්‍රතිචාර දක්වන්නියන් සඳහන් කළ තවත් කාරණයක් වූයේ, ඇතැම් පුද්ගලයන් සිය ඇඳුම (හිජාබය) පිළිකුල් කරන බව සහ, ''ඇයි ඔබ සාරියක් නොඇඳින්නේ?'' යනුවෙන් විමසන බව ය. මාතර සිංහල පාසල්වල මුස්ලිම් ශිෂ්‍යාවන්ට මුස්ලිම් ඇඳුම (හිසේ පළඳින සළුව) පැළඳීමට ඉඩ නොදෙන බවට ද, ක්‍රීඩාවන්හිදී පවා ශරීරය ආවරණය වන ඇඳුම් ඇඳිය නොහැකි බවටද ඔවුහු පැමිණිලි කළහ (මුස්ලිම් කාන්තා කණ්ඩායමක සාමාජිකාවක්, 2017 ජූනි 18). දෙණියායේ ප්‍රතිචාර දක්වන්නියන් ද දමිළයන් සහ සිංහලයන් අතර භේද ඇති කරවන බවටත්, ඉතාම ළාබාල අවධියේදී ජාතිවාදය කාවද්දන බවටත් පෙන්වා දෙමින් අධ්‍යාපන පද්ධතියේ ජාතිවාදී ස්වභාවය ගැන අදහස් පළ කළහ. ගුරුවරුන් සහ රජයේ නිලධාරීන් අතර ජාතිවාදය ද මේ සඳහා දායක වන සාධයක් බව පෙනේ.

මෙයට විලෝම වශයෙන් වැලිගමෙන් පැමිණ සිටි බෞද්ධ ප්‍රතිචාර දක්වන්නන් සඳහන් කළේ, අමාත්‍යාංශවල සිටින දමිළයන් සහ මුස්ලිම්වරුන් විභාගවලදී තමන්ගේ ප්‍රජාවේ අයට වැඩි සැලකීම් සිදුකරන බවයි. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඔවුන් රජයේ ඉහළ තනතුරු ගණනාවක් හොබවන බවයි.

## 2.9. ආර්ථික සහ ව්‍යාපාරික පසමිතුරුකම

ආර්ථිකය දිස්ත්‍රික්ක හතරෙහිම ජනවාර්ගික-ආගමික සබඳතා සම්බන්ධයෙන් ස්වාධීන සාධකයක් වන නමුත්, අම්පාර සහ මාතර දිස්ත්‍රික්කවලදී මෙහි බලපෑම කැපී පෙනේ. අම්පාර දිස්ත්‍රික්කය තුළ දුප්පත්කම දමිළයන් සහ මුස්ලිම්වරුන් අතර සම්බන්ධතාවලට බලපෑම් ඇතිකරන සුවිශේෂී සාධකයක් විය. මේ ප්‍රජාවන් ද්විත්වය, සමාන ලෙස නමුත් එකිනෙකට පරස්පර ලෙස සිය සම්මුඛ සාකච්ඡාවලදී එහි බලපෑම විස්තර කළහ. දමිළ ප්‍රතිචාර දක්වන්නන් සඳහන් කළේ මුස්ලිම් ගෘහයන් හි සහ ව්‍යාපාර කටයුතුවල නිරත වී සිටින බොහෝ දමිළ ජාතිකයන් සිටින අම්පාර දිස්ත්‍රික්කයේදී දමිළයන් මුස්ලිම් ජාතිකයන්ට සාපේක්ෂව දිළිඳු බව ය. ඔවුන් කියා සිටියේ එමගින් දමිළ කාන්තාවන් ලිංගික අපයෝජනයන්ට ලක් වන බව, අල්ලස දූෂණය ප්‍රතිඵල වන බව සහ, මුස්ලිම් ජාතිකයන්ගේ නින්දිත හා කාමුක බස් යොදාගනිමින් හින්දු තාරුණ්‍යයට බලපෑම් කරන බව ය. ඔවුන් තවදුරටත් සඳහන් කළේ මුස්ලිම්වරුන් වඩා ප්‍රබල මෙම දිස්ත්‍රික්කය තුළදී යුද්ධය විසින් දමිළ ජාතිකයන්ව ආර්ථිකමය සහ දේශපාලනික යන දෙයාකාරයෙන්ම අඩපණ කර ඇති බව ය. මෙයට විලෝම වශයෙන් මුස්ලිම් ප්‍රතිචාර දක්වන්නන් සඳහන් කළේ එල්ටීටීඊය ඩයස්පෝරාව හරහා යොදවන මුදල් මගින් මුස්ලිම්වරුන්ට ප්‍රශ්න ඇතිකිරීමෙන් පසු දමිළයන් ධනවත් වූ බව ය. දමිළයන් විසින් පළ කළ අදහස් ප්‍රජාවට හැඟෙන දේ බව පෙනුණු අතර, මුස්ලිම්වරුන්ගේ මතය උතුරු සහ නැගෙනහිර පළාත්වල දමිළ ප්‍රජාව සම්බන්ධයෙන් මුස්ලිම් ප්‍රජාව තුළ පවතින පොදු නිරීක්ෂණය විය. මෙකී ප්‍රත්‍යක්ෂයන් විසින්, ඉඩම් සම්බන්ධයෙන් සුළු ගැටුම් පැවතියද එම ප්‍රජාවන් දෙක අතර කිසිදු විශාල ගැටුමක් විද්‍යාමාන නොකළේය.

කෙසේ නමුත් මුස්ලිම්-සිංහල සබඳතා මාතර දිස්ත්‍රික්කය තුළ ආර්ථිකමය සලකා බැලීම් සඳහා විශාල බලපෑමක් සිදුකරයි. මුස්ලිම් ප්‍රතිචාර දක්වන්නියන් සඳහන් කළේ මාතර නගරය තුළ ජනවාර්ගික-ආගමික ගැටළු නොමැති බවයි. කෙසේ නමුත් මුස්ලිම් විරෝධී මතයන් මූලික වශයෙන් සම්බන්ධ වූයේ ව්‍යාපාරික පසමිතුරුතාවය කෙරෙහි ය. මෙකී පසමිතුරුතාවයන්, බෞද්ධයන් විසින් ෆැෂන් බග් වැනි මුස්ලිම් සාප්පුවලින් භාණ්ඩ මිලට නොගැනීම වැනි ඊර්ෂ්‍යාව මත පදනම් වූ ඒවා විය. ඔවුන් සඳහන් කළේ මුස්ලිම්වරුන් එහි ප්‍රතිඵලයක් ලෙසට පාඩු ලබන අතර, එයට ප්‍රතිචාර වශයෙන් තමන් ද සිංහල කඩ සාප්පුවලින් භාණ්ඩ මිලට නොගන්නා බවයි. එපමණක් නොව, මුස්ලිම් ව්‍යාපාරවලට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් ස්ත්‍රීන් සඳහන් කළේ මුස්ලිම් කඩයක් නිරාහාර උපවාස සමය අතරතුර පුළුස්සා දැමූ විට කිසිදු ක්‍රියාමාර්ගයක් නොගත් බවයි. එය, උපවාස සමය කඩාකප්පල් කිරීම සඳහා සැලසුම් කළ ක්‍රියාවක් බවට ද ඔවුහු මත පළ කළහ.

මුස්ලිම් ප්‍රජාවට එරෙහි මෙවැනි එදිරිවාදීකමක් මුස්ලිම්වරුන්ගේ 'වෙළඳපොළ' තුළ පිහිටා තිබෙන භූමි ව්‍යාප්තියේ සිටින සිංහල ප්‍රජාව අතර බිය ඇතිකිරීමට දායක විය හැකිය. විශාල මුස්ලිම් සංකේන්ද්‍රණයක් දැකගත හැකි වැලිගම සිටින බෞද්ධ ප්‍රතිචාර දක්වන්නන් සඳහන් කළේ, මුස්ලිම්වරුන් උපායශීලී ලෙස සිංහලයන් පොදු වෙළඳ ස්ථානවලින් පළවා හරිමින් සිටින බව සහ, සිය මස්කඩ ව්‍යාප්ත කරමින් සිටින බව ය. නගර සභා පරිපාලනය ද මුස්ලිම්වරුන්ට පක්ෂග්‍රාහී බවත්, නගරාධිපතිවරයා මුස්ලිම් ජාතිකයෙකු වන හෙයින් සිංහලයන්ව වෙනස්කොට සැලකීම්වලට ලක් කරන බවත් බෞද්ධ ප්‍රතිචාර දක්වන්නෝ විශ්වාස කළහ. නගරයේ ඉතිරි වී තිබෙන්නේ සිංහල කඩ සාප්පු කිහිපයක් පමණක් බවත්, එබඳු උත්සාහයන් පිටුපස 'මේ රට අල්ලා ගැනීමේ' නොපෙනෙන බලයක් ඇති බවටත් ඔවුහු සිය කණස්සල්ල පළ කළහ. ඔවුන් අනුමාන කළේ වසර දෙකක් ඇතුළත නගරයේ කිසිදු සිංහල කඩයක් නොමැති වනු ඇති බවත්, වැලිගම නගරයේ සිංහලයන් වේගයෙන් දුර්වල වෙමින් සිටින බවත්, එය දැනටමත් මුස්ලිම්වරුන්ගේ පාලනය යටතේ පවතින බවත් ය. ප්‍රතිචාර දක්වන්නන්ට අනුව, මුස්ලිම් ප්‍රජාවේ උපාය මාර්ගය වූයේ, තුන් ආකාරයකින්"මේ භූමිය අල්ලා ගැනීම" (වැලිගම/ශ්‍රී ලංකාව) යි. එනම් ඉඩම්, ජනගහනය සහ ආර්ථිකය යන ආකාර තුනෙනි. කෙසේ වෙතත්, සිංහලයන් සිය අලස කම හේතුවෙන් වැඩ නොකරන බවට ස්වයං විවේචනයක යෙදුණු ඔවුහු, මෙය, මුස්ලිම් ව්‍යාපාරවලට පහර දීමට හේතුව නොවිය යුතු බවත් සඳහන් කළහ (අන්තර් ආගමික සංසදයේ බෞද්ධ ස්ත්‍රීන් සහ පුරුෂයන්, 2017 ජූනි 17).

දෙණියායේදී ප්‍රකට වූ මෙකී භූමිය, ජනගහනය සහ ආර්ථිකය අල්ලා ගැනීම සම්බන්ධයෙන් පවතින ඉහත සඳහන් කළ බිය මගින් මුස්ලිම් 'ජමාත්' (ආගම දේශනාකරන) ක්‍රියාකාරකම්, පල්ලියට පරිබාහිර ගොඩනැගිලි ප්‍රසාරණය සහ මුස්ලිම්වරුන් විසින් ව්‍යාපාර ආරම්භ කිරීමේදී තනි බෞද්ධයන් සහ භික්ෂූන් විසින් පමණක් නොව, සමස්තයක් වශයෙන් බෞද්ධ ප්‍රජාව විසින් ද බාධා සිදුකරනු ලැබේ. මෙයට එක් උදාහරණයක් වන්නේ බොදු බල සේනාව සහ එහි ආධාරකරුවන් විසින් 2018 වසරේදී ගම්මානයේ මුස්ලිම් ව්‍යාපාර බලහත්කාරයෙන් වසා දැමීම සහ ඒ වෙනුවට බෞද්ධ ව්‍යාපාරිකයෙකු එහි ස්ථාපිත කිරීමයි. ලිපි හරහා පුද්ගලික සන්නිවේදනයන් සිදුකිරීම මගින් මුස්ලිම් වැසියන් වඩාත් සියුම් ක්‍රමවලින් බිය වැද්දවීම ද සිදුකරන ලදී.

# 3. අන්තර් ආගමික ගැටුම: දිස්ත්‍රික්ක පදනම් කරගත් විශ්ලේෂණයක්

## 3.1. මන්නාරම

පෙර කොටසේදී සිදුකරන ලද මන්නාරමේ අන්තර්-ආගමික සම්බන්ධතා පිළිබඳ සාකච්ඡාව පෙන්වා දෙන්නේ අන්තර්-ආගමික ගැටුම යනු බලය, කතෝලිකයන් අතර පවතින බහුතරවාදයේ ආකල්ප, මුස්ලිම්වරුන් අතර පවතින හිමිකම පිළිබඳ හැඟීම, සහ හින්දූන් සහ ක්‍රිස්තියානින් අතර පවතින (අවකාශමය සහ සංකේතීය ලෙස) ස්වකීය ආගමික අනන්‍යතා නිශ්චය කර ගැනීමට අදාළ සම්බන්ධතා මත පදනම් වන බව ය. එපමණක් නොව, ජනවාර්ගික -ආගමික අනන්‍යතාවය මත පදනම් ව සම්පත්, සංවර්ධනය අසමාන ලෙස බෙදී යාම සහ යුක්තියට පවතින ප්‍රවේශයේ අසමානත්වය (පිළිබඳ හැඟීම) ද ආගමික ප්‍රජාවන් එකිනෙකාට එරෙහිව කටයුතු කිරීමට හේතු වෙයි. මෙකී අසමානතාවයන් මන්නාරම දිස්ත්‍රික්කය තුළදී සුවිශේෂී වූ අනන්‍ය විදහා පෑමක් සිදුකරන්නේ ස්වකීය වූ අනන්‍යතාවයක් සහිත අවකාශයක් ලෙස ය. බෞද්ධ පන්සල් පිළිබඳ ගැටළුවේදී එය, ජනවාර්ගික-ආගමික 'අනෙකා' (කතෝලික සහ හින්දු)ගේ අවකාශයන් පශ්චාත් යුධ න්‍යායපත්‍රය තුළ සිතාමතාම බෞද්ධාගමිකරණය කිරීමේ මහා කතිකාව ගෙන එයි. කෙසේ නමුත් එබඳු බෞද්ධාගමිකරණයක්, ආගමික අවකාශයක අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා යුද්ධයෙන් පසු ස්වභාවික ප්‍රතිඵලයක් වශයෙන් බෞද්ධ සොල්දාදුවන් තමන් ස්ථානගත වී සිටින කඳවුරු අසල සිය පුද්ගලික වන්දනාමාන කටයුතු පිණිස විහාරස්ථාන ඉදිකිරීමක් යනුවෙන් විකල්පීය ලෙස ද දැකිය හැකිය.

මෙකී අවකාශමය සහ සාපේක්ෂ සාධකවලට අමතරව සඳහන් කළ යුතු වැදගත් කාරණයක් වන්නේ විශේෂයෙන්ම දමිළ සහ මුස්ලිම් ප්‍රජාවන් අතර මෙන්ම දමිළ සහ බෞද්ධ ප්‍රජාවන් අතර ද අන්තර්-ආගමික ආතතීන් උග්‍ර කිරීම සම්බන්ධයෙන් දේශපාලන ධාතුන්ගේ සහ ආගමික නායකයන්ගේ භූමිකාවයි. සියලුම ප්‍රතිචාර දක්වන්නන් සඳහන් කළේ සාමාන්‍ය පුරවැසියන් අතර සිය අන්‍යාගමික සගයන්ට එරෙහිව එදිරිවාදීකමක් නොමැති බවත්, සහජීවනය සාමාන්‍ය තත්වය මිස ව්‍යාතිරේඛය නොවන බවත් ය. කතෝලික සහ මුස්ලිම් දේශපාලනඥයන්, සිය දේශපාලන වාසි සඳහා ආගමික ප්‍රජාවන් අතර ප්‍රධාන ගැටුම් අවුළුවන්නන් ලෙස හඳුනා ගැනිණි. එපමණක් නොව, කතෝලික, හින්දු සහ මුස්ලිම් ආගමික නායකයන් ද ස්වකීය ආගමික ප්‍රජාවන් සම්බන්ධයෙන් විශාල බලපෑමක් ඇති කරන අය සේ සඳහන් විණි. එහිදී ජනතාවගේ ඡන්දය ප්‍රකාශ කරන ආකාරයට බලපෑම් කිරීමට පමණක් නොව, නීති උල්ලංඝනය කිරීම සහ කොල්ලකෑම් වැනි ක්‍රියාවන් සිදුකිරීම සඳහා ඔවුන්ව කුපිත කිරීමට ද ඔවුන්ට පුළුවන. තරුණ පූජකයන්ගේ උද්‍යොගිමත් බව සහ ඔවුන්ගේ දේශනා ද ඒ ඒ ප්‍රදේශවල ගැටුම් පැන නැගීමට හේතුවක් සේ සඳහන් විය. එක් ප්‍රතිචාර දක්වන්නෙක් ඉන්දීය රජයට ද බැණ වැදුණේ (ඔහුගේ වචනවලට අනුව 'මෝදිගේ ආණ්ඩුව) යාපනයට බලපෑම් කිරීම සම්බන්ධයෙනි. එහිදී ඔහු, මන්නාරම දිස්ත්‍රික්කයේ ස්ථාපිත කර ඇති ගණ දෙවි (ගනේෂ) ප්‍රතිමා ඉන්දියාවෙන් ලබාදුන් බවට චෝදනා කළේ එය උතුරේ තමිල්නාඩු දේශපාලනය ප්‍රවර්ධනය කිරීම සඳහා යොදාගත් උපායමාර්ගයක් ලෙස සලකමිනි.

## 3.2. යාපනය

යාපනයේදී ආගමික වෙනස්කමට වඩා වාර්ගික වෙනස්කම, ජනවාර්ගික-ආගමික සම්බන්ධතා සඳහා ප්‍රධාන සාධකය බවට පත්ව තිබුණේ උතුරේ යුද්ධය සහ පශ්චාත් යුධ හමුදාකරණය තුළින් මූලික ගැටුම පැන නගිමිනි. බෞද්ධ කොඩි එසවීම හරහා සිංහල බෞද්ධ ජාතිවාදය සංකේතීය ලෙස යොදාගැනීම, උතුරේ හමුදා පවුල් නැවත පදිංචි කරවීම සහ දමිළ අවකාශයන් ග්‍රහණය කරමින් බෞද්ධ පන්සල් ඉදිකිරීම යන සාධක විසින් දේශපාලනික වශයෙන් බලවත් බවෙන් අඩු දමිළ ප්‍රජාව එදිරිවාදී කර තිබේ. 90 දශකයේදී උතුරුකරයෙන් මුස්ලිම් ප්‍රජාව නෙරපා හැරීමෙන් පැන නැගුණු ඉඩම් ගැටළු විසින් ද උතුරුකරයට පිටස්තර මුස්ලිම් දේශපාලනඥයන් උතුරු පළාත් සභාවේ ගැටළුවලට බලපෑම් කිරීම ද විසින් මෙහි දමිළ මුස්ලිම් සම්බන්ධතා අර්ථ දැක්වේ. කුලය පිළිබඳ සමාජ-සංස්කෘතික අංගයෙන් හින්දූන් අතර සහ ඇතැම්විට කතෝලිකයන් අතර ද, භාවිතාවේදී අසමානතාවයන් විසින් සහ දබර, එදිරිවාදීකම් සහ තනි පුද්ගල මට්ටමේදී අප්‍රියකම් වලට මගපාදන ආගමික ක්‍රියාකාරකම් හේතුවෙන් ශුද්ධ වශයෙන්ම ආගමික ආතතීන් නිරුක්තිය ලබයි. හින්දූන් ඉවැන්ජලික පල්ලි විසින් අන්‍යාගම්වලට හරවා ගැනීම ද ප්‍රශ්නකාරී ලෙස සැලකුණත්, ඒවා හින්දු ප්‍රජාව විසින් දරා ගනු ලැබිණි.

එසේ හෙයින්, යාපනයේ ජනවාර්ගික-ආගමික සබඳතා දේශපාලනික, කලාපීය සහ ගැඹුරට මුල් බැසගත් සංස්කෘතික මතිමතාන්තර විසින් හැඩගන්වනු ලබන අතර, ඒ ද්විත්වයම අධිපතිත්වය සහ ධූරාවලි සබඳතා ස්ථාපිත කිරීම හා පවත්වාගෙන යාම සඳහා ක්‍රියාත්මක වේ.

## 3.3 අම්පාර

අම්පාරේ මුස්ලිම් ප්‍රතිචාර දක්වන්නන් දැරූ මතය වූයේ දේශපාලනඥයන්, නීතිය නිසි පරිදි ක්‍රියාත්මක නොවීම සහ අන්තර්ජාතික කුමන්ත්‍රණ එම දිස්ත්‍රික්කයේ අන්තර්-ආගමික ගැටුම සඳහා හේතු වන බවයි. නෝර්වේ සහ ඊශ්‍රායලය සමග සම්බන්ධතා ඇතැයි කියනු ලබන බොදු බල සේනාව මුස්ලිම්වරුන්ට එරෙහි අන්තර්ජාතික න්‍යායපත්‍රයක් මත කටයුතු කරන බවට විශ්වාස කෙරිණි. එපමණක් නොව, අන්තර්-ආගමික ගැටළු සම්බන්ධව මුස්ලිම්වරුන් විසින් සිය අයිතිවාසිකම් කථාකිරීම ආරම්භ කරන අවස්ථාවල බොදු බල සේනාව ඔවුන්ගේ එකී ඉල්ලා සිටීම් අනෙක් පසට හරවමින් ප්‍රචණ්ඩත්වය නිර්මාණය කරයි.

ආණ්ඩුව අභ්‍යන්තරයේත් ඉන් පිටතත් මුස්ලිම්වරුන්ට විරුද්ධව ජාතිවාදී දේශීය ආයතන ගණනාවක් ක්‍රියා කරමින් සිටින බව ද ප්‍රතිචාර දක්වන්නෝ සඳහන් කළහ. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මේ සම්බන්ධයෙන් විශේෂයෙන් චෝදනා ලැබුවේ මුස්ලිම්වරුන්ට එරෙහිව ක්‍රියා කරමින් මුස්ලිම් ඉඩම් බලහත්කාරයෙන් අල්ලා ගන්නා බවට ය.

ජනවාර්ගික-දේශපාලන පක්ෂ යනු වෙනස් ආගමික හා වාර්ගික කණ්ඩායම්වල හඬ වන්නේ වුවද, ආගමික ආතතීන් ඇතිකිරීමට ඒවා හේතු වන බවට ප්‍රතිචාර දක්වන්නන් සැක පළ කළේ එකී දේශපාලන පක්ෂවල සබඳතා (ඒවායේ ස්වභාවය) හේතුවෙනි. ප්‍රතිචාර දක්වන්නන් විශ්වාස කළේ අන්තර්-ආගමික ආතතිය උසිගැන්වීම මෙකී එකිනෙකට වෙනස් දේශපාලන

පක්ෂ විසින් අනුගාමිකයන් ඒකරාශි කිරීම පිණිස සිදුකරන කුමන්ත්‍රණයක් ද විය හැකි බවට ය. තනි පුද්ගල දේශපාලඥයන්, විශේෂයෙන්ම මානික්කමඩු බුද්ධ ප්‍රතිමාව සම්බන්ධයෙන් මුස්ලිම්වරුන්ට එරෙහිව ප්‍රශ්න නිර්මාණය කිරීමට දායක වූහ.

මුස්ලිම්වරුන් අතර සිටින ජිහාඩ් කල්ලි පිළිබඳ දූෂමාන ආරංචි සහ ප්‍රවෘත්ති ද අන්තර්-ආග මික ගැටුම සඳහා හේතු සේ සඳහන් විනි. ඇතැම් බෞද්ධ ප්‍රතිචාර දක්වන්නන්ගේ මතයන් ද ප්‍රවෘත්ති සහ මාධ්‍ය විසින් හැඩගන්වා තිබිණි. සහජීවනය සඳහා වන බාධක ලෙස ඔවුන් සඳහන් කළ දේ අතර, නීති ක්‍රියාත්මක නොවීම, අවිශ්වාසය සහ ඉඩම් ප්‍රශ්න විය. ප්‍රදේශයේ දේශපාලකයන් සහජීවනය ගැන කතා නොකිරීම සහ ආණ්ඩුවේ හෝ සිවිල් සේවයේ පත්වීම් ලැබීම සඳහා එසේ කළ යුතු වන විට පමණක් ඒ පිළිබඳ කතා කිරීම සම්බන්ධයෙන් මුස්ලිම් ප්‍රජාවගේ අභිප්‍රාය පිළිබඳව ද ඔවුහු අවධාරණයෙන් සඳහන් කළහ.

පොදු ජනතාවට කිසිදු විශේෂිත ජනවාර්ගික/ආගමික කණ්ඩායමක් සම්බන්ධයෙන් ප්‍රමුඛකත්වයක් නොමැති අතර, දමිළයන් මුස්ලිම්වරුන්ට වඩා යහපත් බවට පුළුල් ලෙස පැතිර තිබෙන මතයක් ඇති බව ද බෞද්ධ ප්‍රතිචාර දක්වන්නෝ සඳහන් කළහ. කෙසේ නමුත් එම ප්‍රතිචාර දක්වන්නන් එම විශ්වාසයට සම්මාදම් වූයේ ද නැත. මුස්ලිම් ජාතිකයන් 'කපටීන්' බවට පොදු ජනතාව විශ්වාස කරන නමුත්, එය සහ ඔවුන්ගේ ව්‍යාපාරික සාර්ථකත්වය අතර සහසම්බන්ධයක් නොමැති බවට ඔවුහු තර්ක කළ අතර, මුස්ලිම්වරුන් ව්‍යාපාරවල වඩාත් ශූරය යන්න ව්‍යාජ විශ්වාසයක් බව ද ඔවුහු සඳහන් කළහ (ග්‍රාම සංවර්ධන සංසදයේ බෞද්ධ ස්ත්‍රීන් සහ පුරුෂයන්, 2017 මැයි 25).

අම්පාර දිස්ත්‍රික්කයේ අන්තර්-ආගමික සබඳතා සහ ගැටුමෙහි කේන්ද්‍රය පිළිබඳ ඉහත අනාවරණය, මුස්ලිම් ප්‍රජාවට සිය ඉඩම් අයිති කරගැනීම ගන්නා උත්සාහයන් විතැන් කරන, කලාපයේ ආර්ථික හා පරිපාලන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් මුස්ලිම්වරුන් සතු පාලනය පිළිබඳ සිංහල බෞද්ධ රාජ්‍යයේ අනාරක්ෂිත බව වේ. අනෙක් අතට දමිළයන් විසින් මුස්ලිම්වරුන්ට එරෙහි අගතීන්ට ආර්ථිකව වඩා පොහොසත් සහ සංස්කෘතිකව වෙනස් අයුරින් අවකාශ ලබාදෙන අතර, ඔවුන් විසින් දමිළ සංස්කෘතික වටිනාකම් දූෂණය කරමින් සිටින බව දකිමිනි. දිස්ත්‍රික්කයේ ප්‍රධාන වාර්ගික කණ්ඩායම් ත්‍රිත්වය අතර, බලය රැස්කිරීම සහ අධිපතිත්වයේ අර්ථයෙන් ආරාවුල් සහගත පොදු මූලයක් ලෙස දකින්නේ ඉඩම වේ.

## 3.4. මාතර

මාතර දිස්ත්‍රික්කයේ ආතතීන්ට සහ අන්තර්-ආගමික ගැටුමට හේතුව ලෙස දැක්වෙන්නේ බහුතරබව මත පදනම් වූ සිය ජනවාර්ගික-ආගමික අනන්‍යතාවය අහිමි වනු ඇතැයි බහුතර සිංහල බෞද්ධ ප්‍රජාව තුළ තිබෙන බිය වේ. මෙකී බිය දේශපාලඥයන් විසින් අයුතු ලෙස යොදාග න්නා අතර, අන්තවාදී සංඝටක විසින් සාමාන්‍ය පුරවැසියන්ව, එක්කෝ ප්‍රචණ්ඩත්වයෙන් හෝ සෙසු ජාතිවාදී ක්‍රියාවන්ගෙන් ඒවාට ප්‍රතිචාර දැක්වීමට පොළඹවනු ලබයි. පොදු ජනතාව තුළ පවතින ජාතිවාදී නැඹුරුතාවයට ප්‍රධාන හේතුව වශයෙන් දැක්වුණේ සිංහල ප්‍රජාවට අනෙකුත් සංස්කෘතීන් පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් නොමැති වීමයි. මුස්ලිම් ප්‍රතිචාර දක්වන්නන් ද මෙකී නොසලාක හැරීම සිය ප්‍රජාවට ද අදාළ බව ට එකඟ වූහ. මුස්ලිම් කාන්තාවන්

පැවසුවේ මාතර නගරයේ ප්‍රජාවන් මිශ්‍ර වී සිටින හෙයින්, මාතර නගරයේ මුස්ලිම්වරුන් අනෙක් සංස්කෘතීන් සමග දක්වන ප්‍රතික්‍රියාවන් හරහා එම සංස්කෘතීන් දැන සිටින බවයි. කෙසේ නමුත් වැලිගම සහ දික්වැල්ල නගරවල තිබෙන ඒක වාර්ගික ගම්මානවල ජීවත් වන අනෙකුත් ප්‍රජාවන්ගෙන් හුදෙකලා වූවන් ඇතැම් විට නොසිතා සිදුකරන ක්‍රියාවන්ගෙන් සිංහලයන්ගේ හැඟීම්වලට හිංසා කරති (මුස්ලිම් කාන්තා කණ්ඩායමක සාමාජිකාවන්, 2017 ජූනි 18).

මෙකී ඒක-වාර්ගික ගම්මාන තුළ භාෂාව ද ගැටුම සඳහා හේතුවක් වේ. ප්‍රතිචාර දක්වන්නන් සඳහන් කළේ එබඳු ගම්මානවල සිටින මුස්ලිම් ජාතිකයන් සිංහල භාෂාව හරිහැටි කතා කිරීමට නොදන්නා බවත්, සාමාන්‍ය ජනතාව අතර අනවබෝධයන් සහ සන්නිවේදන දෝෂයන් පවතින බවත් ය. මේ අනුව, අන්තර්-ආගමික සහජීවනය සඳහා පවතින ප්‍රධානතම අභියෝගය වන්නේ භාෂා ගැටළුව, සෙසු ආගම් සහ ඔවුන්ගේ භාවිතාවන් පිළිබඳ දැනුම මදකම, සහ විශේෂයෙන්ම දුරබැහැර/ග්‍රාමීය ප්‍රදේශවල බෞද්ධයන් සහ මුස්ලිම්වරුන් අතර ප්‍රමාණවත් අන්තර් ක්‍රියාවන් නොපැවතීමයි.

මෙම අනවබෝධය සහ වැරදි මත සඳහා එක් උදාහරණයක් වන්නේ මුස්ලිම්වරුන් අයි එස් අයි එස් සංවිධානයට සහාය දක්වන්නන් බවට පවතින විශ්වාසයයි. එය, මුස්ලිම්වරුන්ට පහරදීම සාධාරණීකරණය කිරීමට ද යොදා ගැනේ. ප්‍රතිචාර දක්වන්නියන් තරයේ කියා සිටියේ මුස්ලිම් ජාතිකයන් අයිසිස් සංවිධානයට විරුද්ධ බව ය. මුස්ලිම් ප්‍රජාව පිළිබඳ දැනුම අඩුවීම ද සමාජ මාධ්‍ය සහ ප්‍රධාන ධාරාවේ මාධ්‍ය තුළ මුස්ලිම්වරුන් ව පිළිගැනීමට ලක් නොවන දේශීය ප්‍රජාව බවට පත්වීමට දායක බව වන ද සාකච්ඡා විය. උදාහරණයක් වශයෙන් ඔවුන් සඳහන් කළේ, 2016 සහ 2017 වසරවල හටගත් දරුණු ගංවතුර තත්වයන්ගෙන් පසුව වාර්ගික -ආගමික ගැටළු පහළ ගිය බවයි. මන්ද යත්, බොහෝ මුස්ලිම්වරුන් ගංවතුර සහනාධාර ලබාදීමේදී බෙහෙවින් දායක වූ හෙයිනි. මාතර නගරයේ බෞද්ධ ප්‍රතිචාර දක්වන්නන් මේ මතයට සහාය පළ කරමින් කියා සිටියේ මුස්ලිම්වරුන් දුප්පතුන්ට උදව් කරන විට අතිශය මානුෂීය බව සහ, ගංවතුර සමයේදී ඔවුන් බෙහෙවින් උපකාර කළ බව ය (කේන්ද්‍රීය කණ්ඩායම් සාකච්ඡාවලදී කාන්තාවෝ සහ පුරුෂයෝ, 2017 ජූනි 17).

වැලිගම මුස්ලිම් ප්‍රතිචාර දක්වන්නන් මීට වඩා වෙනස් වූ නොතකා හරිනු ලබන අංගයක් පිළිබඳ සඳහන් කරමින් පැවසුවේ, ජනතාව ඉතිහාසය නොදන්නා බව සහ, ගැටුම් හටගන්නේ එනිසා බවයි. මේ වන විට මුස්ලිම් ගම්මානයක් බවට පත්ව ඇති වැලිගම, ඊට පෙරදමිළ ගම්මානයක් ව පැවති බවත් දන්නෝ දැන සිටින බවත් ඔවුහු සඳහන් කළහ. ගම්මානයට සිංහල ප්‍රභවයක් ඇතැයි විශ්වාස කරමින් අන්තවාදී කණ්ඩායම්වල මොළ ශෝධනයට ලක්වන්නේ මේ පැරණි තොරතුරු නොදන්නා නව පරපුර ය (ආගමික ආයතනයක සාමාජිකයන් හා සාමාජිකාවන්, 2017 ජූනි 18). වැලිගම මුස්ලිම් ප්‍රතිචාර දක්වන්නන් ද මේ සම්බන්ධයෙන් ස්වයං විවේචනයක නිතර වූයේ, බොදු බල සේනා වැනි අන්තවාදී කල්ලි සමග සම්බන්ධ වීම පිණිස සිංහල පුද්ගලයන් පොළඹවනු ලබන්නේ තමන්ගේම ප්‍රජාව විසින් බව සඳහන් කරමිනි. මුස්ලිම් ගොවියන් ස්වල්ප දෙනෙක් අසල්වැසි සිංහල ගොවීන්ගේ හරකුන් සොරකම් කරන බව ද ඔවුහු සඳහන් කළහ. ප්‍රදේශයේ මුස්ලිම් තරුණයන් ද නිදැල්ලේ හැසිරෙමින් පාරේ ක්‍රිකට් සෙල්ලම් කරමින් රථවාහන ගමනාගමනයට බාධා කරති. මෙයට එකට එක කිරීමක්

වශයෙන් සිංහලයෝ, එම තරුණයන් පල්ලියේ යාඥාවන්ට යමින් සිටින විටදී ඔවුන් පැළඳ සිටින තොප්පි ඩැහැ ගනිති. කෙසේ නමුත් ඇතැම් ප්‍රතිචාර දක්වන්නන් මේ මතයට විරුද්ධ වූයේ, තොප්පි එසේ ඩැහැ ගැනීම ප්‍රදේශයේ පන්සලේ උපදෙස් අනුව සිදුකරන ක්‍රියාවක් බව පවසමිනි. ඇතැම් මුස්ලිම් තරුණ කණ්ඩායම් ප්‍රශ්න ඇතිකිරීමට බලා සිටීම ගැන ද ඔවුහු සිය කණගාටුව පළ කළහ.

වැලිගම බෞද්ධ ප්‍රතිචාර දක්වන්නන් තමන්ගේ පැත්තෙන් කථාව විස්තර කරමින් සඳහන් කළේ, මුස්ලිම්වරුන් හැමවිටම පෝය දිනවල ක්‍රිකට් තරග සංවිධානය කරන බවයි. ඔවුන් දිනය පුරාම ශබ්ද විකාශන යන්ත්‍ර පාවිච්චි කරන්නේ බෞද්ධයන් හට සිය ආගමික වතාවත්වල නිරත වීමට අවශ්‍ය නිස්කලංක පරිසරයට බාධා කරමිනි. ඔවුන් සඳහන් කළේ, මෙවැනි තත්වයන්වලදී ඔවුන්ට ඉතාම අසරණ කමක් දැනෙන බව ය. ''මේ බෞද්ධ රටේ බෞද්ධයන්ට තමන්ගෙ ආගම අදහන්න තියෙන අයිතිය නැති වෙලා'' (කේන්ද්‍රීය කණ්ඩායම් සාකච්ඡාවේදී බෞද්ධ ස්ත්‍රීන් සහ පුරුෂයෝ, 2017 ජූනි 17).

අනෙක් අතට, සිංහල ප්‍රතිචාර දක්වන්නෝ ද, සිංහලයන් අතර පවතින තමන් බහුතරය බවට වන හැඟීම විසින් අන්තර්-ආගමික ගැටලුව උග්‍ර කරන බවට වන කරුණ තමන් දැන සිටින බව කියා පෑහ. ඔවුන් සඳහන් කළේ, සිංහලයන්ගේ අධිපතිභාවය සෙසු ප්‍රජාවන් විසින් අභියෝග යට ලක් කිරීම තමන්ට අවශ්‍ය නොවන බවයි. වැලිගම ගැටුම් සහිත භූමියක් බවත්, අතීතයේද අවස්ථා ගණනාවකදී ගැටුම් හටගත් බවත් ඔවුහු සඳහන් කළහ. මෙකී අරගලවලින් බහුතරයක මූලාරම්භය, සිංහලයන් අතර පවතින, තමන් මහජාතිය බවට වන හැඟීම නිසා හටගෙන, පසුව අන්තර්-ආගමික/වාර්ගික ගැටුම් බවට පත්වූ පුද්ගලික ආරාවුල් ය.

එම සිංහල බෞද්ධ බහුතරවාදිත්වය ආණ්ඩුකරණ ව්‍යුහයන් වෙත ද පැතිර ඇති අතර එහිදී නීතිය හා සාමය පවත්වාගෙන යාමට වගකිව යුතු පොලිසිය හා ග්‍රාම නිලධාරීන් වැනි අය, මෙම සාපරාධී ක්‍රියාවන්ගේ නිරතවන්නා/වන්නන් බෞද්ධයන් වන විට එකී අන්තර්-ආගමික ගැටුම් සඳහා මැදිහත් වීමට අපොහොසත් වෙති. මේ අනුව තර්ජනය කිරීම්, බිය වැද්දවීම්, වෙනස්කොට සැලකීම් සහ තමන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයන්වලට පිළිසරණ සොයන විට අත්වන අසරණභාවය පිළිබඳ මුස්ලිම්, හින්දු සහ ක්‍රිස්තියානි සුළුතරය අදහස් දැක්වූහ. මෙම දඬුවම් නොලැබීමේ සංස්කෘතිය (දණ්ඩ මුක්තිය) මුස්ලිම්වරුන්ට එරෙහිව වෛරය පැතිරවීම මගින් අන්තර්-ආගමික ආතතීන් කළඹවන දේශපාලකයන් විසින් තවදුරටත් දිරිමත් කෙරේ. මුස්ලිම් ප්‍රතිචාර දක්වන්නන් සඳහන් කළේ මේ ගැටළුව නොවිසඳී පවතින්නේ, තමන්ගේ පාර්ලිමේන්තු ආසන රැක ගැනීමට අවශ්‍ය නිසා මුස්ලිම් අමාත්‍යවරුන් මේ සම්බබන්ධයෙන් කිසිවක් නොකරන හෙයින් බවයි (කේන්ද්‍රීය කණ්ඩායම් සාකච්ඡා, මුස්ලිම් ස්ත්‍රීන් සහ පුරුෂයෝ, 2017 ජූනි 18). වැලිගම බෞද්ධ ප්‍රතිචාර දක්වන්නෝ ද දේශපාලකයන් විසින් අන්තර්-ආගමික අගරලය තමන්ගේ න්‍යායපත්‍රවලට තවදුරටත් යොදාගන්නා බව ට වන මතය තරයේ කියා සිටියහ. අන්තර්-ආගමික ප්‍රචණ්ඩත්වයේ වින්දිතයන්ට යුක්තිය සඳහා ප්‍රවේශය මේ අනුව දේශපාලන බලපෑම සහ නීති ක්‍රියාත්මක කරන ව්‍යුහයන් තුළ සිටින සිංහල බහුතරය හේතුවෙන් ඇහිරී යයි.

# 4. අන්තර් ආගමික ගැටුම් ආමන්ත්‍රණය කිරීමේදී ගැටුම් ලිහිල්කරණ ක්‍රමෝපායයන් සහ අන්තර් ආගමික කමිටුවල භූමිකාව

මෙකී අන්තර් ආගමික ගැටුම සහ වාදයන් ආමන්ත්‍රණය කිරීමට පොලිසිය වැනි නීති සාධන අධිකාරීන්ට හැකියාව තිබෙන බව තාර්කික උපකල්පනයකි. එසේ වුවත් ජනවාර්ගික-ආගමික බහුතරවාදය විසින් රාජ්‍ය ආයතනවල පරිචයන් හැඩගන්වන විෂමජාතීය ප්‍රජාවන් තුළ රජයේ නීති සාධන යාන්ත්‍රණයන්ගේ වෙනස්කොට සැලකීම් සහ අපක්ෂපාතිත්වය පිළිබඳ විශ්වාසය මදකමක් පවතියි. මෙකී විශ්වාසයේ හීනකම විසින් මන්නාරම සහ අම්පාර මුස්ලිම්වරුන් වැනි නිශ්චිත ප්‍රජාවන්ට නීති පද්ධතියේ අපක්ෂපාතිත්වය මත විශ්වාසය තබමින් මන්නාරම කතෝලික බහුතරය සහ අම්පාරේ රජයේ නියෝජිතයන් වන බෞද්ධයන් සමග ගැටෙමින් නීතිමය පිළිසරණ පතන්නට සිදුව තිබේ. මේ හා සමානව දෙණියායේ මුස්ලිම්වරුන් සහ හින්දූන් ද, බෞද්ධ අන්තවාදී සංඝටකයන්ට පක්ෂපාතී වන පොලිසියේ වෙනස්කොට සැලකීම් අත්දකින්නට සිදුව ඇත.

එසේ හෙයින්, අන්තර්-ආගමික ගැටුම්වලදී සමථකරණය හෝ ආරාවුල් ලිහිල්කරණය කරගැනීම නිරන්තරයෙන්ම සිදුකර ගැනීමට සිදුව තිබෙන්නේ ආගමික නායකයන්ගේ මැදිහත්වීම මත තනි පුද්ගල හැකියා පරාසයන් මත ප්‍රාදේශීය /පුද්ගලික මට්ටමෙනි. දිස්ත්‍රික්ක හතරේම අන්තර්-ආගමික සංසද හෝ කමිටු (විධිමත් හෝ අවිධිමත්) ක්‍රියාත්මක වන අතර, ඒවා පිහිටුවාගෙන තිබෙන්නේ වෙනස් ආගම්වල සාමාජිකයන් අතර යහපත් සබඳතාවන් පවත්වාගෙන යාමේ අරමුණෙනි. මන්නාරම සහ මාතර අන්තර්-ආගමික සංසදයේ නියෝජිතයන්ගේ පොදු ආඛ්‍යානයක් වූයේ, විශේෂයෙන්ම ප්‍රචණ්ඩකාරී ගැටුම් ඇතිවන ක්ෂේත්‍රවලදී වහාම ක්‍රියාමාර්ග ගැනීම සඳහා මැදිහත් වීමටත් ඒවා විසඳීමටත් හැකියා පරාසය මද කමයි. අම්පාර සහ මාතර ප්‍රතිචාර දක්වන්නන් දේශපාලකයන්ගෙන් ද ඉල්ලා සිටියේ ජාතිවාදය සහ කලාපීය ජාතිවාදය වැනි දේශපාලන උත්තේජනයන්ගෙන් හැඩගන්වනු ලැබූ අන්තර්-ආගමික ගැටුම් වලදී ඒවා විසඳීමට මැදිහත්වන ලෙස ය.

## 4.1. මන්නාරම

ගැටුම් නිරාකරණය පිළිබඳ සැලකිල්ලක් දක්වන අවිධිමත් ව්‍යුහයක් වන මන්නාරම අන්තර්-ආගමික සංසදය, දිස්ත්‍රික්කයේ අන්තර්-ආගමික ගැටළු ආමන්ත්‍රණය කිරීමට එකට එක්වන ආගමික මෙන් ගිහි නියකයන්ගෙන් ද සමන්විත වේ. මෙම කවුන්සිලය වසර 20කට ඉහතදී දේවස්ථානයේ සහ මව්ලවිවරයෙකුගේ මුලපිරීමෙන් ස්ථාපනය කරන ලද්දකි. යුධ කාලයේ මෙම කණ්ඩායම සක්‍රියව නොසිටි නමුත්, වර්තමානය වන විට රාජ්‍ය නොවන සංවිධාන දෙකක සහයෝගය ඇතිව නැවත සිය ක්‍රියාකාරකම් අරඹා ඇත. සංසදයේ සභාපති සහ ලේකම් සමන්විත වන්නේ ආගම් හතරේම පූජ්‍ය පක්ෂයේ නියෝජනයෙන් වන අතර, සෙසු නිලයන් දරන්නෝ පූජ්‍ය පක්ෂය විසින් රෙකමදාරු කරන ලද ගිහි ස්ත්‍රී පුරුෂ නායික නායිකාවෝ වෙති. කවුන්සිලය මසකට වරක් රැස්වන අතර, නීතිවිරෝධී/තරගකාරී ලෙස ප්‍රතිමා ස්ථානගත කිරීම, ඉඩම් ප්‍රශ්න, ළමා අපයෝජන සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම්

කරගත් ප්‍රචණ්ඩත්වයන් පිළිබඳ පැමිණිලි විභාග කරයි. ඔවුන් අන්තර්-ආගමික සහජීවනය ප්‍රවර්ධනය කරන එක් ආකාරයක් වන්නේ වෙනස් කලාපයක ප්‍රජාව විසින් මෙහෙයවනු ලබන උත්සවයක ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් ප්‍රකට ආගමික නායකයෙකුට ඇරයුම් කිරීමයි. ඔවුන් විසින් විසඳන ලද එක් ගැටළුවක් හින්දු කෝවිලක් විසින් දේවස්ථානයකට එරෙහිව ලබාගත් පරවශතාවයක් සම්බන්ධ ගැටළුවකි. කෙසේ නමුත් සංසදයේ නියෝජිතයෙක් සඳහන් කළේ තමන් කණ්ඩායමක් ලෙස සක්‍රියව සිටින නමුත් අන්තර්-ආගමික ප්‍රචණ්ඩත්වය වැනි ස්ථානීය ව හටගන්නා ගැටළු සම්බන්ධයෙන් තමන්ට සමාජ පිළිගැනීමක් හෝ වැදගත්කමක් නොමැති බවයි. ඔවුන් මැදිහත් වන මට්ටම තුළ අදාළ ගැටළුව අදාළ රජයේ නිලධාරීන්ට දැනුම් දීම සිදුවන අතර, එයින් පසු එය ඔවුන්ගේ පරාසයෙන් ඉවත් වීම සිදු වේ.

එක් වැඩිමහල් ප්‍රතිචාර දක්වන්නෙක් පැහැදිලි කළ පරිදි ඔවුන් මුහුණ දෙන එක් අභියෝග යක් වන්නේ අතීතයේ සමථ මණ්ඩල සහ භාරකාර මණ්ඩල පැවති අතර, සෑම අයෙක්ම එම මණ්ඩලවල තීරණවලට ගරු කළ බවයි. නමුත් අද වන විට දමිළයන් සහ මුස්ලිම් ජාතිකයන් අතර සබඳතාවල ඇති වී තිබෙන පරතරය හේතුවෙන්, අන්තර්-ආගමික සංසද හෝ කවුන්සිලවලට ගරු කෙරෙන්නේ නැත.

තවත් ප්‍රතිචාර දක්වන්නෙකුට අනුව, ගම් මට්ටමේදී තනි පුද්ගල පාදිළි පියනමක් හෝ හින්දු කෝවිලක් භාරව සිටින හින්දු කුරුවරයෙක් නියම වශයෙන්ම ප්‍රාදේශීය ගැටුම් විසඳිය යුතුය. කෙසේ නමුත් ගිහි සාමාජිකයන්ගෙන් සමන්විත පාදිළි සභාව සහ කෝවිල් පරිපාලනයේ සාමාජිකයන් විසින් මේ තත්වයෙන් පූජ්‍ය පක්ෂය විතැන් කර ආරාවුල් නිරාකරණයේ සහ තීරණ ගැනීමේදී අධිකාරි බලය ලබාගෙන ඇත. මෙය සිදුවන්නේ, එකී පියනම/කුරුවරයාට සෙසු රාජකාරි මධ්‍යයේ ප්‍රාදේශීය ගැටළු විසඳීමට කාලයක් නොමැති වීම හෝ, පාදිළි/පරිපාලන සමාජයේ ප්‍රබල සාමාජිකයන්ට ඉහළින් අධිකාරිමය නියෝග ලබාදිය හැකි පෞරුෂයක් නොමැති වීම යන කාරණාව මත ද විය හැකිය.

මෙහිදී ඔවුන් විසින් සකස් කරගෙන ඇති ගැටුම් නිරාකරණ ක්‍රමෝපායයන් ද දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කයට වෙනස් හා සුවිශේෂී වේ. මන්නාරම දිස්ත්‍රික්කයේ සියලුම රෝමානු කතෝලික නොවන ප්‍රතිචාර දක්වන්නන් විසින්, නීති සාධනය සහ රජයේ නිලධාරීන් පිළිබඳ සිය අඩු විශ්වාසය පළ කළේ, කතෝලික පල්ලියට තීරණවලට බලපෑම් කිරීමට හැකියාව ඇති හෙයිනි. උදාහරණයක් වශයෙන්, රෝමානු කතෝලික නොවන ප්‍රතිචාර දක්වන්නෙක් සඳහන් කළේ, කතෝලිකයන් විසින් සිය වන්දනා මාන කරන ස්ථානයට ගල් ප්‍රහාර එල්ල කළ එක්තරා අවස්ථාවක පොලිසිය විසින් ප්‍රචණ්ඩත්වයට මුල පිරූ කතෝලිකයන් නොව, රෝමානු කතෝලික නොවන පුද්ගලයන් පමණක් අත්අඩංගුවට ගත් බව ය (ක්‍රිස්තියානි පාදිලිවරයෙක්, 2017 මාර්තු 7). එසේ හෙයින් මන්නාරමේ ආගමික සුළුතරය, විශේෂයෙන්ම ඉඩම් ආරාවුල් සම්බන්ධයෙන් ගැටළු විසඳා ගැනීම පිණිස නීතිමය පිළිසරණ පැතීම සම්බන්ධයෙන් වැඩි විශ්වාසයක් තබති. රෝමානු කතෝලික නොවන පුද්ගලයන් සඳහන් කළේ, ඔවුන් විසින් තමන්ව අධිකරණයේදී නියෝජනය කිරීම පිණිස මුස්ලිම් නීතීඥවරුන් තෝරාගන්නේ, කතෝලික නීතීඥවරුන් පල්ලියට පක්ෂග්‍රාහී විය හැකි නිසා බවයි. ඇතැම් නඩු තීන්දු ක්‍රිස්තියානි/මුස්ලිම් පැමිණිලිකරුවන්ට වාසිදායක නොවුණද ඉහතින් සඳහන්

කළ ඉඩම් ආරවුල් ඔවුන් (කතෝලිකයන් සහ මුස්ලිම්වරුන් අතර ආරවුල් ද ඇතුළත්ව) නීතිමය ක්‍රියාමාර්ග හරහා වේ.

## 4.2. යාපනය

වෙනස් ජනවාර්ගික-ආගමික ප්‍රජාවන් සමගි කිරීම සඳහා සංස්කෘතික ක්‍රියාකාරකම්වල හා නාට්‍යමය ක්‍රියාකාරකම්වල යෙදෙන එක් පුරුෂයෙකු හැරුණු විට සම්මුඛ සාකච්ඡාවලට ලක් කළ ප්‍රතිචාර දක්වන්නන් කිසිදු අන්තර්-ආගමික කණ්ඩායමක හෝ කවුන්සිලයක සාමාජිකයන් නොවුණි. මේ කණ්ඩායම සාමය ගොඩනැංවීම සඳහා ක්‍රියාත්මක වන රාජ්‍ය නොවන සංවිධානයක් විසින් සංවිධානය කරන ලද අන්තර්-ආගමික කතිකාවකින් උත්තේජනය ලද පිරිසක් වන අතර, ඔවුහු ආගමික උත්සව සමයේ අධ්‍යාපනික ක්‍රියාකාරකම් සිදුකරමින් වෙනස් ආගමික කණ්ඩායම් අතර පවත්නා පරිචයන් පිළිබඳ දැනුවත් කිරීම් සිදුකරති. තවත් ප්‍රතිචාර දක්වන්නියක් අන්තර්-ආගමික සංසදයක සාමාජිකාවක් ද වූවාය. මේ දෙපිරිසම සඳහන් කළේ වෙනස් ආගමික කණ්ඩායම් අතර විශාල ගැටුම් නොමැති බවත්, එනිසා අන්තර්-ආගමික සංසදයක් පිහිටුවීමේ හදිසි අවශ්‍යතාවක් නොමැති බවත් ය.

මෙකී හදිසි අවශ්‍යතාවයක් නොමැති කම, සිවිල් සමාජය සහ යාපනයේ තනි පුද්ගලයන් තවමත් පශ්චාත් යුධ හා, සත්‍යය, යුක්තිය සහ හානි පූරණයේ අවශ්‍යතාවය අවධාරණය කරන සංක්‍රාන්තික යුක්තිය වෙත යොමු වී සිටින නිසා විය හැකිය. විශේෂයෙන්ම හින්දූන් සහ බෞද්ධයන් අතරත්, දමිළයන් සහ මුස්ලිම් ජාතිකයන් අතරත් අන්තර්-ආගමික සබඳතා මේ අනුව ආගමට වඩා වාර්ගික ආධිපත්‍යයේ කාච තුළින් බැලීම සිදුව තිබිණි.

## 4.3 අම්පාර

අම්පාරේ ප්‍රතිචාර දක්වන්නන් විසින් ගැටුම් නිරාකරණය සැලකුවේ දේශපාලනඥයන්ගේ වගකීම ලෙසිනි. ප්‍රශ්නයක් පවතින විට මුස්ලිම් දේශපාලකයන් රජය සමග කතිකා කිරීම අවශ්‍ය බව සහ ඔවුන් විසින් එසේ කළ යුතු බව ඔවුහු සඳහන් කළහ. හුදෙක් ප්‍රසිද්ධ ප්‍රකාශයක් සිදුකිරීමෙන් පමණක් ප්‍රශ්නය නොවිසඳෙනු ඇත. ඇතැම් ප්‍රතිචාර දක්වන්නන් සඳහන් කළේ මුස්ලිම් දේශපාලකයන්ට සිය ප්‍රජාව මුහුණ දෙන ප්‍රශ්න විසඳීමට හැකි බවට තිබූ විශ්වාසය මුස්ලිම් ජාතිකයන් හට අහිමි වී ඇති බවයි. සිවිල් සමාජය සවිබල ගැන්වීම සහ පෙරට පැමිණ සිවිල් ගැටළු විසඳීමට සිවිල් සමාජය දිරිමත් කිරීමේ අවශ්‍යතාවයක් ද විය (කේන්ද්‍රීය කණ්ඩායම් සාකච්ඡාවකදී මුස්ලිම් පුරුෂයෙක්, 2017 මැයි 23).

අම්පාර බෞද්ධ ප්‍රතිචාර දක්වන්නන් විසින් සඳහන් කළේ අන්තර්-ආගමික ගැටුම විසඳීමට නම් සිය අයිතිවාසිකම අනුව වැඳුම් පිදුම් කිරීමේ ස්ථාන ඉදිකිරීමට මිනිසුන්ට ඉඩ ලබාදිය යුතු බවයි. සැම අයෙක්ම සාමයෙන් යුතුව ජීවත් වෙමින්, අනෙකාගේ භාෂාව ඉගෙන ගනිමින් අනෙක් අය සමග අන්තර්ක්‍රියා දැක්විය යුතුය. මුස්ලිම් ප්‍රශ්නය ට විසඳුම මුස්ලිම් ජාතිකයන් මුස්ලිම් රටවලට යැවීම බව ද ඔවුහු සඳහන් කළහ (ග්‍රාම සංවර්ධන සංසදයක බෞද්ධ ස්ත්‍රීන් සහ පුරුෂයන්, 2017 මැයි 25).

අම්පාර බෞද්ධයන් සහ මුස්ලිම් ජාතිකයන් අතර පවතින අවිශ්වාසනීයත්වයේ ප්‍රමාණය අනුව ගැටුම් (විශේෂයෙන්ම ඉඩම් අත්පත්කරගැනීම් හා සම්බන්ධ වූවන්ගේ) ආමන්ත්‍රණය කළ යුත්තේ අපක්ෂපාතී මාර්ගයක් ලෙස සැලකෙන නීතිමය ක්‍රියාමාර්ග හරහාය.

## 4.4. මාතර

මාතර නගරයේ මුස්ලිම් කාන්තාවෝ වාර්ෂිකව සාම දිනය සමරන මුස්ලිම් සංවිධානයක සාමාජිකාවෝ වූහ. ඔවුන්ගේ ක්‍රියාකාරකම් අතර, සිංහල ජාතිකයන් සමග අයිසිස් සංවිධානය පිළිබඳ කතාබස් කිරීම සහ අයිසිස් සාමාජිකයන් මුස්ලිමුන් නොවන බව ඔවුන්ට දැනුම් දීම ද වේ. ඔවුන් සිංහල සඟරාවකට ලිපි සැපයීමෙන් දායක වන අතර, මුස්ලිම් ජාතිකයන්ගේ සංස්කෘතික සහ ආගමික පරිචයන් පිළිබඳ ජනතාවගේ කුතුහලයට ප්‍රතිචාර දක්වති.

කෙසේ වෙතත් වැලිගම මුස්ලිම් ස්ත්‍රීන් සහ පුරුෂයන්, අන්තර්-ආගමික කණ්ඩායම් පිළිබඳ විවේචනාත්මක වූයේ එකී කණ්ඩායම් පිහිටුවනු ලබන්නේ ප්‍රශ්නයක් ඇති විටදී පමණක් බව සඳහන් කරමිනි. ''පිටින් කට්ටිය ඇවිත් කණ්ඩායම් හදනවා. පස්සෙ කණ්ඩායම් කැඩෙනවා. ඒ අය අපිට රැස්වීම්වලට කතා කරනවා. දවල් කෑමයි සල්ලියි දෙනවා. ඉතින් අපි යනවා" (ආගමික ආයතනයක සාමාජික සාමාජිකාවන්, 2017 ජූනි 18). වෙනස් ආගමික නායකයන් අතර සම්බන්ධතා ගොඩනැංවීමේ වැදගත්කම ඔවුහු ඉස්මතු කර දැක්වූහ.

දෙණියාය අන්තර්-ආගමික කමිටුව, අන්තර්-ආගමික ගැටුම ආමන්ත්‍රණය කිරීමට උත්සාහ කිරීම අතින් වඩාත් සක්‍රිය බව පෙනුණි. මෙම කණ්ඩායම විසින් දෙපාර්ශවයටම අවකාශයක් තැනීම සඳහා සිදුකළ එක් පරිශ්‍රමයක් වූයේ ඔවුන් හමුවී එකිනෙකාගේ කරුණු කියාපෑම්වලට පොලිසිය, ග්‍රාම නිලධාරී සහ දිසාපතිවරයා සමග සමීපව කටයුතු කරමින් සවන් දීමයි. කෙසේ වෙතත්, බෞද්ධයන් සහ වෙනත් ආගමක සාමාජිකයෙක් අතර ගැටළුවකදී කමිටුව ප්‍රශ්නවලට මුහුණ දෙන්නේ ඔවුන් ලබාදෙන විසඳුම් අධිකාරීන් විසින් නොපිළිගන්නා නිසා ය. එසේ හෙයින්, බෞද්ධ මුස්ලිම්/ක්‍රිස්තියානි/හින්දු ආතතිය පිළිබඳ ප්‍රශ්නයට විසඳුම් ලබාදිය හැක්කේ දේශපාලනික මට්ටමෙන් පමණක් බව මෙම කණ්ඩායමේ හැඟීමයි. එයට හේතුව, අන්තවාදී සංඝටක සමග කටයුතු කළ හැක්කේ දේශපාලනිකව පමණක් වන නිසා ය. ඔවුන් තවදුරටත් අදහස් දැක්වූයේ, ආරාවුල් නිරාකරණය පිළිබඳ පුහුණු වීමේ වැදගත්කම ය. ඒ අතරම, අන්තර්-ආගමික ගැටුමේ ප්‍රශ්න සමග සෘජුව මැදිහත් වීමට හැකියාවක් නොමැති කම නිසා එම පුහුණුවීම් ඵලදායී නොවන බවද ඔවුහු සඳහන් කළහ. මෙය මෙසේ වන්නේ ප්‍රදේශයේ නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් සහ තීරණ ගන්නා ව්‍යුහයන් කමිටුව විසින් ප්‍රවර්ධනය කරන සහජීවනයේ අගයන් බෙදාහදාගැනීම හෝ ඒවා පිළිගැනීම නොකරන නිසා ය. එම කමිටු සාමාජිකයන් තවදුරටත් සඳහන් කළේ ආරවුල් නිරාකරණය පිළිබඳ සිය දැනුම සහ කුසලතාවන් වර්ධනය කර ගැනීමටත් යාවත්කාලීන කර ගැනීමටත් තමන්ට අවස්ථාවන් නොලැබුණු බව ය.

# 5. කාන්තාව සහ අන්තර් ආගමික ගැටුම: සහභාගිත්වය සහ භූමිකාවන්

ගැටුම් ලිහිල්කරණයේදී සමාන සහභාගිත්වය සහ ස්ත්‍රීන්ගේ භූමිකාව, පුරුෂමූලික සමාජයන් තුළ බහුල වශයෙන් අවධානයට ලක් නොවන දෙයක් පමණක් නොව, හැල්ලු කිරීමට සහ ආගමික මතයන්, විශ්වාසයන් හා ආයතන මගින් බලගැන්වූ එකක් ද වේ. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක කවුන්සිලයේ 1325 රෙගුලාසිය (UNSCR 1325) මගින් ගැටුම් වළක්වාගැනීමේ හා සහභාගිත්වයේදී ස්ත්‍රීන්ට සමාන භූමිකා ලබාදීමේ වැදගත්කම අවධාරණය කෙරෙන අතර, තීරණ ගැනීමේ ක්‍රියාවලිය, ආරක්ෂාව, මානව හිමිකම් ගරු කිරීම, සහන ලබාදීම හා යථාකරණ ක්‍රියාවලියට ඔවුන් අන්තර්ග්‍රහණය කර ගැනීමේ වැදගත්කම ද අවධාරණය කෙරෙයි. මෙකී භූමිකාවන් සහ හිමිකම් සන්නද්ධ ගැටුම්වලට සාපේක්ෂව අර්ථ නිරූපණය කළ ද, අන්තර්-ආගමික ගැටුම් සහ ගැටුම් නිරාකරණය සඳහා ස්ත්‍රීන්ගේ දායකත්වය එයට ආදේශ කළ හැකිය. එසේ හෙයින් මෙම කොටසෙන් විමසා බැලෙන්නේ ගැටුම් හටගැනීමට පෙළඹවීම, ආරාවුල් ලිහිල්කරණයේදී ඔවුන්ගේ දායකත්වය, ආගමික/අන්තර්-ආගමික කණ්ඩායම් හෝ සංගම්වලට ඵලදායී අන්දමින් දායක වීමේදී ස්ත්‍රීන් මුහුණ දෙන බාධක, ආරක්ෂාව සම්බන්ධයෙන් ඔවුන්ගේ සලකාබැලීම් හා සහජීවනය ප්‍රවර්ධනය කිරීමට සක්‍රිය ලෙස ස්ත්‍රියට දායක විය හැකි මාර්ගයන් කවරේද යන්නයි.

ආගමික අනෙකා පිළිබඳ අවබෝධයේ මට්ටම සම්බන්ධයෙන් ස්ත්‍රීන් හා පුරුෂයන් අතර ආකල්පමය අතින් කැපී පෙනෙන වෙනසක් නොමැති බව මෙහිදී නිරීක්ෂණය කිරීම වටියි. කෙසේ වෙතත්, අන්තර්-ආගමික ගැටුම පිළිබඳ ස්ත්‍රීන්ගේ අවබෝධය සහ, ගැටුම් ලිහිල්කරණයේදී ඔවුන්ගේ සහභාගිත්වය දිස්ත්‍රික්ක හතර තුළ මෙන්ම දිස්ත්‍රික්ක හතර පුරාම විවිධාකාර වේ. ඒ අනුව අම්පාර මුස්ලිම් කාන්තාවන්, මන්නාරමේ මුස්ලිම් කාන්තාවන්ට වඩා අන්තර්-ආගමික කමිටුවලදී වඩාත් සක්‍රිය බව සොයාගැනුණු අතර, අම්පාරේ එකී ක්‍රියාකාරකම් ප්‍රජාවේ ආගමික මතවාදයන් විසින් සීමාකර තිබිණි. මේ හා සමානව හින්දු කාන්තාවන් ද, (ඔවුන්ගේ ක්‍රියාකාරිත්වය හා සමාජ, ආර්ථික විෂයන් හි ඔවුන්ගේ ව්‍යවසායකත්වය නොතකා) අන්තර්-ආගමික කමිටු සහ කෝවිල් පරිපාලන කණ්ඩායම්වලට අවම වශයෙන් සම්බන්ධ වීමක් පෙන්නුම් කළේ, හින්දු විශ්වාසයන් සහ පරිචයන්ගේ පුරුෂමූලික යටිතහවුරුව හේතුවෙනි. බෞද්ධ සහ කතෝලික කාන්තාවන්ගේ දායකත්වය ඔවුන් අයත් කණ්ඩායම් විසින් කොතරම් දුරකට උපයෝජනය කරයිද යන්න පිළිබඳ පැහැදිලි අදහසක් ලබාගත නොහැකි වුවත් අන්තර්-ආගමික කමිටුවල වැඩිම සක්‍රියත්වය ඔවුන් විසින් පෙන්නුම් කළේය. කාන්තා නියෝජ්‍යත්වය සම්බන්ධයෙන් ස්ථානය ද සුවිශේෂී තීරකයක් විය. ඒ අනුව, එක් එක් දිස්ත්‍රික්කවල කාන්තා සහභාගිත්වය, නියෝජ්‍යත්වය සහ ඔවුන් අවදානමට ලක්විය හැකි ප්‍රමාණය පිළිබඳ මීළඟට සිදුකෙරෙන විශ්ලේෂණයෙන් කේන්ද්‍රීය ලෙස සලකා බැලෙයි.

## 5.1. මන්නාරම

මන්නාරම ප්‍රතිචාර දක්වන්නියන් (කාන්තාවන්) සම්බන්ධයෙන් පොදු නිරීක්ෂණයක් වූයේ (ඔවුන්ගේ ආගමික සම්බන්ධයට අනනුකූල ලෙස) ඔවුන් සිය ගම්මාන සහ දිස්ත්‍රික්කය තුළ

පවතින අන්තර්-ආගමික ගැටුම් පිළිබඳ දැනුවත් බව ය. ක්‍රිස්තියානි කාන්තාවන් හැරුණු විට ඔවුන් ගැටුම් ලිහිල්කරණ මුලපිරීම්වලට, ආගමික කණ්ඩායම්වල හෝ අන්තර්-ආගමික කණ්ඩායම් ක්‍රියාකාරකම්වලට විශාල බලපෑමක් සිදුකර ඇති බවක් නොපෙනුණි. මේ අතර මුස්ලිම් කාන්තාවන් එකී ගැටළු සහ ඔවුන් ප්‍රිය කරන විසඳුම් පිළිබඳ ඉතා චතුර අන්දමින් විස්තර කළහ.

මුස්ලිම් ප්‍රතිචාර දක්වන්නියන් (කාන්තාවන්) ප්‍රජාවේදී හෝ ආයතනයික මට්ටමේදී ආගම සම්බන්ධ ගැටළුවලට තමන්ටද භූමිකාවක් ඇති බව සැලකිල්ලට නොගත්හ. අන්තර්-ආගමික ආරවුල්වලදී ඔවුන්ට භූමිකාවක් සිදුකළ නොහැක්කේ මන්ද යන්න ඇසූ විට ඔවුන් පැවසුවේ, තමන් විසඳුමක් සොයාගැනීම සඳහා මුලපිරීමට සමත් යැයි තමන්ට පෙනී නොයන බව ය. ග්‍රාමීය කාන්තා සංවර්ධන කමිටුවල සාමාජිකාවන් වුවද කිසිදු අන්තර්-ආගමික සංසදයක ඔවුන්ට සාමාජිකත්වය නොතිබිණි.

හින්දු කාන්තා කණ්ඩායම් මූලික වශයෙන් සැලකිලිමත් වූයේ සිය ගම්මානවල සංවර්ධනය, පාරට ගල් ඇල්ලීම, ජීවනෝපාය සහ සිය දරුවන් සඳහා රැකියා අවස්ථාවන් පිළිබඳව ය. ඔවුන්ගේ මතය වූයේ කතෝලිකයන්ට අමාත්‍යාංශ සමග සම්බන්ධතා පැවති හෙයින්, හින්දූන් ව කොන් කර ඇති බවත්, ඒ අනුව කතෝලිකයන් හට රජයේ සේවයේ වඩා හොඳ රැකියා අවස්ථා පවතින බවත් ය.

කතෝලික කාන්තාවන් සහ රෝමානු කතෝලික නොවන කාන්තාවන් දේවස්ථාන පරිපාලන කණ්ඩායම්වල වඩාත් සක්‍රිය අය වූ අතර, අන්තර්-ආගමික ගැටුම පිළිබඳ වඩාත් ප්‍රබල මතයන් බෙදා හදා ගත්හ. දේවස්ථාන පරිපාලන කණ්ඩායම්වලට පාදිලි පියනමට ඉහළින් විශාල බලපෑමක් සිදුකළ හැකි වීමේ කාරණය (වාර්තාවේ පෙර සඳහන් කළ පරිදි) මගින් පෙන්වා දෙන්නේ එකී කණ්ඩායම් වැඩි වශයෙන්ම සමන්විත වන්නේ කාන්තාවන්ගෙන් වන හෙයින්, තීරණ ගැනීමේදී සහ ඒ සඳහා දායක වීමේදී හෝ ගැටුම් ලිහිල්කරණයේදී ඔවුන්ට වැඩි බලපෑමක් සිදුකළ හැකි බවයි. මන්නාරම අන්තර්-ආගම් ෆෙඩරේෂනයේ වත්මන් ලේකම් කතෝලික කාන්තාවක් වන අතර, ෆෙඩරේෂනයේ කාන්තා සාමාජිකයන් ද අන්තර්ගත ය. කෙසේ නමුත් මෙකී කාන්තාවන් ඉංජිනේරුවන්, වෛද්‍යවරියන් හෝ ගුරුවරියන් වැනි සමාජයේ 'බලපෑම් සහගත' කාන්තාවන් ය. මෙකී කාන්තාවන් අන්තර්-ආගම් සංසදවලට සහභාගි වන මට්ටම ද අවිනිශ්චිත ය. අන්තර්-ආගම් ෆෙඩරේෂනයේ එක් සාමාජිකයෙක් (පිරිමි) පැවසුවේ, ෆෙඩරේෂනයේ ක්‍රියාකාරකම්වලදී කාන්තා සාමාජිකාවන් නායකත්ව භූමිකාවන් සිදු නොකරන බව ය. කෙසේ නමුත්, ඔවුහු වෙනම සිය ස්ත්‍රීවාදී උද්දේශනයේ නිරත වී සිටියහ (කතෝලික පියනමක්, 2018 අප්‍රේල් 14).

## 5.2. යාපනය

යාපනයේ හින්දු කාන්තාවන් කෝවිල් පරිපාලන කමිටුවලට සහ තීරණ ගැනීමේ ක්‍රියාවලියට ඇතුළත් නොවෙති. ඔවුන්ට ප්‍රසිද්ධ රැස්වීම්වලදී සිය මතය හඬ ගා කිව හැකි නමුත් කෝවිල් පරිපාලන රැස්වීම්වලදී එසේ කළ නොහැක. ස්ත්‍රීන් සම්බන්ධ වන්නේ කෝවිල් භූමිය ශුද්ධ පවිත්‍ර කිරීම වැනි කෝවිල් පරිපාලනයේ කුඩා ක්‍රියාකාරකම්වලට ය. අනෙක්

අතට, කතෝලික සහ ක්‍රිස්තියානි කාන්තාවන් දේවස්ථාන පරිපාලනයට සක්‍රියව සහභාගි වෙති. මේ අනුව, සම්මුඛ සාකච්ඡාවලට ලක් කළ කාන්තාවන් අතරින්, ස්වකීය ආගම නිසා පීඩාකාරී බලපෑමකට හසුව සිටියේ හින්දු ස්ත්‍රීන් ය. සම්මුඛ සාකච්ඡාවලට ලක් කළ හින්දු ස්ත්‍රීන්ගෙන් කිසිවෙකුත් අන්තර්-ආගමික සංසදවල සාමාජිකාවන් නොවූ අතර ඔවුන් ඒ පිළිබඳ දැන සිටියේ ද නැත. නමුත් ඔවුහු සිය දිස්ත්‍රික්කයේ පවතින එවන් අන්තර්-ආගමික සංසද ගැන දැනුවත් ව සිටියහ. එසේම ඔවුන් සිය කාන්තා සංවර්ධන කමිටුවල ඉතා සක්‍රිය වූ අතර, සිය ගම්මාන සංවර්ධනය වෙනුවෙන් වැඩ කළහ.

කෙසේ නමුත් යාපනයේ කාන්තාවෝ තමන් විශේෂිත ආකාරයිකන් සිය ආගම විසින් වෙනස්කොට සැලකීමට ලක් කරන්නේ කෙසේදැයි සිය අදහස් පළ කළහ. එක්කෝ ඔවුන්ගේ වැන්දඹුනම් හෝ හෝ ඔවුන්ට දරුවන් නොමැතිනම් , ආගමික විශ්වාසයන් සහ චාරිත්‍ර විසින් ඔවුන්ගේ නියෝජ්‍යත්වය සහ සංචරණය සීමාකර තිබිණි. එපමණක් නොව, නක්ෂත්‍රය පිළිබඳ හින්දු විශ්වාසය විසින් ඇතැම් කාන්තාවන්, අසුබ ග්‍රහ තාරකාවල බලපෑම යටතේ උපත ලබා ඇති බව සලකා ඒ අනුව ගැළපෙන කේන්දර සහිත සහකරුවන් සමග විවාහවන තත්වයට ඔවුන් යොමු කර තිබිණි. මෙයින් සිදුවන්නේ එබඳු දියණියන් සිටින පවුල් විසින්, පිරිමින්ගේ චරිතය පිළිබඳ නොසලකා හරිමින් ඔවුන්ව විවාහ කර දීමයි. එවැනි කාන්තාවන් අසතුටුදායක තත්වයන් යටතේ දිවි ගෙවූ අතර, සමහරුන් සිය සැමියන් විසින් අත්හැර දමා තිබිණි. එසේම දැවැද්ද මත රැවටීමට ලක්වූ අය ද වූහ. මේ සාධක තිබියදී ද, එක් ප්‍රතිචාර දක්වන්නියක් සඳහන් කළේ කාන්තාවන්ට බලවත් භාවයක් ලැබී ඇති අතර බොහෝ පුරුෂයන් යුද්ධය අතරතුර මරණ, තුවාළ හෝ අතුරුදන්වීම්වලට ලක් වීම හේතුවෙන් යුද්ධයෙන් අනතුරුව ඔවුන් නායකත්ව භූමිකාවන් වෙත වේගයෙන් තල්ලු වෙමින් සිටින බවයි (කාන්තා සංවර්ධන සංගමයේ සභාපතිනිය, 2013 මාර්තු 8). මේ අනුව, එම කාන්තාවන් නායකත්ව භූමිකාවන් සඳහා සම්බන්ධ කර ගැනීම සහ ඒ සඳහා සවිබල ගැන්වීම පමණක් නොව, කුලය සහ සමාජයේ පූර්ණ සහභාගිත්වයෙන් ඔවුන් සීමා කර ඇති, ආගම විසින් වෙර ගන්වා තිබෙන සම්ප්‍රදායික වෙනස්කොට සැලකීමේ පරිචයන් වැනි ගැටළු ආමන්ත්‍රණය කිරීම සඳහා ද සම්බන්ධ කර ගැනීම හා සවිබල ගැන්වීම අවශ්‍ය වේ.

## 5.3 අම්පාර

හින්දු කාන්තාවන් සඳහන් කළේ කෝවිල් පරිපාලනයේ රැස්වීම්වලදී සිය සහභාගිත්වය, සිය මතයන් හඬගා කීම සම්බන්ධයෙන් ඉහළ තලයක පවතින නමුත්, ඔවුන්ගේ මතය සඳහා පවතින්නේ කුඩා ගරුකිරීමක් පමණක් බවයි. තීරණ ගැනීමට ස්ත්‍රීන් සම්බන්ධ නොවන අතර, මූල්‍ය හැසිරීමට ද ඔවුන්ට ඉඩ දෙනු නොලැබේ. ස්ත්‍රීන්ගේ මතය සලකා බැලෙනුයේ සාමාන්‍ය රැස්වීම්වලදී පමණි. පූජ්‍යස්ථානය තුළදී ස්ත්‍රියගේ භූමිකාව බඳු එක්රැස් කිරීම, අවට පිරිසිදු කිරීම සහ දානවලදී ආහාර පිරිනැමීම වේ. හින්දු කාන්තාවෝ අම්පාරේ බෞද්ධයන් සහ මුස්ලිම් ජාතිකයන් අතර පූජා භූමියක් අත්පත් කරගැනීම සම්බන්ධ ගැටුම පිළිබඳ අවබෝධයෙන් ද හීන අය වූහ. ඔවුහු, රට බෞද්ධ රටක් බවට පත් කිරීම සඳහා වූ හමුදා කුමන්ත්‍රණක් පිළිබඳ සැකයෙන් පසුවූහ. අන්තර්-ආගමික ගැටුම් උසිගන්වන්නේ පිරිමින් විසිනන් බව ද එම කාන්තාවෝ සඳහන් කළහ.

අම්පාර දිස්ත්‍රික්කයේ මුස්ලිම් කාන්තාවන් සෙසු ප්‍රජාවන් සමග අන්තර් ක්‍රියා සිදුකළේ රජයේ කාර්යාලවලින් සේවා ලබාගැනීමට උත්සාහ ගන්නා විට පමණි. තරුණ මුස්ලිම් කාන්තාවන්ට සෙස්සන් සමග අන්තර්ක්‍රියා කිරීමට ඉඩ ලබානොදුන්නේ විශේෂයෙන්ම ඔලුවිල් සරසවියේ උපාධි අපේක්ෂකයන් සමග අන්තර් ක්‍රියාවන් පැවැත්වීමට ඉඩ ලබා නොදුන්නේ ඔවුන්ව වෙනස් කරනු ඇතැයි යන බිය හේතුවෙනි. සිංහල තරුණයන් සමග රහසින් පළා ගිය මුස්ලිම් තරුණියන් පිළිබඳ සිදුවීම් කිහිපයක් ද විය. මේ අනුව, ස්ත්‍රීහු සෙස්සන් සමග අන්තර්ක්‍රියා සිදුකිරීමට මැලි වූහ. මන්නාරමේ මෙන්ම, මෙම බහුතර මුස්ලිම් කාන්තාවන් ද අවම වශයෙන් පොදු අවකාශය තුළ අන්තර්-ආගමික සහජීවනය ප්‍රවර්ධනය කිරීමට සම්බන්ධ නොවූ බව කිව හැක.

## 5.4. මාතර

මාතර නගරයේදී සම්මුඛ සාකච්ඡාවන්ට ලක් කළ මුස්ලිම් කාන්තාවන් එක් අතෙකින් ආගමික කණ්ඩායම් තුළ ඉතා සක්‍රිය බව සහ, වාර්ෂික සාම දිනයක් සංවිධානය කිරීම වැනි සාමය ගොඩනැංවීමේ ක්‍රියාකාරකම්වලට සම්බන්ධ වී සිටින බවත්, ප්‍රජාවට එරෙහිව පවතින මතවාදයන් පැහැදිලි කිරීම පිණිස සිංහල පුවත්පත්වලට ලිපි ලියමින් සිටින බවත් දක්නට ලැබිණි. කාන්තාවන්ගෙන් බහුතරය වෘත්තිකයන් ද වූ අතර, වැලිගම, මන්නාරම සහ අම්පාරේදී සම්මුඛ සාකච්ඡාවලට ලක් කළ කාන්තාවන්ට වඩා පොදු අවකාශය තුළ ආර්ථික වශයෙන් වඩාත් සක්‍රිය අය වූහ. ඔවුන්ගේ මතය වූයේ කාන්තාවන්ට යමක් පැහැදිලි කර දීමේ සහ ඉවසීමෙන් යුතුව ජනතාවගේ සැකයන් දුරු කිරීමේ හැකියාව ඇති බැවින් කාන්තාවන් සාමය ගොඩනැංවීමේදී වඩාත් හොඳින් ක්‍රියා කරන බව ය.

මාතර බෞද්ධ කාන්තාවන් පැවසුවේ, ස්ත්‍රීන් ක්‍රමික ලෙස එම ප්‍රදේශය තුළ ලිබරල් වෙමින් සිටින බවයි. තවදුරටත් සවිබල ගැන්වීමේ අවශ්‍යතාවය පිළිබඳ ඔවුහු අදහස් දැක්වූහ. ඔවුන් පැවසුවේ, තමන් සහජීවනය සඳහා වන වෙනස් මැදිහත් වීම් එනම්, දිසාපති කාර්යාල මට්ටමේ කටයුතු, ජාතික සාම කවුන්සිලයේ මූලිකත්වයෙන් මෙහෙයවනු ලබන කතිකාවන් යනාදිය හොඳින් දන්නා බව ය. එසේම ඔවුහු අන්තවාදයට එරෙහිව ආණ්ඩුව විසින් ක්‍රියාමාර්ග නොගැනීම ගැන සිය බලාපොරොත්තු සුන් වීම පිළිබඳද අදහස් පළ කළහ. මෙකී ගැටුම් විසඳීමට නම් වෙනස  සිදුවිය යුත්තේ ආකල්පමය මට්ටමෙන් බව ඔවුන් දැරූ මතය විය. සෙසු ප්‍රජාවන් සමග සහජීවනයෙන් ජීවත් වීම පිළිබඳ සිය අත්දැකීම සුන්දර එකක් වූ බව හා, සහජීවනයේ වටිනාකම හා වාසිය ප්‍රවර්ධනය කළ යුතු බව ඔවුහු සඳහන් කළහ. මෙය, මුස්ලිම් කාන්තාවන් විසින් ද තරයේ කියා සිටියේ සිය අතීත අත්දැකීම් සහිත සමය (ඔවුන් මෙය හැඳින්වූයේ බොදු බල සේනාවට පෙර යුගය යනුවෙනි) සිහිපත් කරමිනි. කෙසේ නමුත් අන්තර්-ආගමික කමිටුවක බෞද්ධ සාමාජිකයෙක් දැරූ මතය වූයේ ස්ත්‍රීන් අන්තර්-ආගමික කමිටුවල සක්‍රිය අය නොවන අතර, සහභාගිත්වයෙන් වාසියක් ලැබේ යැයි ඔවුන්ට නොසිතෙන නිසා, ඔවුන් ඒවාට නොපැමිණෙන බව ය.

දෙණියායෙන් පැමිණි, අන්තර්-ආගමික කමිටුවක සාමාජිකාවන් ද වන තරුණ හින්දු සහ ක්‍රිස්තියානි කාන්තාවන් සඳහන් කළේ, තමන් තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී පිරිමින් හා සමානව ඒ සඳහා සහභාගී වීමට සමත් වූ බවයි. කෙසේ නමුත් වයස සහ ජ්‍යේෂ්ඨත්වය

හේතුවෙන් පිරිමි සාමාජිකයන්ගේ තීරණ අවසානයේ හැමවිටම පිළිගැනෙනා බව ද ඔවුහු සඳහන් කළහ. නායකත්වය සහ ගැටුම් ලිහිල්කරණය සම්බන්ධයෙන් තරුණියන්ට සිය මව්භාෂාවෙන් විශාල වශයෙන් පුහුණු වීම් අවශ්‍ය කරන බව ඔවුහු කියා සිටියහ. බොහෝ පුහුණු වැඩසටහන් පැවැත්වෙන්නේ සිංහල භාෂාවෙන් වන හෙයින්, දමිළ කතා කරන්නන් හට එහිදි අවාසියක් සිදු වේ. මේ තරුණ කාන්තාවන් මුහුණ දුන් තවත් බාධකයක් වූයේ රජයේ නිලධාරීන්ගේ වාර්ගිකත්වයේ පදනම මත මෙම කතුන් සිය ගැටළුවලට විසඳුම් පතා ඔවුන් වෙත එළඹීමට මැලි වීමයි. මූල්‍ය වාසි වෙනුවෙන් අන්‍යාගම්කරණයට නතු වන්නේ වැඩි වශයෙන්ම කාන්තාවන් වන හෙයින්, අන්තර්-ආගම් ගැටුම සඳහා කාන්තාවන් හේතුවක් වූ බව ද ඔවුහු සඳහන් කළහ. ස්ත්‍රීන් අතර දැනුවත්භාවය වර්ධනය කිරීම අන්තර්-ආගම් ගැටුම වළක්වා ගැනීම පිණිස වැදගත් මැදිහත්වීමක් සේ මේ අනුව ඉස්මතු කර දැක්විණි. ගැටුම් ලිහිල්කරණය සම්බන්ධයෙන් සවිබලගැන්වීම හා සහභාගිත්වය මේ අනුව, ආගම/ග්‍රාමයේ ගතියන්, වාර්ගිකත්වය, කුලය, පන්තිය, නිරාවරණය, වයස, කැමැත්ත මෙන්ම ආගම අනුව වෙනස් වේ. මෙකී උනන්දුජනක සාධක විසින් එක්කෝ සක්‍රිය සහභාගිත්වය වෙත කාන්තා ප්‍රවේශය සහ අන්තර්-ආගමික කමිටුවලදී ඔවුන්ගේ මතය සලකා බැලීම ප්‍රවර්ධනය කිරීම හෝ යටපත් කිරීම සිදු වේ. මේ අනුව, මාතර නගරයෙන් පැමිණි, වෘත්තිකයන් ද වන මුස්ලිම් කාන්තාවන්ට පොදු අවකාශයන් හි සංචරණය සඳහා ප්‍රවේශය පැවති අතර මාතර, මන්නාරම සහ අම්පාරේ කාන්තාවන්ට වඩා අර්ථවත් සහභාගිත්වය අතින් ඔවුහු වඩාත් බලගැන්වී සිටියහ. සියලුම දිස්ත්‍රික්කවල හින්දු ජාතික ප්‍රතිචාර දක්වන්නියන්, ආගමික ආයතනවලින් වෙනස්කොට සැලකීම්වලට ලක්වන අතරවාරයේ හෙළි කර සිටියේ කාන්තා සහභාගිත්වයේ පරිමාණය, අදාළ විෂයගත කාරණය සම්බන්ධයෙන් ඔවුන් දක්වන උනන්දුව සහ සැලකිල්ලේ ප්‍රමුඛතාවය මත රඳා පවතින බවයි. උදාහරණයක් වශයෙන්, මන්නාරම හින්දු කාන්තාවන් යටිතල පහසුකම් සංවර්ධනය සහ සිය දරුවන්ගේ රැකියාවන් වැනි දැවෙන ප්‍රශ්න කෙරෙහි, අන්තර්-ආගමික ගැටුමට වඩා උනන්දුවක් දැක්වූහ. වයස සහ ජ්‍යෝෂ්ඨත්වයට ගරු කිරීමේ සංස්කෘතිය ද තරුණ සහභාගිත්වයේ පරිමාණයට බලපාන අතර, විශේෂයෙන්ම දැරියන්ට වැඩිමහල් සාමාජිකයන්ගේ මතයන්ට නතු වීමට සිදුවන්නේ ගෞරව කරන බවට සලකුණක් ද වශයෙනි. අවසානයේ ස්ත්‍රියකගේ ආර්ථික තත්වය ද ඇගේ සහභාගිත්වයේ උනන්දුව වෙත බලපායි. එහිදී ඇය එයට සම්බන්ධ වීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඇයට ලැබෙන ආර්ථික ප්‍රතිලාභ කවරේද යන්න මත එය රඳා පවතියි.

මෙකී සාධකවලට අනනුකූලව, කාන්තා සහභාගිත්වයට බලපාන කාරණයක් වශයෙන් පර්යේෂකයන් නිරීක්ෂණය කළේ සාමූහිකයක් තුළ කාන්තාවන්ගේ අර්ථසම්පන්න සහ සක්‍රිය සහභාගිත්වය සිදුවන්නේ එම කණ්ඩායමේ සියලුම දෙනා ස්ත්‍රීන් වන විට පමණක් බවයි. මේ අනුව මාතර මුස්ලිම් කාන්තාවන්ගේ ආගමික කණ්ඩායම මෙන්ම මන්නාරම, යාපනය සහ අම්පාර කාන්තා සංවර්ධන සමිති ද හැකියා වැඩිදියුණු කරගැනීම, ජීවනෝපාය පුහුණු වැඩසටහන්, යටිතල පහසුකම් සංවර්ධනය සහ ණය වැඩසටහන් වැනි තමන්ට වැදගත් වන කාරණා සම්බන්ධයෙන් අදාළ පාර්ශවයන් සමග වැඩ කටයුතුවල නියැළෙමින් සහ ඒවාට සම්බන්ධ වෙමින් සිටියහ. එසේ හෙයින්, අන්තර්-ආගමික කමිටුවලට ඔවුන් සම්බන්ධ වීම රෝධනය කරනුයේ ස්ත්‍රීන්ට ගැටුම් ලිහිල්කරණය පිළිබඳ ගැටළුවලට අර්ථසම්පන්න ලෙස දායක වෙමින් කළ හැකි කිසිවක් නැත යන ආවේණික පුරුෂමූලික ආකල්පය හේතුවෙන්

යැයි තර්ක කළ හැකිය. එකිනෙකට වෙනස් අන්තර්-ආගමික කමිටුවල ආගමික නිලයන් දරන පුරුෂයන් දෙදෙනෙකු විසින් මන්නාරමේදී සහ මාතරදී මෙන්ම මන්නාරමේ කාන්තා සංවර්ධන සමිතියේ මුස්ලිම් සාමාජිකාවන් විසින් ද (වාර්තාවේ මීට පෙර එය උපුටා දක්වා ඇත) මේ මතය පළ කර තිබේ. අන්තර්-ආගමික කමිටු සහ ගැටුම් ලිහිල්කරණයේදී මේ අනුව කාන්තා සහභාගිත්වය සට්ටනය කරන සාධක අන්තර්ස්ථරීය සහ සන්දර්භ සුවිශේෂී ඒවා වේ. මෙමගින් හුදෙක් ස්ත්‍රීන් සහ පුරුෂයන් අතර පමණක් නොව, ස්ත්‍රීන් එකිනෙකා අතර ද විශාල පරතරයක් ඇති කරයි.

# 6. නිගමනය

1-5 කොටස්වල සාකච්ඡාව මගින්, අන්තර්-ආගමික ගැටුම දිස්ත්‍රික්ක හතර තුළ වෙනස් ආකාරවලින් ප්‍රත්‍යක්ෂ වන බව හෙළිදරව් කරන අතර, එම ආතතිය සහ ගැටුම සඳහා යටිබිම්ගත හේතු හෝ හැකි කරවන/සාධ්‍ය කරන තත්වයන් සමාන ලෙසම පවතියි. දිස්ත්‍රික්ක හතරෙහිම ගතිකයන් පෙන්වා දෙනුයේ අන්තර්-ආගමික ගැටුමේ කේන්ද්‍රය රටේ බෞද්ධ ජාතිවාදය ප්‍රවර්ධනය කිරීමේ රාජ්‍ය අනුග්‍රහය ලත් න්‍යායපත්‍රය සහ අන්තර්-ආගමික ප්‍රචණ්ඩත්වයට වගකිව යුත්තන් වෙත පිරිනමා ඇති දණ්ඩ මුක්තිය පමණක් නොව, මන්නාරම කතෝලිකයන්, උතුරු පළාතේ හින්දූන් සහ අම්පාර මුස්ලිම්වරුන්ගේ ජනවාර්ගික-ආගමික අනන්‍යතාවයන් මත පදනම් වූ ප්‍රාදේශීය/කලාපීය ජාතිවාදයන් ද වන බවයි. මෙය පූජා අවකාශයන් සහ ආගමික සංකේතනය සම්බන්ධයෙන් හටගෙන ඇති වාදසම්පන්න තත්වය තුළ වැඩිවශයෙන්ම ප්‍රකට වේ. මෙය එක් එක් දිස්ත්‍රික්කයේ දේශපාලන වාතාවරණයට බලපානවා පමණක් නොව, සමස්තයක් ලෙස ප්‍රජාවන්ගේ මනෝභාවයට ද බලපානු ලබයි. උදාහරණයක් වශයෙන්, මන්නාරම කතෝලිකයන් සහ ක්‍රිස්තියානින් අතර ගැටුම, දිස්ත්‍රික්කයේ කතෝලික අනන්‍යතාවය පුපුරායාම පිළිබඳ හැඟීමේ ප්‍රතිඵලයකි. මේ හා සමානව, එනමුත් දිස්ත්‍රික්ක හතර පුරාම මුස්ලිම් විරෝධී මතිමතාන්තර (ක්‍රිස්තියානින් කෙරෙහි වූ සෘණාත්මක මතයන් අඩු මට්ටමකින්) ඇතිවන්නේ මුස්ලිම්වරුන් විසින්, රාජ්‍ය අනුග්‍රහය ලත් බෞද්ධ ජාතිවාදයෙන් පැන නගින බෞද්ධ ප්‍රජාවේ බහුතරවාදී පරිකල්පනයට එයින් එල්ල වන අභියෝගය හේතුවෙනි. ජනවාර්ගික-ආගමික පාරිශුද්ධත්වය හෝ පරමභාවය පිළිබඳ මෙම මතිමාත්‍රයට සිදුවන මෙම පුපුරා යාම විසින් සෑම දිස්ත්‍රික්කයකම ප්‍රජාවේ සිටින කුඩා (අවැදගත්) සුළුතරය (අයියදොරේ 2006) භීතියේ වාතාවරණයක් වෙත අවදානමේ හෙළනු ලබයි. මෙම භීතියට තවදුරටත් පවන් සළනුයේ එකිනෙකට වෙනස් ජනවාර්ගික-ආගමික කණ්ඩායම් අතර පවතින කුලය සහ දුප්පත්කම වැනි සමාජ හා සංස්කෘතික සාධක විසින් උග්‍ර කරනු ලැබූ ආර්ථික හා සමාජයීය අසමානතාවයන් විසිනි. අන්තර්-ආගමික ආතතිය සහ ගැටුම යනු මේ අනුව ජනවාර්ගික-ආගමික පාරිශුද්ධත්වය හෝ තර්ජනාත්මක 'අනෙකා' හට අභියෝග කිරීම මගින් ඇතිවන අධිපතිභාවය සන්නිකර්ෂණය කර ගැනීම සඳහා වන මනෝවිද්‍යාත්මක ආශාව බවට වේගයෙන් පත් වේ. මේ අභියෝගය ප්‍රාථමික අන්දමින් සාක්ෂාත් කරගනු ලබන්නේ තර්ජනාත්මක 'අනෙකා'ට හිමි ස්ථානය අත්පත් කර ගැනීම හරහා ය. මේ අනුව දිස්ත්‍රික්ක හතරේම කතෝලිකයන්, හින්දූන් සහ බෞද්ධයන් විසින් නිරාගමික, ජන ගහණ අවකාශයන් ග්‍රහණයට ගෙන, ඒවා ජනවාර්ගික-ආගමික සුවිශේෂීතාවයන් බවට නැවත නම් කිරීමෙන්, ආග මික ප්‍රතිමා නැංවීමෙන් සහ වන්දනාමාන කිරීම සඳහා ස්ථාන ඉදිකිරීමෙන් සපුරා ගනියි.

අනෙක් අතට, මන්නාරම සහ අම්පාර මුස්ලිම් ප්‍රජාව විසින් සිය අනන්‍යතාවය තරයේ කියා සිටින අතර, ඉඩම් මිලදී ගැනීම හා භූමිය ප්‍රසාරණය කර ගැනීම හරහා සිය ආධිපත්‍යය තහවුරු කර ගනිති.

රටෙහි පශ්චාත් යුධ වාතාවරණය දමිළයන් හා බෞද්ධයන් අතර මාතර, යාපනය සහ මන්නාරමෙහි අන්තර්-ආගමික ගැටුමෙහි තවත් සුවිශේෂී හැකිකරවන/සාධ්‍ය කරන තත්වයකි. උතුරු පළාතේ බුද්ධ ප්‍රතිමා ස්ථාපනය සහ යාපනයේ හින්දු ස්ථාන විනාශ කිරීම, නැවත නම් කිරීම සහ අත්පත් කර ගැනීම වැනි හමුදාව විසින් (කළ බව කියන) ක්‍රියාවන්ගෙන් බහුතරය ප්‍රජාව විසින් දකින්නේ ආගමික අනාරක්ෂිතභාවයෙන් හෝ පසමිතුරුභාවයෙන් පැන නගින්නක් ලෙස නොව, ජනවාර්ගික-ආගමික පදනමෙන් යුතු වූවක් ලෙස ය. මේ හා සමානව දෙණියායාවේ දමිළ ජාතික ප්‍රතිචාර සැපයූවන් විසින් සිංහල ප්‍රජාව සමග සිය සම්බන්ධතාවය අර්ථ දැක්වූයේ 1983 ජනවාර්ගික ප්‍රචණ්ඩත්වයේ සිය මතයන්ට සම්බන්ධිතව ය. මුස්ලිම්-දමිළ සබඳතා ද ප්‍රධාන වශයෙන් පදනම් ව තිබෙන්නේ ආගම මත නොව, වාර්ගික වෙනස්කම් සහ උතුරුකරයෙන් 1990 වසරේදී මුස්ලිම්වරුන් නෙරපා හැරීම හේතුවෙන් ඉරිතළා ගිය සබඳතා මත ය. මේ අනුව මතුපිට ඇති ගැටුම් සහ ප්‍රචණ්ඩත්වය ආගමික ප්‍රතිෂ්ඨාවක් මත පදනම් වී ඇති බව පෙනුණද, ඇත්ත වශයෙන්ම ඒවා පැන නගින්නේ අන්තර්-ආගමික ආතතීන් තුළින් වන නමුත්, එය ආගමික ගටුමක් ලෙස විද්‍යාමාන වීමට හෝ ප්‍රත්‍යක්ෂ කර ගැනීමට පුළුවන. කෙසේ වෙතත්, වාර්ගිකත්වය ආගම පරයා කාහල නගන වාර්ගික ජාතිවාදයේ මෙම වැදගත් භූමිකාව දිස්ත්‍රික්කයේ බහුතර ප්‍රජාව කවුද යන්න මගින් නිශ්චය කිරීම ද සිදුවේ. ඒ අනුව මන්නාරමේ බෞද්ධයන් දමිළ කතෝලික බහුතරය හමුවේ හින්දූන් කෙරෙහි සංවේදාත්මකව බලන අතර, අම්පාරේදී බෞද්ධයන් මුස්ලිම් බහුතරය වෙත එදිරිවාදිකම් පාන්නේ දමිළ ප්‍රජාව හඳුනාගැනීම සිදු කරමිනි. මෙසේ වින්දිතභාවය විසින් වෙනස් (සහ සෙසු ආශ්‍රිත කරුණුවලදී එකිනෙක සමග ගැටෙන) සුළුතර ප්‍රජාවන්, සුවිශේෂී බහුතරය සමග ගැටෙන අවස්ථාවලදී (මතවාදීමය වශයෙන්) එකිනෙකාට සමීප වෙයි.

මෙකී අංගසම්පූර්ණ හැකිකරවන තත්වයන් විසින් දිස්ත්‍රික්ක හතර තුළ එකිනෙකට වෙනස් ආතතීන් හා ගැටුම්වල රටා නිෂ්පාදනය කරන අතර, බෞද්ධ, හින්දු, කතෝලික සහ රෝමානු කතෝලික නොවන ක්‍රිස්තියානි යන සියල්ලන් තුළින් නිර්ගමනය වන අනවරත තේමාව වන්නේ එකී හැකිකරවන තත්වයන්ට අනනුකූලව මුස්ලිම් ප්‍රජාව වෙත දක්වන සැකය, අවිශ්වාසය සහ/හෝ එදිරිවාදිකම් ය. මන්නාරම, යාපනය සහ අම්පාරේ මුස්ලිම්-දමිළ සබඳතා 1990 වසරේ එල්ටීටීඊ ය විසින් මුස්ලිම් ප්‍රජාව නෙරපා හැරීම නිසා ඇති වූ පසුබෑමෙන් කෙළසී ගියේය. මුස්ලිම්වරුන් නෙරපීම හේතුවෙන් මෙකී දිස්ත්‍රික්ක එම මුස්ලිම් ජනගහනය ස්වභාවිකව ඉහළ යන අන්දම අත්නුදුටු අතර, ඔවුන් ආපසු පැමිණි විට ඉඩම්වලට ප්‍රවේශය සහ දේපළ නැවත අත්පත් කරගැනීම සම්බන්ධයෙන් ගැටළු පැන නැගෙන්නේය. තමන්ගේ න්‍යායපත්‍රවලට අනුව කටයුතු කරන දේශපාලකයන් විසින් මෙකී ආතතීන්ට තවදුරටත් ගිනි පිඹිනු ලැබිණි. කෙසේ නමුත් මුස්ලිම් ජනගහනයේ ඉහළ යාම, ඔවුන්ගේ ආර්ථික සමෘද්ධිය, පල්ලි ප්‍රගුණනනය වීම, සදාචාර නොවන ලෙස ආගමට හරවා ගැනීම සහ භූමිය ප්‍රසාරණය වීමට එරෙහිව බෞද්ධ චින්තනය තුළ (සහ කිසියම් දුරකට දමිළයන් අතර) භීතිය සහ සැකයේ පොදු කතිකාවක් ද එමගින් හෙළි කරයි.

දමිළයන් සහ මුස්ලිම් ජාතිකයන් අතර ගැටුම දුප්පත්කම (අම්පාර), ආර්ථික පරාධීන බව (අම්පාර), ඉඩම් (මන්නාරම, යාපනය සහ අම්පාර) සහ සම්පත්වලට ප්‍රවේශය (මන්නාරම සහ අම්පාර), බෞද්ධ මුස්ලිම් සබඳතා මත පදනම් වූ ස්පර්ශනීය/ප්‍රත්‍යක්ෂ ආර්ථික සාධක මත පදනම් වන බව පෙනී යන අතරවාරයේ, අනෙක් අතට ඒවා වැඩි වශයෙන්, ප්‍රත්‍යක්ෂ ප්‍රතිඵල විදහා දක්වන අවබෝධයේ මට්ටමේදී මතවාදීමය ගැටුම් මත රඳා පවතින බව ද පෙනේ. මේ අනුව මාතර සහ අම්පාරේදී බෞද්ධ ප්‍රතිචාර දක්වන්නන් විසින් ස්වකීය 'අනෙකා' ලංකාවට ආවේණික නොවන ආගමක සාමාජිකයෙක් ලෙස සහ සිංහල බෞද්ධ අනන්‍යතාවයට 'තර්ජන' වශයෙන් සලකා ප්‍රතිචාර දක්වන බව පෙනී යයි. මේ බව, පූජා භූමි ආගමික ක්ෂේත්‍ර වශයෙන් සලකා ඉඩම් අත්පත් කරගනිමින් අම්පාරේ බෞද්ධ අනන්‍යතාවය සංකේතීය ලෙස නැවත බලගැන්වීමට පවතින අවශ්‍යතාවය තුළ පෙනී යයි. එසේම බෞද්ධ ප්‍රජාව විසින් (සම්මුඛ සාකච්ඡාවලදී) විදහා පෑමට උත්සාහ කළ ඔවුන්ගේ චින්තනය තුළ වූ මතවාදීමය සහ සදාචාරය ගැටුම ද අවධාරණය කළ යුතුය. එහිදී ස්වයං විවේචනවලින් සිය ජාතිවාදී ප්‍රකාශයන් යෝග්‍යතාකරණයටලක් කරන්නේ 'දේශපාලනික නිවැරදිභාවය' සඳහා උත්සාහ කරමිනි. අන්තවාදී බෞද්ධ ජාතිවාදී කණ්ඩායම්, අන්තවාදී ආගමික නායකයන් සහ දේශපාලකයන් වැනි කාරක විසින් සූරාකෑමට ලක් කිරීමට ප්‍රජාව නැඹුරු කරනුයේ මෙකී සදාචාරමය අනාරක්ෂිතභාවයන් සහ වික්ෂිප්තභාවය විසින් යැයි ද තර්ක කළ හැකිය.

යම් විශේෂිත දිස්ත්‍රික්කයක සිටින එකිනෙකට වෙනස් ජනවාර්ගික-ආගමික ප්‍රජාවන්ගේ භූගෝලීය ස්ථානගත කිරීම සහ ජනගහනයේ පැතිරීම ද වාර්ගික-ආගමික සබඳතාවලට බලපෑම් ඇති කළ හැකි වැදගත් හැකිකරවන කොන්දේසියක් වේ. මෙය විශේෂයෙන්ම මුස්ලිම් ප්‍රතිචාරකරුවන් විසින් දැක්වූ ආකල්පවලින් පෙන්නුම් කරයි. දිස්ත්‍රික්ක හතරේම මුස්ලිම්වරුන්ට එරෙහිව සිංහල සහ දමිළ ප්‍රජාවන්ගේ ක්‍රියාකලාපයන්/මනෝගතිකයන් පදනම් වන්නේ වාර්ගික -ආගමික අවිශ්වසනීයත්වය සහ අනාරක්ෂිත බව මත ය. මුස්ලිම්වරුන් බොහෝ විට වින්දිත ස්ථාවරයක් ගනු ලබනවාක් මෙන්ම විශේෂයෙන්ම මන්නාරම සහ යාපනය තුළ, සිය හිමිකම් නැවත ලබාගත යුතු සහ ආරක්ෂා කරගත යුතු හිංසාවට ලක්වූ සුළුතරයක් වශයෙන් සිය තත්වය ප්‍රකට කරනුයේ හිමිකම පිළිබඳ අදහසක් ද විදහා පාමිනි. මෙයට විලෝම වශයෙන් මාතර නගරයේදී මුස්ලිම් ප්‍රතිචාරකරුවන් විසින් සිය මානවවාදී ක්‍රියාවන්ගෙන් සහ සිංහල ප්‍රජාවගේ දුරාවබෝධයන් ආමන්ත්‍රණය කිරීමට උත්සාහ දරමින් ධනාත්මක ප්‍රතිරූපයක් තනාගැනීම සඳහා සවිඥානික ලෙස උත්සාහ කරනු දැකගත හැකි විය.

දිස්ත්‍රික්ක හතරේම කතෝලික ක්‍රිස්තියානි (රෝමානු කතෝලික නොවන) මෙන්ම හින්දු ක්‍රිස්තියානි සබඳතා ද, මාතර දිස්ත්‍රික්කයේ බෞද්ධ ක්‍රිස්තියානි සබඳතා ද ඉවැන්ජලික පල්ලි විසින් සිදුකරනු ලබන සදාචාර නොවන අන්‍යාගමිකරණය හා සම්බන්ධිත ය. අභ්‍යන්තර ආගමික ගැටුම (මෙම පර්යේෂණ පත්‍රිකාවේදී කේන්ද්‍රීය නොවන) ද දිස්ත්‍රික්ක හතරෙන්ම නිර්ගමනය වන කැපී පෙනෙන ලක්ෂණයක් විය. කතෝලික සහ ඉවැන්ජලික පල්ලි අතර මෙන්ම ඉවැන්ජලික පල්ලි එකිනෙක අතර ද භෞතික ප්‍රචණ්ඩත්වය පිළිබිඹු කරන අභ්‍යන්තර ක්‍රිස්තියානි ගැටුම මන්නාරම තුළ වඩාත් ප්‍රමුඛ වේ. කෙසේ නමුත් මෙකී ගැටුම ගම් හෝ පවුල් මට්ටමේ පවතියි. මන්නාරම, කලාපීය ආගමික ජාතිවාදය සඳහා ද නිදසුනකි. එහිදී එම දිස්ත්‍රික්කය හඳුනා ගැනෙන්නේත් හඳුන්වන්නේත් කතෝලික දිස්ත්‍රික්කයක් ලෙස ය. මෙමගින්

ප්‍රකට මඩු පල්ලියේ පැවතීම සංකේතීය ව නිරූපණය කරන අතර, ප්‍රදේශයේ පරිපාලන සහ දේශපාලන අධිකාරිය මන්නාරම බිෂොප්වරයාගේ සහ කතෝලික පියතුමන්ලා විසින් පාලනය කරන අතර, මන්නාරමේ ඓතිහාසික වැදගත්ම ද කතෝලිකකරණයට සම්බන්ධ වේ. පශ්චාත් යුද සමයේ හින්දු ජාතිවාදයේ නිර්ගමනය (ප්‍රතිචාරාත්මක ලෙස) නිරූපණය වන්නේ ගණ දෙවි ප්‍රතිමාව ක්‍රිස්තියානි පිළිම සමග ස්ථාපනය කිරීම මගිනි. එසේ සිදුවීම කෙරෙහි දේශපාලන උත්තේජනයන් දායක වන බවට වන කරුණ එසේම තිබියදී, පොදු අවකාශයන් ක්‍රිස්තියානිකරණය කිරීම දිස්ත්‍රික්කය තුළ සුවිශේෂී වර්ධනයක් වන අතර, එය වැඩිදුර අධ්‍යයනය සඳහා සුදුසුකම් ලබයි. මන්නාරමේ මෙකී විද්‍යාමාන වීම පසෙකලා අම්පාර, මාතර සහ යාපනයේ හින්දු-ක්‍රිස්තියානි සබඳතා වඩාත් සුහද සහ ඉවසනසුලු ආකාරයෙන් වර්ධනය වන්නේ, ක්‍රිස්තියානි ආගමට සදාචාර නොවන ලෙස හරවා ගැනීමේ ගැටළුව එලෙසම තිබියදීය.

අභ්‍යන්තර බෞද්ධ ගැටුම ද අන්තවාදීන් අතර පමණක් නොව මධ්‍යස්ථ බෞද්ධයන් සහ බෞද්ධ පූජ්‍ය පක්ෂය අතර පවා දැකගත හැකි වැදගත් සාධයක් වන නමුත්, එය ක්‍රියාත්මක වන්නේ සම්ප්‍රදායික බෞද්ධ වටිනාකම් වැළඳගෙන සිටින තනි පුද්ගල බෞද්ධයන් අතර අන්තවාදී බලපෑම් පිළිගැටුමට ලක් කරමිනි. මේ බව, ලිබරල් බෞද්ධ ප්‍රතිචාරකරුවන් විසින් අන්තවාදී කන්ඩායම් සිය අන්තර්-ආගමික ක්‍රියාකාරකම්වලට විරෝධය පෑම හේතුකොට ගෙන ඇති වූ අභියෝග වශයෙන් මාතර සහ අම්පාර දී පැහැදිලිව දැකගත හැකි වූ අතර, අන්තවාදය සමග ගනුදෙනු කිරීමේදී ඔවුන් තුළින් යම්කිසි අසරණභාවයක් ද ප්‍රකට වනු දැකගත හැකි විය.

අන්තර්-ආගමික ආතති සහ ගැටුම් සඳහා හේතුවලට එළඹීමේදී (මේයර්ගේ ගැටුම්වල ස්වාමිත්වය) සාකල්‍ය කලාපීය ප්‍රත්‍යවේක්ෂණයක සිට විමසන විට බලය, කණ්ඩායම් අනන්‍යතාවය සහ අවකාශය විසින්/වෙනස් ආගමික ප්‍රජාවන් අතර මන්නාරම සහ අම්පාර යන දිස්ත්‍රික්ක දෙකෙහිදීම එය හැකි කරවා තිබෙන්නේ දේශපාලන, ආර්ථික සහ මනෝවිද්‍යාත්මක (උදා. මුස්ලිම් ප්‍රසාරණය පිළිබඳ බිය, ආගමික අනෙකා පිළිබඳ මිත්‍යාවන් සහ අනවබෝධයන්, සහ ප්‍රමුඛතර කණ්ඩායම වශයෙන් යමෙකුගේ අනන්‍යතාවය අහිමි වුන ඇතැයි යන බිය) තත්වයන් විසිනි. යාපනයේදී අවකාශය සහ ස්ථානය සම්බන්ධයෙන් මුස්ලිම්වරුන් සහ දමිළ දේශපාලන අධිකාරිය අතර ගැටුම හැකි කරවා තිබෙන්නේ දේශපාලන තත්වයන් විසිනි. කුලය පදනම් කරගත් වෙනස්කොට සැලකීම් වලින් (කණ්ඩායම් අනන්‍යතාවය වැනි) බලපෑමට ලක් වූ අභ්‍යන්තර-හින්දු සබඳතා එසේ බලපෑමට ලක්වීම හැකි කරවා තිබෙන්නේ දිස්ත්‍රික්කය තුළ ඇති සංස්කෘතික, ආර්ථික සහ දේශපාලන තත්වයන් විසිනි. එපමණක් නොව, යාපනය තුළ හින්දු-බෞද්ධ සම්බන්ධතා පෞරුෂය, අවකාශය සහ හින්දු ප්‍රජාවේ අනන්‍යතාවය හමුදාව විසින් අරෝවට ලක් කර තිබෙනුයේ නැවත වරක් දේශපාලනික තත්වයන් විසිනි.

එක් එක් දිස්ත්‍රික්කයේ තත්වයන් ගැටුම් නිරාකරණ ක්‍රමවේදයන් වලටද, සකස් කරගෙන ඇති ක්‍රමෝපායයන්ටද බලපානු ලබයි. මේ අනුව එක් එක් දිස්ත්‍රික්කයේ ගැටුම් ලිහිල්කරණ ක්‍රමෝපායයන් අතිශය සන්දර්භ සංවේදී ය. සම්මුඛ සාකච්ඡාවලින් අනාවරණය කරන්නේ දිස්ත්‍රික්කවල ගැටුම් නිරාකරණ යාන්ත්‍රණයන් සහ නීති සාධන සහ නෛතික යාන්ත්‍රණයන් මත එම ප්‍රජාවන් තබා තිබෙන විශ්වාසය මත රඳා පවතින බවයි. ඒ අනුව, මන්නාරමේ අන්තර්-ආගමික ගැටුම්වල වින්දිතයන්, විකල්ප ආරවුල් නිරාකරණ ක්‍රමවේදයන්ට යොමුවනු වෙනුවට නීතියේ පිළිසරණ පැතීම උනන්දු ජනක සහ සුවිශේෂී කාරණයක් වේ. එසේ

වන්නේ ප්‍රාදේශීය කතෝලික පරිපාලකයන්ගේ අපක්ෂපාතිත්වය පිළිබඳ ඔවුන් තුළ පවතින මද විශ්වාසය හේතුවෙනි. මෙයට විලෝම වශයෙන් අම්පාර සහ මාතර දිස්ත්‍රික්කවල නීති සාධන නිලධාරීන් සහ නීති ක්‍රමය සම්බන්ධයෙන් අඩු විශ්වාසයක් පවතින අතර, ඔවුන් විසින්ම සිය අන්තර්-ආගමික ආරාවුල් විසඳා ගැනීමට නැඹුරු වන්නේ ඒවා රටේ බෞද්ධ අනන්‍යතාවයට අභියෝග කිරීම් වන හෙයිනි. එපමණක් නොව, ආරෝවන් පවතින ආගමික සහ පුරාවිද්‍යාත්මක ක්ෂේත්‍රයන්වලට සම්බන්ධ ගැටළු මහා/සාකල්‍ය පරිමාණයෙන් පවතිනුයේ දේශපාලකයන්ගේ සහ මුද්‍රිත, සමාජ මාධ්‍යවල අනුමිතිය හේතුවෙනි. මෙමගින් ගැටුම උත්සන්න කරවන බහුවිධ අවබෝධයන් ප්‍රතිඵල කරයි. අන්තර්-ආගමික සහජීවනය ප්‍රවර්ධනය කරන වඩාත් සියුම් ක්‍රමෝපායයන් වූයේ ද මාතර සහ මන්නාරම අන්තර්-ආගමික කමිටු සහ අධ්‍යාපනික මුලපිරීම් වුවත්, මෙකී එළැඹුම් අප්‍රමාණවත් බව පෙනී යයි. නොඑසේ නම්, ගැටුම ආමන්ත්‍රණය කිරීමට සහ විසඳීමට ඔවුන් සතු හැකියා පරාසයට සීමා වන බව පෙනී යයි. එයට අදාළ සම්මුඛ සාකච්ඡා යෝජනා කරන්නේ මෙකී කමිටු සහ මුලපිරීම් සඳහා වන අවකාශය වඩාත් බලගැන්විය යුතු වන බව ය.

ගැටුම් ලිහිල්කරණය සහ/හෝ අන්තර්-ආගමික ගැටුම් ප්‍රචලිත කිරීම සම්බන්ධයෙන් කාන්තාවගේ භූමිකාව නැවත වරක් එක් එක් දිස්ත්‍රික්කයේ තත්වය අනුව නිශ්චය වෙයි. පර්යේෂණයේ සොයාගැනීම් පෙන්වා දෙන්නේ ස්ත්‍රීන් විසින් සෙසු ආගමික ප්‍රජාවන් පිළිබඳ ශක්තිමත් මතයක් (ධනාත්මක හෝ සෘණාත්මක) දරන බවත්, සිය ප්‍රදේශවල අන්තර්-ආගමික ගැටුම්වල සියුම් භාවයන් සම්බන්ධයෙන් ඔවුන් තුළ දැනුවත්භාවය පවතින බවත්, ඇතැම්විට අභ්‍යන්තර ආගම් ප්‍රචණ්ඩ ක්‍රියාවන් සම්බන්ධයෙන් සක්‍රිය කොටස්කරුවන් බවට ඔවුන් පත්වන බවත් ය. කෙසේ නමුත් මෙහි විෂමතාවයක් පවතිනුයේ, ඔවුන්ගේ නියෝජ්‍යත්වය තුළ සහ අන්තර්-ආගම් සංසදය සහ සාමය ගොඩනැංවීමේ ක්‍රියාකාරකම් තුළ සහභාගිත්වයේදී ඔවුන්ට ලැබෙන පිළිගැනීම අනුව ය. මෙකී විෂමතාවය හුදෙක් ඔවුන්ගේ ජනවාර්ගික-ආගමික පසුබිම මත නිශ්චය වන්නක් නොව, ඔවුන්ගේ කුලය, සංස්කෘතිය, සමාජයේ නැගී සිටීම මෙන්ම භූගෝලීය ස්ථානගත කිරීම මත ද වේ. මේ අනුව ග්‍රාමීය මන්නාරම සහ අම්පාරේ මුස්ලිම් කාන්තාවන් ප්‍රාදේශීය අන්තර්-ආගමික ගැටළු සම්බන්ධ සාකච්ඡාවලට මුලපිරීමේදී සහ බලාත්මක තීරණ ගැනීමේදී අඩු නියෝජ්‍යත්වයක් පෙන්නුම් කරන අතර, මාතර නගරයේ මුස්ලිම් කාන්තාවෝ සාමය ගොඩනැංවීමේ ක්‍රියාකාරකම්වලදී වැඩි දායකත්වයක් විදහා දක්වති. මේ හා සමානව, යාපනයේ හින්දු කාන්තාවන් සහ අම්පාරේ හින්දු කාන්තාවන්, මන්නාරම් කාන්තාවන්ට වඩා වැඩි වශයෙන් ප්‍රාදේශීය කාන්තා සංවිධාන සමග සම්බන්ධ වී කටයුතු කරති. අන්තර්-ආගමික කටයුතුවල නිරන්තරව නියැළීමට හැකියාව ඇති බව පෙන්වන්නේ ක්‍රිස්තියානි සහ බෞද්ධ කාන්තාවන් වන නමුත්, ඒ කොතරම් දුරකටදැයි දත්තවලින් සඳහන් කළ නොහේ. කෙසේ නමුත් සිය නියෝජ්‍යත්වයේ මට්ටමට අනනුකූල ලෙස, එම කාන්තාවන් වැඩි වශයෙන් අන්තර්-ආගමික කමිටුවල සහ සාමය ගොඩනැංවීමේ ක්‍රියාකාරකම්වල නියැළීම වැදගත් වනුයේ, ඔවුන්ට ගැටුමේ මෙන්ම සාමයේ ද නියෝජිතයන් වීමට හැකි බව පර්යේෂණ සොයාගැනීම්වලින් පෙන්වා දෙන බැවිනි.

අවසාන වශයෙන්, ඉහත විස්තර කර ඇති විවිධ ආකාරවල අන්තර්-ආගමික ගැටුම් එක් ජනවාර්ගික-ආගමික ප්‍රජාවක අවකාශය, අනන්‍යතාවය සහ බලය තවෙකක් විසින් අත්පත්

කර ගැනීම හේතුවෙන් පැන නගින බව කිව හැක. ජාතිවාදය සහ බහුජාතිවාදය විසින් පාලනය කරනු ලබන ප්‍රාදේශීය ව්‍යූහයන්ගේ ක්‍රියාවන් සහ නොකර හැරීම්වලට අදාළ ජාතික මට්ටමේ සහ ප්‍රාදේශීය මට්ටමේ හැකිකරවන තත්වයන් මගින් මෙය පහසුකරණය කෙරෙන අතර, දේශපාලනය මෙහෙයවන්නන්ගේ පුද්ගලික න්‍යායපත්‍රයන් විසින් ඒවා අයුතු වාසි සඳහා යොදවා ගැනේ. මෙම අධ්‍යයනයේ සොයාගැනීම් පෙන්වා දෙන්නේ ආගමික අනෙකාගේ සෘණාත්මක සංජානනයන් පවතින අතරවාරයේ, දිස්ත්‍රික්කයේ වාර්ගික-ආගමික බහුතරය විසින් භුක්ති විඳින දණ්ඩමුක්තිය හේතුවෙන් ප්‍රාථමික වශයෙන් ප්‍රචණ්ඩත්වය ලෙසට විද්‍යමාන වේ. රජයේ නිලධාරීන් සහ ආගමික නායකයන්ගේ තනි පුද්ගල ක්‍රියාවන්, ව්‍යාපාරික පසමිතුරුතාවය, පන්තිය හා කුලය පිළිබඳ සමාජ විෂමතාවයන්, දූප්පත්කම, ඉඩම සහ සමාජ මාධ්‍ය අපහරණය ගැටුමට මග පාදන්නා වූ ආගමික අනෙකුන් පිළිබඳ දූර්මත නිර්මාණය වීම පහසුකරණය කරනු ලබන කේන්ද්‍රීය සාධක වේ. ඒ අනුව රාජ්‍ය පාලන ව්‍යූහයන්ගේ ප්‍රතිසංස්කරණ සහ නීත්‍යානුකූල ලෙස යුක්තිය පරිපාලනය කිරීම අන්තර්-ආගමික ගැටුම් සහ ප්‍රචණ්ඩත්වයට එරෙහිව කටයුතු කිරීමට පරමාදර්ශය වනු ඇත. කෙසේ වෙතත්, ආයතනයික ප්‍රතිසංස්කරණ, කුසලතා දියුණු කිරීම සඳහා දේශපාලන කැමැත්තෙහි ප්‍රකට අඩුවක් දිස්වන හෙයින්, ප්‍රාදේශීය සිවිල් සමාජ සංවිධාන, ආගමික නායකයන් හා අන්තර්-ආගමික කමිටු අතර අන්තර්ග්‍රහණයක් සිදු කර ගැනීම, මේ දිස්ත්‍රික්ක හතරෙහි අන්තර්-ආගමික ආතතිය සහ ගැටුම සම්බන්ධ ප්‍රශ්න ආමන්ත්‍රණය කිරීම සඳහා ප්‍රමාණවත් විසඳුමක් නොවුණද එය ඒ සඳහා විකල්ප විසඳුමක් වනු ඇත.

# පරිශීලන

Appadurai, A. 1998. “Dead Certainty: Ethnic Violence and the Era of Globalization.” Nethra, Vol. 2(2). Colombo: ICES.

---. (2006). Fear of Small Numbers: An Essay on the Geography of Anger. London: Duke University Press.

Centre for Policy Alternatives. 2013. “Report: Attacks on Places of Religious Worship in Post-War Sri Lanka.” Colombo: CPA.

Chatterjee, P. 1991. Whose Imagined Commmunity? The Nation and Its Fragments: Colonial and Postcolonial Histories. New Jersey: Princeton University Press.

Czada et al. 2012. Religions and World Peace: Religious Capacities for Conflict Resolution and Peacebuilding. Baden-Baden: Nomos.

De Votta, N. 2004. Blowback: Linguistic Nationalism, Institutional Decay and Ethnic Conflict in Sri Lanka. California: Stanford University Press.

---. 2018. “Religious Intolerance in Post-Civil War Sri Lanka.” Asian Affairs. DOI: 10.1080/03068374.2018.1467660. p. 1-22.

Dewasiri, N. R. 2016. New Buddhist Extremism and the Challenges to Ethno-Religious Coexistence in Sri Lanka. Colombo: ICES.

Dikeç, M. 2012. “Space as a mode of political thinking.” Geoforum, 43. 669-676.

Gunatilleke, G. 2018. The Chronic and the Entrenched: Ethno-Religious Violence in Sri Lanka. Colombo: ICES.

---. 2015. The Chronic and the Acute: Post-War Religious Violence in Sri Lanka. Colombo: ICES.

Hasbullah, S. 2001. Muslim Refugees: Forgotten People in Sri Lanka’s Ethnic Conflict. Nuraicholai: Research and Action Forum for Social Development.

Hasbullah, S. and Benedikt Korf. 2012. “Muslim geographies, violence and the antimonies of community in eastern Sri Lanka.” The Geographical Journal, doi: 10.1111/j.14754959.2012.00470.x. 1-12

Herath, D. and Harshana Rambukwella. 2015. Self, Religion, Identity and Politics: Buddhist and Muslim Encounters in Contemporary Sri Lanka. Colombo: ICES.

Holt, J.C. 2015. “Militant Buddhists and Minority Others: Ethnic Conflict in Theravada Buddhist South and Southeast Asia.” In Ethnic Conflict in Buddhist Societies in South and Southeast Asia: The Politics Behind Religious Rivalries, Ed. K.M. de Silva. 1-24. Kandy: ICES.

Johnson, D. 2012. “Sri Lanka – a divided Church in a divided polity: the brokerage of a struggling institution.” Contemporary South Asia, Vol. 20(1). 77-90.

Knott, K. 2010. “Religion, Space and Place: The Spatial Turn in Research on Religion.” Religion in Society: Advances in Research, Vol. 1. 29-43.

Mayer, W. 2013. “Religious conflict: definitions, problems and theoretical approaches.” In Religious Conflict from Early Christianity to the Rise of Islam. 1–19. Berlin: De Gruyter.

McGilvray, D. 2003. “Tamil and Muslim Identities in the East.” Marga Vol. 1(1). 79-116.

Nagaraj, V and Farzana Haniffa. 2017. Towards Recovering Histories of Anti-Muslim Violence in the Context of Sinhala – Muslim Tensions in Sri Lanka. Colombo: ICES.

Nesiah, D. 2011. “The Quest for Redemption: The Story of the Northern Muslims: Final Report of the Citizens Commission on the Expulsion of Muslims from the Northern Province by the LTTE in October 1990.” Colombo: Law and Society Trust.

Obeysekera, G. 2004. Buddhism, Nationhood and Cultural Identity: The Premodern and Pre-colonial Formations. Colombo: ICES.

Pinto, L. 2015. Being a Christian in Sri Lanka: Historical, Political, Social and Religious Considerations. Bloomington: Balboa Press.

Shepardson, C. 2014. Controlling Contested Places: Late Antique Antioch and the Spatial Politics of Religious Controversy. University of California Press; London.

Silva, K.T. et al. 2016. Religious Interface and Contestations between Buddhists and Muslims in Sri Lanka. ICES; Colombo

Spencer et.al. 2015. Checkpoint, Temple, Church and Mosque: A Collaborative Ethnography of War and Peace. Colombo: SSA.

Spencer, J. (2012). “Performing democracy and violence, agonism and community, politics and not politics in Sri Lanka.” Geoforum, 43. 725-731.

Stark, R and Roger Finke. 2000. Acts of Faith: Explaining the Human Side of Relgion. Berkeley: University of California Press.

The Hindu. 6th December, 2002. “Temple for Kethu dedicated to Siva at Mannar.” Online edition.https://www.thehindu.com/thehindu/fr/2002/12/06/stories/2002120601140600.htm

Tilakaratne, A, 2015. “Buddhism and Ethnicity-related Tensions in Sri Lanka: Doctrinal Position and Role of Buddhism.” In Ethnic Conflict in Buddhist Societies in South and Southeast Asia: The Politics Behind Religious Rivalries, Ed. K.M. de Silva. 109-121. Kandy: ICES.

Wickramasinghe, R. 2016. Confronting Intolerance: Continued violence against religious minorities in Sri Lanka. Sweden: Minority Rights Group International.

# උපග්‍රන්ථය - පර්යේෂණ නියැදිය

| ක්‍රමවේදය | මන්නාරම | යාපනය | අම්පාර | මාතර |
|---|---|---|---|---|
| ප්‍රධාන තොරතුරු ලබාදෙන්නන්ගේ සම්මුඛ සාකච්ඡා | 1. මන්නාරම අන්තර්-ආගමික සංසදයේ නියෝජිත (හින්දු, පුරුෂ)<br><br>2. ප්‍රජා මූල සංවිධානයේ ප්‍රධාන නිලධාරී<br><br>3. දේවස්ථාන තුනක නියෝජිතයෝ (එක් කාන්තාවක්, පුරුෂයන් දෙදෙනෙක්)<br><br>4. හින්දු කෝවිල් කොන්සෝටියමේ හිටපු සභාපති (හින්දු, පුරුෂ)<br><br>5. ක්‍රිස්තියානි පාදිලිවරයෙක් (පුරුෂ)<br><br>6. ග්‍රාම නිලධාරී (කතෝලික පුරුෂ)<br><br>7. මන්නාරම අන්තර්-ආගම් සංසදයේ නියෝජිත (කතෝලික පුරුෂ)<br><br>8. බෞද්ධ පන්සල් දෙකක ප්‍රධාන හිමිවරු (පුරුෂ)<br><br>9. බෞද්ධ පන්සලක සිවිල් ආරක්ෂක නිලධාරියෙක් (බෞද්ධ පුරුෂ) | 1. බෞද්ධ හිමිනම (පුරුෂ)<br><br>2. මව්ලවි (පුරුෂ)<br><br>3. නිදහස් මාධ්‍යවේදියෙක් සහ කතෝලික සභාවේ සාමාජිකයෙක් (පුරුෂ)<br><br>4. කාන්තාවන්ගේ ග්‍රාමීය සංවර්ධන සභාවේ හිටපු සභාපතිනී (හින්දු, ස්ත්‍රී)<br><br>5. දේශපාලක (හින්දු)<br><br>6. කිලිනොච්චියේ ජාතික ඒකාබද්ධ හා සංහිඳියා අමාත්‍යංශයේ නිලධාරියෙක් (බෞද්ධ) | 1. මෙතෝදිස්ත පූජකවරුන්/වරියන් (පුරුෂ 1, කාන්තා1)<br><br>2. කතෝලික කන්‍යා සොයුරියක්<br><br>3. නීතිඥවරයෙක් (මුස්ලිම්, පුරුෂ)<br><br>4. භික්ෂුව | 1. බෞද්ධ හිමිනම<br><br>2. රෝ.ක. නොවන පූජක<br><br>3. මව්ලවි |

| | | | | |
|---|---|---|---|---|
| කේන්ද්‍රීය කණ්ඩායම් සාකච්ඡා | 1. කාන්තාවන්ගේ ග්‍රාමීය සංවර්ධන සමාජය (හින්දු ස්ත්‍රී 3)<br><br>2. කාන්තාවන්ගේ ග්‍රාමීය සංවර්ධන සමාජය (මුස්ලිම් ස්ත්‍රී 5)<br><br>3. කාන්තාවන්ගේ ග්‍රාමීය සංවර්ධන සමාජය තෝලික ස්ත්‍රී 8)<br><br>4. මුස්ලිම් නීතිඥ සහ ගිහි (පුරුෂ 3) | 1. කාන්තාවන්ගේ ග්‍රාමීය සංවර්ධන සමාජය (හින්දු ස්ත්‍රී 5)<br><br>2. කාන්තාවන්ගේ ග්‍රාමීය සංවර්ධන සමාජය (හින්දු ස්ත්‍රී 4) | 1. කාන්තා සමිති (ප්‍රජා මූල, හින්දු ස්ත්‍රී 17)<br><br>2. විශ්‍රාමලත් රජයේ සේවකයන්, හින්දු සමාජවල හිටපු නිලධාරීන්, ග්‍රාම නිලධාරීන් (පුරුෂ 9 කතෝලික ස්ත්‍රී 1)<br><br>3. කාන්තාවන්ගේ ග්‍රාමීය සංවර්ධන සමාජ සහ රජයේ සේවය (මුස්ලිම් ස්ත්‍රීන් 12)<br><br>4. රජයේ සේවකයන්, සිවිල් සමාජ සාමාජිකයන් සහ ආගමික නායකයන් (මුස්ලිම් පුරුෂ 16)<br><br>5. බෞද්ධ පුරුෂ (8) සහ ගම්මාන සංවර්ධන සංසදය (දීඝවාපි) ස්ත්‍රී (12) | 1. ඉස්ලාමීය සමාජයක සාමාජිකයන් (මාතර ස්ත්‍රී 7)<br><br>2. ප්‍රජා සංසද සහ ප්‍රජා මූල සංවිධාන සාමාජිකාවන් වන බෞද්ධ කාන්තාවන්, ගුරුවරියන් සහ ව්‍යාපාරික කතුන් (මාතර නගරයේ ස්ත්‍රී 8)<br><br>3. ඉස්ලාමීය ආයතනයක සාමාජිකයන් සහ පොදු ජනතාව (ස්ත්‍රී 3- වැලිගම පුරුෂ 5)<br><br>4. උපාධි අපේක්ෂකයන්, ව්‍යාපාරිකයන්, ව්‍යාපාරික කතුන්, ගුරුවරුන්, අන්තර්- ආගමික කමිටුවේ ප්‍රජා මූල නියෝජිතයන් සහ එක් විශ්‍රාමලත් හමුදා නිලධාරියෙක් (වැලිගම) ඇතුළු බෞද්ධ පිරිමි (11) සහ ස්ත්‍රී (9)<br><br>5. හින්දු, මුස්ලිම් සහ ක්‍රිස්තියානි පුරුෂ (7) සහ දෙණියාය අන්තර්- ආගම් කමිටුවේ සාමාජිකාවන් (4)<br><br>6. බෞද්ධ පිරිමි (8) සහ දෙණියාය අන්තර්- ආගම් කමිටුවේ සාමාජික ස්ත්‍රීන් (2) |

# ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක හතරක් තුළ අන්තර් ආගමික ගැටුම්

ශ්‍රී ලංකාවේ මන්නාරම, යාපනය, අම්පාර සහ මාතර යන දිස්ත්‍රික්ක හතරෙහි ස්ත්‍රීන් සහ පුරුෂයන් සමග පැවැත්වූ ගුණාත්මක සම්මුඛ සාකච්ඡා සහ කේන්ද්‍රීය කණ්ඩායම් සාකච්ඡා තුළින් මෙම වාර්තාව සැකසෙන අතර ගැටුම අවුළුවාලීම කාරක සහ හැකිකරවන තත්වයන් ද ඇතුළත්ව ක්‍රිස්තියානින්, මුස්ලිම්වරුන්, හින්දූන් සහ බෞද්ධයන් එකිනෙකා අතර පවතින අන්තර්ජේදිත ස්වාමිත්වයන් එමගින් විදහා දක්වයි. එමගින් අන්තර්-ආගමික ගැටුම විශ්ලේෂණය සඳහා ප්‍රාදේශීයකරණය වූ හා සන්දර්භ-සුවිශේෂී වූ කාච ඇසක් මෙන්ම ස්ත්‍රී සහභාගිත්වයේ භූමිකාව වෙත සංකේන්ද්‍රණය වූ ගැටුම් නිරාකරණක්‍රමෝපායයන් ද යෝජනා කරයි.

අන්තර්-ආගමික ගැටුම සඳහා වූ යටිබිම්ගත හේතූන් සමාන ලෙස පවතින අතරවාරයේම, වෙනස් දිස්ත්‍රික්ක හතරක් තුළ එම ගැටුම විදහා දැක්වෙන්නේ කෙසේදැයි මෙම අධ්‍යයනයේදී සාකච්ඡා කරයි. ආයතනගත ජනවාර්ගික-ආගමික බහුතරකරණය, ආගමික අන්තවාදය, ප්‍රාදේශීය ජනවාර්ගික-ආගමික ජාතිවාදයන්, ව්‍යාපාරික පසමිතුරුතාවය, කුලය හා දුප්පත්කම වැනි සංස්කෘතික අංග යනාදී ජාතිකමය සහ ප්‍රාදේශීය වශයෙන් පවතින හැකිකරවන සාධක විසින් පහසුකරණය කිරීම තුළ එක් ජනවාර්ගික-ආගමික ප්‍රජාවක් විසින් අනෙක් ප්‍රජාවේ අවකාශය, අනන්‍යතාවය සහ බලය අල්ලා ගැනීමේ විවිධ ආකාර තුළින් ගැටුම් පැන නගින බවට මෙම අධ්‍යයනය විසින් තර්ක කර සිටියි. මෙකී ගතිකයන් විසින් ගැටුම් ලිහිල්කරණය වෙත ප්‍රජාවන්ගේ ප්‍රවේශයන් වෙනස් ආකාරවලින් හැඩගැන්වීම ද සිදුකරයි. ආගමික අනෙකාට එරෙහි මෙකී දුර්මත සහ අගතීන් පවතින අතරම, එක් එක් දිස්ත්‍රික්කයක ජනවාර්ගික-ආගමික බහුතරය වෙත පිරිනමා ඇති/ ඔවුන් විසින් භුක්ති විඳින දණ්ඩ මුක්තිය හේතුවෙන් මෙකී හැඩගැන්වීම මූලික වශයෙන් ප්‍රචණ්ඩත්වය වශයෙන් ප්‍රත්‍යක්ෂවන බවට මෙම අධ්‍යයනය විසින් නිගමනය කරයි.

INTERNATIONAL
CENTRE FOR
ETHNIC STUDIES

equitas
educate. empower. change.

ISBN 978-955-580-232-1

9 789555 802321

මුද්‍රණය : හොරයිසන් ප්‍රින්ටින් (පුද්) සමාගම